# රණවිරුවා

2024 දෙසැම්බර් • 272 කලාපය



ජව බල පිරුණු විරු කැළ එකතුව රැගෙන
මව ලෙස උපන්බිම දිවි හිමියෙන් රකින
සිය සිය දහස් නිති වෙර වීරිය ලැබෙන
නව ඇරඹුමකි නව වසරේ සුබ ගෙනෙන

- [illegible]



ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 25 වන යුද්ධ හමුදාධිපති ලෙස ලුතිනන් ජෙනරාල් ලසන්ත රොඩ්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී සුබ මොහොතින් සිය ධූරයේ රාජකාරි අරඹමින්

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.



# අභිමන් සෙවණේ

# ගෞරවණීය මෙහෙවරක නව ඇරඹුමක්

ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී ඉකුත් දෙසැම්බර් මස 31 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ පැවති හමුදා සම්ප්‍රදායානුකූල උත්සවයකදී 25 වන යුද්ධ හමුදාධිපති ලෙස නව ධූරයේ රාජකාරි  භාරගනු ලැබීය.

විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එන්එච් බණ්ඩාරනායක යූඑස්පී විසින් නව යුද්ධ හමුදාධිපතිතුමන්ව උණුසුම් අයුරින් පිළිගැනීමෙන් අනතුරුව හටපිරිස් වෙතින් එතුමන් වෙත සම්මාන මුරයේ ගෞරවාචාර පුදකළහ. අනතුරුව ගංගාරාම විහාරස්ථානයේ විහාරාධිපති ආචාර්ය කිරින්දේ අස්සජි නායක හිමිපාණන් ඇතුළු මහා සංඝරත්නයේ සෙත් පිරිත් සජ්ඣායනා මධ්‍යයේ නව යුද්ධ හමුදාධිපති තුමන් රාජකාරි භාරගැනීම සනිටුහන් කරමින් සංකේතාත්මකව නිල ලේඛනයකට අත්සන් තැබීය. එහිදී, සර්ව ආගමික පූජකවරුන්ගේ ආශිර්වාදය ද එතුමන් වෙත හිමිවූහ. එම අවස්ථාව සඳහා එතුමන්ගේ භාර්යාව වන ස්වෙන්ද්‍රනි රොද්‍රිගෝ මහත්මිය ඇතුළු පවුලේ සාමාජිකයින් ද එක්ව සිටියහ.

උත්සවයේ සමාප්තිය සනිටුහන් කරමින් යුද්ධ හමුදා මූලස්ථාන බහුකාර්ය ශාලාවේදී තේ පැන් සංග්‍රහයක් ද පැවැත්විණ. අනතුරුව එතුමන් හටපිරිස් ආමන්ත්‍රණය කරමින් අනාගත හමුදාවේ ප්‍රගමනය උදෙසා වන එතුමන් ගේ දැක්ම පැහැදිලි කළේය.













වර්ෂ 1989 ජනවාරි මස 20 දින කෙඩෙට් නිලධාරි පාඨමාලා අංක - 31 (ඉන්දියාව) යටතේ කෙඩෙට් නිලධාරියකු ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය හමුදාව වෙත බැඳුනු ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී දියතලාව, ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය සහ ඉන්දියානු යුද්ධ හමුදා විද්‍යාපීඨය තුළින් මූලික කෙඩෙට් පුහුණුව සාර්ථකව අවසන් කිරීමෙන් අනතුරුව දෙවන ලුතිනන් නිලයේ අධිකාරියට පත්ව ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව වෙත අනුයුක්ත කරනු ලැබීය.

තරුණ නිලධාරියකු ලෙස දෙස් විදෙස් පාඨමාලා රැසක් ද හදාරා ඇති එතුමන් ඇමරිකා එක්සත් ජනපදයේ, වොෂින්ටන් ඩීසී ප්‍රදේශයේ පිහිටි ජාතික ආරක්‍ෂක විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික ආරක්‍ෂක අධ්‍යයනය පිළිබඳ (Master of Arts in Strategic Security Studies (2019-2020) සහ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්‍ෂක විශ්වවිද්‍යාලයේ ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයනය පිළිබඳ (Master of Science in Security and Strategic Studies) උපාධින් ද ලබාගෙන ඇත. මීට අමතරව, ඇමරිකා එක්සත් ජනපදයේ, වොෂින්ටන් ඩීසී ජාතික ආරක්‍ෂක විශ්වවිද්‍යාලය තුළින් එක්සත් ජනපද ඒකාබද්ධ වෘත්තීය හමුදා අධ්‍යයන අදියර II සහ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අධ්‍යයන ඩිප්ලෝමාව, ඉන්දියාවේ කාලතුවක්කු පුහුණු පාසලේ දීර්ඝ කාලතුවක්කු මාණ්ඩලික පාඨමාලාව, ශ්‍රී ලංකා යුද්ධ හමුදා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ (වත්මන් ආරක්‍ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය) උපාධිය සහ ඉන්දියාවේ, ඩෙහ්රාඩුන් ප්‍රදේශයේ පිහිටි ඉන්දියානු යුද්ධ හමුදා විද්‍යාපීඨයේ උපාධිය ඇතුළු උසස් අධ්‍යාපනික සුදුසුකම් ද එතුමන් සපුරා ඇත.



ඇමරිකා එක්සත් ජනපදයේ, වොෂින්ටන් ඩීසී ප්‍රදේශයේ පිහිටි ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පැවති ජාත්‍යන්තර ත්‍රස්ත මර්ධන වැඩසටහනේ ජාත්‍යන්තර ශිෂ්‍ය කමිටුවේ සභාපති ධූරය හෙබවූ එතුමන් 2020 වර්ෂයේදී එම වැඩසටහනේ හොඳම විදේශීය ශිෂ්‍යයාට හිමි සම්මානය දිනාගනිමින් සිය වෘත්තීය දිවිය තුළදී ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් සනිටුහන් කළේය.

වසර 36 ක කීර්තිමත් යුද්ධ හමුදා දිවිය තුළදී එතුමන් අණ, මාණ්ඩලික සහ උපදේශක ධූරයන් රැසක් හොබවා ඇති අතර, විශේෂයෙන්ම තොප්පිගල හා මන්නාරම ප්‍රදේශයන්හි මානුෂීය මෙහෙයුම පැවති කාලසීමාවේ 18 (ආධාරක) ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ අණදෙන නිලධාරී වශයෙන් ද කටයුතු කර ඇත. තවද, පූනරීන් ප්‍රදේශයේ ස්ථාපිත 663 සහ 661 වන පාබල බලසේනාවන්හි බලසේනාධිපති ලෙස ද කටයුතු කරමින් එතුමන් 2018 සහ 2019 වර්ෂයන්හිදී ජාතිය ගොඩනැගීම, ප්‍රතිසංස්කරණය සහ සංහිඳියාව වෙනුවෙන් ද සිය දායකත්වය ලබාදෙනු ලැබීය. එමෙන්ම, යුද්ධ හමුදා මූලස්ථානයේ විදේශ මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අධ්‍යක්‍ෂ වශයෙන් කටයුතු කළ එතුමන් පසුව පූනරීන් ප්‍රදේශයේ ස්ථාපිත 66 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ධූරය ද හෙබවූයේය.

ආරක්‍ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායක, ආරක්‍ෂක සේනා ආඥාපති - මධ්‍යම, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ කර්නල් සේනාවිධායක, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක හා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන වැනි ප්‍රධාන ධූරයන් රැසක් ද එතුමන් හෙබවීය. උතුරු නැගෙනහිර ක්‍රියාන්විත සේවාවන්හි නියැලෙමින් රණකාමී අත්දැකීම් බහුල අයකු වූ හෙතෙම රණශූර පදක්කම ඇතුළු පදක්කම් රැසකින් ද පිදුම් ලබා ඇත.



දියතලාව, ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයෙහි කෙඩෙට් නිලධාරීන්ගේ විසිරයාම ඉකුත් දෙසැම්බර් මස 21 වන දින අභිමානවත් අයුරින් පැවති අතර, එම උත්සව අවස්ථාවට යුද්ධ හමුදාධිපතිගේ ආරාධනයෙන් ප්‍රධාන අමුත්තා ලෙස නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍ය මේජර් ජෙනරාල් කේපීජ් ජයසේකර (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගී විය. එහිදී, පුහුණුව සාර්ථකව අවසන් කළ කෙඩෙට් නිලධාරීහු 222 දෙනකු අධිකාරියට පත්ව තම මාතෘභූමිය සුරැකීමේ උදාර අරමුණින් යුතුව විසිර ගියහ.

අධිකාරියට පත් නව නිලධාරීන් වෙත ජනාධිපති අධිකාරියෙහි අසිපත් ප්‍රදානය කිරීම ප්‍රධාන ආරාධිත අමුත්තා හා එක්ව ආරක්ෂක ලේකම් එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී (තෙවරක්), ආර්එස්පී (දෙවරක්), යූඑස්පී, එම්එම්එස්සී (උපායමාර්ගික අධ්‍යයනය - චීනය), එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ, එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයනය), එස්එන්ඩීයූ (චීනය), පීඑස්සී සහ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ විසින් සිදුකළහ.

# ඓතිහාසික සෙවණක දී අභිමානවත් විසිරයාමක්





අධිකාරියට පත් නිලධාරීන් අතරට කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක 93 බී, කෙටි කාලීන නිත්‍ය කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක 21 සහ 22 හැදෑරූ කෙඩෙට් නිලධාරීන් හා විදෙස් රටවල් නියෝජනය කරමින් උගන්ඩාව, කෙන්යාව, ගැම්බියාව සහ සැම්බියාව යන රටවල විදේශීය හමුදා කෙඩෙට් නිලධාරීන් දසදෙනෙක් වූහ. මෙම විසිර යාමේ පෙළපාලියේ අණදෙන නිලධාරී ලෙස මේජර් යූබී මාරසිංහ යූඑස්පී පීඑස්සී කටයුතු කළේය.

යුද්ධ හමුදා විද්‍යාපීඨයේ සේනාවිධායක මේජර් ජෙනරාල් යූඑල්ජේඑස් පෙරේරා ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ ආරාධනයෙන් ප්‍රධාන ආරාධිත අමුත්තා විසින් එක් එක් පාඨමාලාවන්හි විශිෂ්ට දක්ෂතා දැක්වූ කෙඩෙට් නිලධාරීන් වෙත විශේෂ සම්මාන ප්‍රදානය කරන ලදි. එහිදී නිත්‍ය කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක 93 බී හි දක්ෂතම කෙඩෙට් නිලධාරී ලෙස සම්මාන හිමිකරගත්තේ බලඇණි මෙහෙයුම් නිලධාරී ඩීආර්කේ ජයකොඩි විසිනි. තවද, කෙටි කාලීන නිත්‍ය කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක 21 හි දක්ෂතම කෙඩෙට් නිලධාරියාට හිමි සම්මානය - කෙඩෙට් නිලධාරී ජීඒපී හේරත් විසින් ද කෙටි කාලීන නිත්‍ය කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක 22 හි දක්ෂතම කෙඩෙට් නිලධාරියාට හිමි සම්මානය - බණ්ඩ මෙහෙයුම් නිලධාරී කේඑම්එස් හේරත් විසින් ද හිමිකරගත්හ.







# නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍යතුමන් යුද්ධ හමුදා මූලස්ථානයේ සංචාරයක



ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය මේජර් ජෙනරාල් අරුණ ජයසේකර (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් දෙසැම්බර් මස 16 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ නිල සංචාරයක නිරත විය. යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ යුද්ධ හමුදා විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් කේජ්ඩබ්ලිව්එන්එච් බණ්ඩාරනායක යූඑස්පී ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ එහි සපැමිණි නියෝජ්‍ය ඇමතිතුමන් වෙත ගැමුණු හේවා බලකායේ හටපිරිස් වෙතින් හිමිවූයේ ඉහළම ගෞරවාචාරයකි.

එහිදී, යුද්ධ හමුදාධිපතිගේ කාර්යාලයේ දී නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍යතුමන් සහ යුද්ධ හමුදාධිපති අතර සුහද හමුවක් ද පැවැත්වුණු අතර, පසුව, මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජ්ඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ විසින් සම්මන්ත්‍රණ ශාලාවේ දී යුද්ධ හමුදාවේ වත්මන් කාර්යභාරය සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ එතුමන් දැනුවත් කිරීමක් ද සිදුකරන ලදි. අනතුරුව, නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍යතුමන් විසින් නූතන තර්ජනවලට මුහුණදීමට යුද්ධ හමුදාව සතු සම්පත් නිසි අයුරින් භාවිතා කිරීම සහ යුද්ධ හමුදාවේ ගරුත්වය රැකගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව ද අවධාරණය කළේය.



යුද්ධ හමුදා මූලස්ථානයේ සේවයේ නියුතු හටපිරිස් ප්‍රථම වරට ආමන්ත්‍රණය කළ එතුමන් ජාතියේ ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීම සඳහා යුද්ධ හමුදාවේ නොසැලෙන කැපවීම ඇගයීමට ලක්කළේය. එසේම, අභියෝගවලට මුහුණදීමේ දී මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ විනය ආරක්ෂා කිරීමට සියලු නිලයන් කැපවී කටයුතු කළයුතු බවත්, මවුබිමේ සාමය සහ ස්ථාවරත්වය පවත්වාගැනීම සඳහා යුද්ධ හමුදාවේ තීරණාත්මක කාර්යභාරය පිළිබඳවත් වැඩිදුරටත් සිය අදහස් දැක්විය.







# ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ පාඨමාලා හැදෑරූ නිලධාරීහු විසිරයති





ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ පාඨමාලා අංක - 18 හි උපාධි ප්‍රදානෝත්සවය පසුගිය දෙසැම්බර් මස 12 දින නෙළුම් පොකුණ රඟහලේදී පැවැත්විණ. එම විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී පීඑස්සී ගේ ඇරයුමෙන් ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය මේජර් ජෙනරාල් කේපී අරුණ ජයසේකර (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවති එම අවස්ථාවට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ද සහභාගී විය.

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයීය පාඨමාලා අංක - 18 සඳහා විදේශීය නිලධාරීන් 25 දෙනෙක්, යුද්ධ හමුදා නිලධාරීන් 78 දෙනෙක්, නාවික හමුදා නිලධාරීන් 21 දෙනෙක් සහ ගුවන් හමුදා නිලධාරීන් 26 දෙනෙක් ඇතුළුව උපාධි අපේක්ෂක නිලධාරීන් 150 දෙනෙක් සහභාගි වූහ. කීර්තිමත් විද්වතුන් සහ ආරාධිතයන් පිරිසකගේ සහභාගිත්වයෙන් පැවැති මෙම පාඨමාලාවේ අවසන් දින උත්සවයේ දී එම උපාධිධාරී නිලධාරීන් වෙත "පීඑස්සී" උපාධිය පිරිනැමීම සිදුවිය. මෙම උපාධි ප්‍රදානෝත්සවයට රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල ප්‍රධානීන් සහ අනෙකුත් රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයින්, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයීය කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින්, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ ආදි විද්‍යාර්ථයින්, ත්‍රිවිධ හමුදා නිලධාරීන්, උපාධිදාරී නිලධාරීන්ගේ භාර්යාවන්, දෙමාපියන් සහ ළඟම ඥාතීන් ද සහභාගී වූහ.





# සතුරු බල බිඳ ඉතිරි කොට රට නික්ම යන විරු සෙන්පති

## ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන වෙත මව් රෙජිමේන්තුවේ හරසර







ධුරයෙන් නික්ම යන ගජබා රෙජිමේන්තුවේ කීර්තිමත් සාමාජිකයකු වන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් වෙත එම රෙජිමේන්තුවේ හටපිරිස් විසින් ගෞරවාචාර පුදකිරීමේ උත්සවයක් ඉකුත් දෙසැම්බර් මස 29 වන දින සාලියපුර පිහිටි ගජබා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී පැවැත්විණ.

එම උත්සවයේ ආරම්භය සනිටුහන් කරමින් එතුමන් වෙත හටපිරිස් විසින් හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු මුරයේ ගෞරවාචාරය පුදකරනු ලැබීය. එහිදී, රෙජිමේන්තු රණවිරු ස්මාරකය අභියස දී දිවංගත රණවිරුවන් වෙත පුෂ්පෝපහාර පුදකළ ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධාන, ගජබා රෙජිමේන්තුවේ නිර්මාතෘ වන දිවංගත මේජර් ජෙනරාල් විජය විමලරත්න සෙන්පතියා වෙත සිය ගෞරවාචාරය පුදකිරීමට ද කටයුතු කළේය. අනතුරුව රෙජිමේන්තුවේ අභිමානය විදහා දක්වමින් හමුදා සම්ප්‍රදායානුකූල සම්මාන පෙළපාළියේ ගෞරවාචාරය ද එතුමන් වෙත පිළිගැන්විණ.

එදින සන්ධ්‍යාවේදී, ගජබා රෙජිමේන්තු නිලධාරි නිවස්නයේ දී ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධාන වෙත සමුගැනීමේ රාත්‍රී භෝජන සංග්‍රහයක් ද පැවැත්විණි. ගෞරවාන්විත දීර්ඝ මෙහෙවරක නිරත ගජබා රෙජිමේන්තුවේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියා වූ එතුමන් එදා මෙදාතුර යුද්ධ හමුදාවටත්, රටටත් සිදුකළ අසමසම මෙහෙවරට "රණවිරුවා" ද මෙලෙස සුබපැතුම් එක්කරයි.





# නික්ම ගිය ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන වෙත යුද හමුදාවේ බුහුමන්

ධුරයෙන් නික්ම ගිය ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් වෙත හමුදා සම්ප්‍රදායානුකූලව ගෞරවාචාර පුදකිරීමේ උත්සවයක් ඉකුත් දෙසැම්බර් මස 31 දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී පැවැත්විණ. යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොඩ්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩියූ පීඑස්සී අයිජී විසින් එම පරිශ්‍රය වෙත සපැමිණි ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන උණුසුම් අයුරින් පිළිගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ භටපිරිස් විසින් එතුමන් වෙත හමුදා සම්ප්‍රදායානුකූල සම්මාන මුරයේ ගෞරවාචාරය පුදකරනු ලැබූහ. පසුව, සමූහ ඡායාරූප කිහිපයකට ද පෙනීසිටි එතුමන් භටපිරිස් ආමන්ත්‍රණය කරමින් සියලු යුද්ධ හමුදා සාමාජිකයන් වෙත සිය කෘතඥතාවය සහ සුබපැතුම් පළකළේය. ඉන් අනතුරුව, අන්‍යෝන්‍යය ගෞරවය සහ මිත්‍රත්වය සංකේතවත් කරමින් යුද්ධ හමුදාධිපති සහ ධුරයෙන් නික්ම යන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන අතර සමරු තිළිණ හුවමාරුවක් ද සිදුකෙරිණි.


## ධුරයෙන් නික්ම යන යුද්ධ හමුදාධිපති වෙත ගෞරවාචාර

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 24 වන යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ නික්මයාම සනිටුහන් කරමින් ඉකුත් දෙසැම්බර් මස 30 වන දින පනාගොඩ, ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මූලස්ථානයේ දී සමුගැනීමේ උත්සවයක් පැවැත්විණි. එහිදී, ශ්‍රී ලංකා පාබල හමුදාවේ භටපිරිස් විසින් එතුමන් වෙත හමුදා සම්ප්‍රදායානුකූල ගෞරව බුහුමන් පිදූහ.



ඉන් අනතුරුව, පැවති සියලු නිල තේ පැන් සංග්‍රහයකට ද එක්වූ යුද්ධ හමුදාධිපති නිලධාරීන් සහ සෙසුනිලයන් සමඟ සුහද පිළිසඳරක ද නිරතව යුද්ධ හමුදා මූලස්ථානයේ දී ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන් සහ ක්ෂේත්‍ර අණදෙන්නන් ආමන්ත්‍රණය කරමින් සිය සේවා කාලය තුළ ලබාදුන් සහයෝගය වෙනුවෙන් සිය කෘතඥතාව පුදකළේය.

යුද්ධ හමුදාධිපති කාර්යාලයේ දී එතුමන්ගේ සුරතින් නව යුද්ධ හමුදාධිපති මේජර් ජෙනරාල් ලසන්ත රොඩ්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩියූ පීඑස්සී අයිජී වෙත ධුරයේ වගකීම් භාරදීම ද එහිදී සිදුවිය. ඉන් අනතුරුව, ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන් සමඟින් සමූහ ඡායාරූපයකට එක්වූ ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සිය ඡායාරූපයක් යුද්ධ හමුදාධිපති කාර්යාලයේ දී නිරාවරණය කිරීම ද සිදුකළේය. උත්සවයේ සමාප්තිය සනිටුහන් කරමින් යුද්ධ හමුදාවේ වෘත්තීයභාවය සහ කීර්තිය ඉහළ නංවමින් වසර දෙකකුත් මාස හතක කාලසීමාවක් පුරාවට දැක්වූ කැපවීම වෙනුවෙන් නික්ම යන යුද්ධ හමුදාධිපතිට එහි සියලු නිලයින් ජය ශ්‍රී නද පතුරවමින් ආශිර්වාද පුදකළහ.





# විශ්‍රාම දිවියට එළඹෙන යුද්ධ හමුදාධිපති වෙත මව් රෙජිමේන්තුවෙන් බුහුමන්





විශ්‍රාම දිවියට එළඹෙන ගජබා රෙජිමේන්තුවේ අභිමානවත් සාමාජිකයකු වන යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ වෙත ගෞරවාචාර පුදකිරීමේ උත්සවයක් ඉකුත් දෙසැම්බර් මස 29 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී පැවැත්විණි. එය එතුමන්ගේ ආදර්ශමත් සේවයට ගෞරව දැක්වීම සහ කෘතඥතාවය පුදකිරීමේ වැදගත් අවස්ථාවක් සනිටුහන් කරනු ලැබිණි.

එහිදී, රෙජිමේන්තු රණවිරු ස්මාරකය අභියස දී දිවංගත රණවිරුවන් වෙනුවෙන් පුෂ්පෝපහාර දැක්වීමටත්, අනතුරුව ගජබා රෙජිමේන්තුවේ නිර්මාතෘ වන දිවංගත මේජර් ජෙනරාල් ඩබ්ලිව්අයිවීකේඑම් විමලරත්න සෙන්පතියාගේ පිළිරුවට පුෂ්පෝපහාර පුදකිරීමටත් එතුමන් අමතක නොකළේය. ඉන්පසු එම රෙජිමේන්තු භටපිරිස් වෙතින් එතුමන් වෙත හිමිවූයේ ගෞරවනීය බුහුමනකි. පසුව, පැවති සියලු නිල තේ පැන් සංග්‍රහය අතරතුරදී, නිලධාරීන් සහ සෙසුනිලයන් සමග සුහද පිළිසඳරක නිරත වෙමින් එතුමන් මතකාවර්ජනයක ද නිරතවූහ. මෙම උත්සවය පැවැත්වීමට පෙර දින සන්ධ්‍යාවේ දී ගජබා රෙජිමේන්තු නිලධාරි නිවස්නයේදී යුද්ධ හමුදාධිපති වෙනුවෙන් සාම්ප්‍රදායික සමුගැනීමේ රාත්‍රී භෝජන සංග්‍රහයක් ද පැවැත්විණ.

## ශ්‍රී ලංකා ජාතික ආරක්ෂ බලමුළුවේ ගෞරවාචාරය

ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ රෙජිමේන්තු අධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ වෙත ගෞරවාචාර පුදකිරීමේ උත්සවයක් 2024 දෙසැම්බර් මස 28 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී පැවැත්විණ.




එහිදී, රෙජිමේන්තු මධ්‍යස්ථානයට සපැමිණි යුද්ධ හමුදාධිපති එහි මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එච්ජ් කීර්තිනාථ ආර්එස්පී කේඑස්පී පීඑස්සී විසින් උණුසුම් අයුරින් පිළිගනු ලැබීමෙන් අනතුරුව, එතුමන් වෙත භටපිරිස් විසින් හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු මුරයේ සහ සම්මාන මුරයේ ගෞරවාචාර පුදකළහ.

ඉන්පසු සියලු නිල තේ පැන් සංග්‍රයකට සහභාගි වූ නික්ම යන රෙජිමේන්තු අධිපති එහිදී නිලධාරීන් සහ සෙසුනිලයන් සමඟින් සුහද පිළිසඳරක ද නිරත වූහ. එහිදී, භටපිරිස් ඇමතූ එතුමන් තමාගේ රෙජිමේන්තු අධිපති ධූර කාලය පුරාවටම ලබා දුන් නොසැලෙන සහයෝගය සහ කැපවීම වෙනුවෙන් ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ සියලු සාමාජිකයින් වෙත සිය කෘතවේදීත්වය පළ කළේය. එසේම, රෙජිමේන්තුවේ සාමූහික ජයග්‍රහණ ඉස්මතු කළ එතුමන් ඉදිරියටත් ඔවුන්ගේ කැපවීම තුළින් විශිෂ්ටත්වයට පැමිණීම සඳහා භටපිරිස් දිරිමත් කරන්නට ද අමතක නොකළේය.



ප්‍රථම ස්ථානය හිමිකරගත් සිතුවම



දෙවන ස්ථානය හිමිකරගත් සිතුවම



තෙවන ස්ථානය හිමිකරගත් සිතුවම

# රණවිරු සිත්තරුවන් යුද්ධ හමුදාධිපතිගේ ඇගයුමට

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 75 වෙනි සංවත්සරය වෙනුවෙන් සංවිධානය කරනු ලැබූ චිත්‍ර තරගයේ ජයග්‍රාහකයින් වෙත මුදල් ත්‍යාග සහ සහතිකපත් ප්‍රදානය කිරීම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු ගේ සුරතින් ඉකුත් දෙසැම්බර් මස 27 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී සිදුකෙරිණ. ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද මෙම තරගාවලියේ අරමුණ වූයේ යුද්ධ හමුදා සාමාජිකයන්ගේ සුවිශේෂී කලාත්මක කුසලතාවයන් සහ ඔවුන්ගේ නිර්මාණශීලීත්වය වැඩිදියුණු කිරීමයි. එම තරගාවලියේ ප්‍රථම ස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායේ ලුතිනන් එස්එම්ජේජ්බී සමරකෝන් ද, දෙවන ස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ බලලත් නිලධාරි II රුවන් කුමාර ආර්එම්එස් විසින් ද, තෙවන ස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ බලලත් නිලධාරි II අබේගුණරත්න ඒඩී විසින් ද දිනාගත්හ. තවද, සෙසු නිර්මාණකරුවන්ගේ කලා කුසලතාවය අගයමින් තෝරාගත් 10 දෙනකු වෙත විශිෂ්ටතා සම්මානත්, තවත් 10 දෙනකු වෙත කුසලතා සම්මානත් ප්‍රදානය කරන ලදි.









# යුද්ධ හමුදා සරඹ සහ පියවර කෝඳු තරඟාවලිය



"යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු සරඹ හා පියවර කෝඳු තරගාවලිය - 2024" හි ජයග්‍රාහී කණ්ඩායම් සඳහා ත්‍යාග ප්‍රදානෝත්සවය පනාගොඩ, ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු සරඹ භූමියේ දී ඉකුත් දෙසැම්බර් මස 18 වන දින පැවැත්විණ. එම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය.

2024 අගෝස්තු මස 26 වන දින සිට සැප්තැම්බර් මස 02 වන දින දක්වා 6 ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා රෙජිමේන්තු සරඹ භූමියේ දී පැවති මෙම තරගාවලිය තුළින් විනය සහ විශිෂ්ටත්වය සඳහා යුද්ධ හමුදාවේ කැපවීම පෙන්නුම් කරයි. යුද්ධ හමුදා විධායක ජෙනරාල් සහ පිරිස් පාලන අධ්‍යක්ෂ ගේ උපදෙස් මත මෙම තරගාවලිය සංවිධානය කෙරිණි. යුද්ධ හමුදාධිපති ගේ සුරතින් ජයග්‍රාහකයින් වෙත කුසලාන, ත්‍යාග පිරිනැමුණු මොහොතේ යුද්ධ හමුදා ඉතිහාසයේ පළමු වරට මෙවර කැපී පෙනෙන තනි පුද්ගල දක්ෂතා ඇගයීමට ලක්කරමින් විශේෂ ඇගයීමේ පදක්කම් ද ප්‍රදානය කිරීම විශේෂත්වයකි.













මෙම අවස්ථාව නැරඹීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව හර්මන් ලූස් සහ ද සොයිසා කුසලාන ජයග්‍රාහකයින්, කෙඩෙට් කණ්ඩායම්, පාසල් තූර්ය වාදක කණ්ඩායම් සහ ශිෂ්‍ය නායක මණ්ඩල නියෝජනය කරමින් දේවි බාලිකා විද්‍යාලය, ආනන්ද විද්‍යාලය, කොළඹ රාජකීය විද්‍යාලය, ධර්මාශෝක විද්‍යාලය, මලියදේව බාලිකා විද්‍යාලය, මහමායා බාලිකා විද්‍යාලය, යශෝදරා දේවි බාලිකා විද්‍යාලය, විජය විද්‍යාලය, විදුර විද්‍යාලය, තිස්ස මධ්‍ය මහා විද්‍යාලය, වවුනියාව දමිළ මධ්‍ය මහා විද්‍යාලය, මාතලේ ශාන්ත තෝමස් විද්‍යාලය, කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, කොළඹ නාලන්දා විද්‍යාලය, කොළඹ මහානාම විද්‍යාලය, කරන්දෙණිය මධ්‍ය මහා විද්‍යාලය, පුනානි ඉක්‍රා මුස්ලිම් විද්‍යාලය, හෝමාගම මධ්‍ය මහා විද්‍යාලය, යාපනය හින්දු විද්‍යාලය, ආරක්ෂක විද්‍යාලය සහ අනුලා බාලිකා විද්‍යාලය ඇතුළු පාසල් 21 ක සිසුසිසුවියන් සහභාගී වූහ. එහිදී ඔවුන් වෙත යුද්ධ හමුදාවේ විනය සහ නිරවද්‍යතාවය පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට ද අවස්ථාවක් හිමිවූහ. මෙම සරඹ තරඟාවලිය සඳහා පාසල් සිසුසිසුවියන් සහභාගීකරවීම තුලින් යුද්ධ හමුදාව තුල ක්‍රියාත්මක වන හර පද්ධතිය පිළිබඳව මෙන්ම කණ්ඩායම් හැඟීම, අවධානය සහ කැපවීමේ වැදගත්කම පිළිබඳව ඔවුන් තුළ මනා අවබෝධයක් ඇති කිරීම අරමුණ විය.

එහිදී, දක්ෂතම පිරිමි සරඹ කණ්ඩායම ලෙස ප්‍රථම ස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාව ද දෙවන ස්ථානය ගැමුණු හේවා බලකාය ද දිනාගත් අතර, එහි දක්ෂතම කාන්තා සරඹ කණ්ඩායම ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායත් දෙවන ස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායත් දිනාගනු ලැබූහ. තරඟාවලියේ දක්ෂතම තූර්ය වාදක කණ්ඩායම ලෙස ප්‍රථම හා දෙවන ස්ථාන පිළිවෙලින් ශ්‍රී ලංකා පාබල හමුදාවත්, ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායත් දිනාගන්නා ලදි. ශ්‍රී ලංකා පාබල හමුදාව දක්ෂතම පියවර කෝදු කණ්ඩායම් තරඟයේ ප්‍රථම ස්ථානය දිනාගත් අතර එහි දෙවන ස්ථානය ගැමුණු හේවා බලකායට හිමිවිය. එසේම දක්ෂතම සරඹ උපදේශක ලෙස ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ බලලත් නිලධාරි II ඉහළගෙදර අයිජීඑස්බීජේ තේරිපත්වූ අතර, දක්ෂතම කණ්ඩායම් අණදෙන නිලධාරි - පිරිමි අංශයේ ප්‍රථම ස්ථානය ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ කපිතාන් එස් අර්ජුන ද එහි කාන්තා අංශයේ ප්‍රථම ස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ කපිතාන් එම් තෙන්නකෝන් ද හිමිකරගනු ලැබූහ. එසේම, දක්ෂතම තූර්ය වාදක ප්‍රථම ස්ථානය ගජබා රෙජිමේන්තුවේ සැරයන් විජේරත්න ඒජීටියු විසින් හිමිකරගන්නා ලදි.

# හටකාර්ය සම්පාදන පාඨමාලා අංක - 10
# උපාධි ප්‍රදානෝත්සවය

හටකාර්ය සම්පාදන පාඨමාලා අංක - 10 හි උපාධි ප්‍රදානෝත්සවය ඉකුත් දෙසැම්බර් මස 05 වන දින ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. හටකාර්ය සම්පාදන විද්‍යාලයේ සේනාවිධායක බ්‍රිගේඩියර් ආර්ටී ලොකුතොටහේවා යූඑස්පී පීඑස්සී ගේ ආරාධනයෙන් එම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය.



පරිපාලනය සහ හටකාර්ය සම්පාදනය පිළිබඳ ප්‍රමුඛතම වෘත්තීය පාඨමාලාව ලෙස පිළිගත් මෙම පාඨමාලාව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සෘජු මගපෙන්වීම යටතේ පවත්වනු ලබයි. මෙම වර්ෂය පුරාවට පූර්ණ කාලීන නේවාසික පාඨමාලාවක් ලෙස පැවැත්වූ එය සාර්ථකව හැදෑරූ නිලධාරීන් වෙත ‘Lsc’ ගෞරව නාමය ප්‍රදානය කරනු ලැබිය. මීට අමතරව, හටකාර්ය සම්පාදන විද්‍යාලය සහ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය එක්ව හටකාර්ය සම්පාදනයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය පිරිනැමීමට ද කටයුතු කරනු ලබයි.










මෙම පාඨමාලාව 2024 ජනවාරි මස 03 වන දින ආරම්භ කරනු ලැබූ අතර ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරීන් 24 දෙනෙක්, ශ්‍රී ලංකා ගුවන් හමුදා නිලධාරීන් දෙදෙනෙක් සහ සැම්බියානු යුද්ධ හමුදා නිලධාරියෙක් ඇතුළු නිලධාරීන් 27 දෙනෙක් ඊට සහභාගි වූහ. එහිදී, ප්‍රධාන ආරාධිත අමුත්තාගේ සුරතින් එම නිලධාරීන් වෙත උපාධිය පිරිනැමූ අතර, සුවිශේෂී අධ්‍යයන කාර්යසාධනයක් පෙන්නුම් කළ නිලධාරීන් වෙත විශේෂ සම්මාන ද පිරිනැමිණ. පාඨමාලාවේ දක්ෂතම ශිෂ්‍ය නිලධාරියා සහ හොඳම හටකාර්ය සම්පාදන සැලසුම්කරුට හිමි සම්මානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායේ මේජර් වීඑස්කේ සමරවික්‍රම දිනාගත්තේය. උත්සවය අතරතුරදී, හටකාර්ය සම්පාදන විද්‍යාලය වෙතින් වාර්ෂිකව නිකුත් කරනු ලබන සඟරාව වන ‘The Golden Log 2024’ සඟරාව නිල වශයෙන් එළිදැක්වූ අතර එහි පිටපත් ප්‍රධාන අමුත්තා සහ අනෙකුත් සම්භාවනීය අමුත්තන් වෙත පිළිගැන්වීම ද සිදුවිය. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපති, රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල ප්‍රධානීන්, උපාධිධාරීන්ගේ පවුල්වල සාමාජිකයන් ඇතුළු විශාල පිරිසක් එක්වූහ.

# මාණ්ඩලික විද්‍යාලයේ ආරාධිත දේශනයකට එක්ව





සපුගස්කන්ද ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ පාඨමාලා අංක 18 හදාරනු ලබන උපාධි අපේක්ෂකයින් වෙනුවෙන් සම්ප්‍රදායානුකූලව පවත්වන යුද්ධ හමුදාධිපතිගේ දේශනය ඉකුත් දෙසැම්බර් මස 06 දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ විසින් සිදුකරන ලදි. "2030 වර්ෂය වනවිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රවර්ධනය" තේමාව ඔස්සේ නවීකරණය, ධාරිතාවය ගොඩනැංවීම, තාක්ෂණික ඒකාබද්ධතාවය සහ උපායමාර්ගික අනුවර්තනය යන ප්‍රධාන කරුණු පදනම් කරගනිමින් යුද්ධ හමුදාධිපති මෙම දේශනය මෙහෙයවිය.

එහිදී, පිළිගැනීමේ දේශනය පවත්වමින් ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී පීඑස්සී විසින් උපාධි අපේක්ෂකයින් වෙත යුද්ධ හමුදාධිපතිතුමන් පිළිබඳ හැඳින්වීමක් සිදුකරනු ලැබීය. මෙම දේශනය සඳහා යුද්ධ හමුදා නිලධාරීන් 78 දෙනෙක්, නාවික හමුදා නිලධාරීන් 21 දෙනෙක්, ගුවන් හමුදා නිලධාරීන් 26 දෙනෙක් සහ බංගලාදේශය, ඉන්දියාව, ඉන්දුනීසියාව, මැලේසියාව, මාලදිවයින, නේපාලය, පාකිස්ථානය, රුවන්ඩාව, සෞදි අරාබිය, සෙනගල්, ඇමරිකා එක්සත් ජනපදය සහ සැම්බියාව යන රටවල් නියෝජනය කරන විදෙස් හමුදා නිලධාරීන් 25 දෙනෙක් ඇතුළු උපාධි අපේක්ෂකයින් 150 දෙනෙක් සහභාගී වූහ. දේශනය සමාප්තියේ, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ උපාධි අපේක්ෂකයින්ට යුද්ධ හමුදාධිපති සමග ප්‍රශ්නෝත්තර සැසියකට ද සහභාගීවීමේ අවස්ථාව හිමිවූහ.






# අන්තර් රෙජිමේන්තු ක්‍රීඩා ශූරතාවලිය - 2024

"අන්තර් රෙජිමේන්තු ක්‍රීඩා ශූරතාවලිය - 2024" හි ත්‍යාග ප්‍රදානෝත්සවය ඉකුත් දෙසැම්බර් මස 03 වන දින ග්‍රෑන්ඩ් මෙට්ලන්ඩ් පරිශ්‍රයේ දී පැවැත්විණ. ක්‍රීඩා අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් එල්කේටී ප්‍රනාන්දු ආර්එස්පී යූඑස්පී ගේ පිළිගැනුම් මධ්‍යයේ මෙම අවස්ථාවට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ප්‍රධාන අමුත්තා ලෙස එක්විය.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති සහ යුද්ධ හමුදා ක්‍රීඩා කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීඒඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ විසින් උත්සවයේ පිළිගැනීමේ කතාව සිදුකරන ලද අතර, 2024 වර්ෂයේදී දිවයින පුරා පැවති අන්තර් රෙජිමේන්තු ක්‍රීඩා තරගාවලියන්හිදී ක්‍රීඩා ඉසව් 29 ක් තුළින් ජයග්‍රහණය කළ ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් එහිදී ත්‍යාග ප්‍රදානය කෙරිණි. යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන සහ ශ්‍රී ලංකා කාලතුවක්කු බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී සහ බටහිර ආරක්ෂක සේනා ආඥාපති සහ ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ද ජයග්‍රාහකයින් වෙත කුසලාන ප්‍රදානය කිරීම සඳහා එක්වූහ. පසුගිය වසර තුළ අන්තර් රෙජිමේන්තු තරගාවලි තුළින් ජාත්‍යන්තර ජයග්‍රහණ හිමිකරගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් එහිදී මූල්‍ය ප්‍රදානයන් ද සිදුකෙරිණ.



# යුද්ධ හමුදා නත්තල් කැරොල් ගී ප්‍රසංගය





අසිරිමත් නත්තල සහ අලුත් අවුරුදු උදාව සනිටුහන් කරමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙතින් සංවිධානය කරනු ලැබූ "යුද්ධ හමුදා වාර්ෂික නත්තල් කැරොල් ගී ප්‍රසංගය" ඉකුත් දෙසැම්බර් මස 17 වන දින කොටහේන, ශාන්ත ලුසියා ආසන දෙව්මැදුරේ දී පැවැත්විණි.

මෙම උත්සව අවස්ථාවට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ යුද්ධ හමුදා ක්‍රිස්තියානි සංගමයේ සභාපති මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී ගේ ආරාධනයකට අනුව ප්‍රධාන අමුත්තා ලෙස ආරක්ෂක ලේකම් එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී (තෙවරක්), ආර්එස්පී (දෙවරක්), යූඑස්පී, එම්එම්එස්සී (උපායමාර්ගික අධ්‍යයනය - චීනය), එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ, එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයනය), එස්එන්ඩියූ (චීනය), පීඑස්සී සහභාගී වූ අතර කොළඹ අගරදගුරු අති උතුම් ආචාර්ය මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ද මෙම අවස්ථාවට ගෞරවනීය ආරාධිතයකු වශයෙන් එක්විය.







යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ භාර්යාවන් රැසක් ද මෙම අවස්ථාවට සහභාගී වූහ. "සාමයේ කුමරා"වන ජේසුස් වහන්සේගේ උපත සනිටුහන් කරමින් පැවැත්වූ මෙම ප්‍රසංගයේ දී සියලු ලෝකවාසීන් වෙත සාමය සහ සෞභාග්‍යය ප්‍රාර්ථනා කරමින් සිංහල, දමිළ සහ ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන්ම ගීතිකා ගායනා කිරීම විශේෂත්වයකි.

මෙම අවස්ථාවට නාවික හමුදාධිපති, හිටපු යුද්ධ හමුදාධිපතිවරු ඇතුළු විශ්‍රාමික නිලධාරීන් ද සෙසු නිලයන්, රණවිරු සෙවන සහ අභිමංසල සුවනා නිකේතනයන්හි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ඇතුළු විශාල පිරිසක් ද සහභාගී වූහ.





# ‘MA Alumni - 2024’ සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙන් නියෝජිත පිරිසක්

ඉන්දියානු යුද්ධ හමුදා විද්‍යාපීඨය (IMA) විසින් සංවිධානය කරන ලද ‘MA Alumni - 2024’ දෙසැම්බර් මස 6 වන දින සිට 9 වන දින දක්වා දෙරදුන් හිදී පැවැත්විණ. එමගින් එම යුද්ධ හමුදා විද්‍යාපීඨයේ පාඨමාලා අංක 86 සහ 87 හදාරන ලද යුද්ධ හමුදා නිලධාරීන් අතර සුහදත්වය වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කෙරිණ.

ඉන්දීය යුද්ධ හමුදාව විසින් කරන ලද ආරාධනයකට අනුව මෙම උත්සව අවස්ථාවට යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන සහ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජ්ඩ්බ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක සහ ගජබා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එම්ජ්ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී, බටහිර ආරක්ෂක සේනා ආඥාපති සහ ඉංජිනේරු බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඒච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී, මේජර් ජෙනරාල් ඩබ්ලිව්එච්කේඑස් පීරිස් (විශ්‍රාමික) ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ, මේජර් ජෙනරාල් එල්සීආර් ජයසූරිය (විශ්‍රාමික) ආර්ඩබ්ලිව්පී එන්ඩීසී පීඑස්සී, මේජර් ජෙනරාල් එස්ආර්බී අළුවිහාරේ (විශ්‍රාමික) ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී සහ යුද්ධ හමුදා රෝහලේ කළමනාකරණ හා නඩත්තු අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ආර්එම්ජේබී රත්නායක ආර්එස්පී සහභාගී වූහ.

ඉන්දීය යුද්ධ හමුදා විද්‍යාපීඨයේ සේනාවිධායක ලුතිනන් ජෙනරාල් සන්දීප් ජේන් විසින් පැමිණි පිරිස උණුසුම් අයුරින් පිළිගනිමින් උත්සවයේ කටයුතු ආරම්භ විය. අනතුරුව, පැවති සුහද හමුවකින් පසුව, පැමිණි නියෝජිත පිරිස එම යුද්ධ හමුදා විද්‍යාපීඨය මගින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් පිළිබඳ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයකට ද සහභාගී වූහ. එසේම, ඔවුන් එම විද්‍යාපීඨයේ ඉන්දීය යුද්ධ හමුදා ෆීල්ඩ් මාර්ෂල් සෑම් මැනේක්ෂෝ එම්සී විසින් විවෘත කරන ලද යුධ අනුස්මරණ ප්‍රතිමාව වෙත පුෂ්පෝපහාර දැක්වීමට ද එක්වූහ.







ඉන්දීය යුද්ධ හමුදා විද්‍යාපීඨයේ දැනට පුහුණුව ලබන ශ්‍රී ලාංකික කෙඩෙට් නිලධාරීන් ඇතුළු විදේශීය කෙඩෙට් නිලධාරීන් සමග ඔවුන් සුහද අදහස් හුවමාරුවකට ද සහභාගී වූහ. මෙම සංචාරයේ විශේෂත්වයක් ලෙස, නියෝජිත පිරිසෙහි ප්‍රධානී සහ ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන් කිහිපදෙනෙක් "ඛේත්‍රපාල්" ශ්‍රවණාගාරයේදී එම යුද්ධ හමුදා විද්‍යාපීඨයේ අධ්‍යක්ෂක කාර්යය මණ්ඩලය සහ උපදේශකවරුන් ඇතුළු කෙඩෙට් නිලධාරීන් 800කට අධික පිරිසක් ආමන්ත්‍රණය කරමින්, හමුදා නායකත්වය සහ වෘත්තීය සංවර්ධනය පිළිබඳව අවබෝධයක් ලබාදෙනු ලැබූහ. මෙම සංචාරය මගින් ඉන්දියානු යුද්ධ හමුදා විද්‍යාපීඨයේ පුහුණුව ලැබූ නිලධාරීන්ගේ වෘත්තීය සබඳතා වැඩිදියුණු කරන අතර, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර හමුදා සහයෝගීතාවය සහ මිත්‍රත්වය ද මනාව පෙන්නුම් කෙරේ. එසේම, මෙරට නියෝජනය කරමින් එවැනි පිරිසක් ඉන්දියාවට පැමිණි ප්‍රථම අවස්ථාව මෙය වීම ද විශේෂත්වයකි.

# ඓතිහාසික සෙවණක අභිමානවත් ඇරඹුමක්



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ 58 වන සේනාවිධායක ලෙස මේජර් ජෙනරාල් එම්ජ්ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ඉකුත් දෙසැම්බර් මස 05 දින එම බලකා මූලස්ථානයේ දී රාජකාරි භාරගනු ලැබීය.

ඒ නිමිත්තෙන් ප්‍රධාන දොරටුව අභියස දී එතුමන් වෙත යුද්ධ හමුදා සම්ප්‍රදායානුකූල කදවුරු මුරයේ ගෞරවාචාරය පිරිනැමුණු අතර, අනතුරුව දිවංගත කපිතාන් සාලිය අලදෙණිය රණවිරුවාගේ ස්මාරකය අභියස දී මව්බිම වෙනුවෙන් දිවි පිදූ රණවිරුවන් වෙත උපහාර දැක්වීමට ද හෙතෙම අමතක නොකළේය. පසුව හමුදා භටපිරිස් විසින් සම්මාන මුරයේ ගෞරවාචාරය ද එතුමන් වෙත පුදකළහ. එහිදී, නව සේනාවිධායක විසින් භට පිරිස් ආමන්ත්‍රණය කිරීමෙන් පසුව සියලු නිල තේපැන් සංග්‍රහයකට සහභාගී විය. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ වැඩබලන නියෝජ්‍ය සේනාවිධායක ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් විශාල පිරිසක් සහභාගී වූහ.



## යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා සාමාජිකයන්ගේ දිවියට වාරුවක්







ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ වැඩබලන නියෝජ්‍ය සේනාවිධායක සහ පුහුණු පරීක්ෂක බ්‍රිගේඩියර් බීඑම්ආර්ජේ බණ්ඩාර ගේ අධීක්ෂණය මත එම බලසේනාව වෙතින් ක්‍රියාත්මක කරනු ලබන වියළි ආහාර සලාක පාර්සල් බෙදාදීමේ වැඩසටහනේ තෙවන අදියර ඉකුත් දෙසැම්බර් මස 17 දින එම බලසේනා මූලස්ථානයේ බහුකාර්ය ශාලාවේ දී පැවැත්විණි. එහි සේනාවිධායක මේජර් ජෙනරාල් එම්ජ්ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම සත්කාරය මගින් ස්වේච්ඡා බලසේනාව යටතේ සේවයේ නියුතු සෙසුනිලයන් සහ සිවිල් සේවක මහත්ම මහත්මීන් 100 දෙනකු වෙත රු. 5000.00 ක වටිනාකමකින් යුත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු වියළි ආහාර පාර්සල් බෙදාදෙනු ලැබීය.



# ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයේ නියෝජ්‍ය දූත මණ්ඩල ප්‍රධානී, සංචාරයක

ශ්‍රී ලංකාව හා මාලදිවයින සඳහා ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයේ නියෝජ්‍ය දූත මණ්ඩල ප්‍රධානී ඔලිවියර් ප්‍රෑස් මහතා යුද්ධ හමුදාව වෙතින් අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබන ප්‍රජා ව්‍යාපෘති පිළිබඳ දැනුවත්වීමේ අරමුණින් ඉකුත් දෙසැම්බර් මස 16 වන දින යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයේ නිල සංචාරයක නිරත විය. එහිදී, 1 බලකායේ බලකාධිපති සහ වැඩබලන යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එම්ටීඅයි මහලේකම් ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී විසින් සංචාරයේ නිරත දූත පිරිස උණුසුම් අයුරින් පිළිගැනීමෙන් අනතුරුව එම මූලස්ථානය වෙතින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රජා මූලික ව්‍යාපෘති, ආරක්ෂාව සහ අනෙකුත් පොදු කරුණු කෙරෙහි විශේෂ අවධානයක් යොමුකරමින් යුද්ධ හමුදාවේ කාර්යභාරය සබැඳිව සවිස්තරාත්මක දැනුවත් කිරීමක් සිදුකළේය.

## ඒකක සංචාරයක්

වන්නි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පසුගිය නොවැම්බර් මස 30 වන දින 21 වන පාබල සේනාංකය යටතේ පාලනය වන 9 ගජබා රෙජිමේන්තුව සහ 5 (ස්වේච්ඡා) ගජබා රෙජිමේන්තුව යන ඒකකවල සංචාරයක නිරත විය. එම ඒකකයන්හි මෙහෙයුම් සූදානම සහ පරිපාලන කටයුතු සොයාබැලීම, භටපිරිස්වල චිත්ත ධෛර්යය ඉහළ නැංවීම සහ ඒකක අතර සහජීවනය ශක්තිමත් කිරීම මෙම සංචාරයෙහි අරමුණ විය. එහිදී, එම ඒකක අණදෙන නිලධාරීවරු විසින් ඔවුන් වෙත පැවරී ඇති වගකීම්, කාර්යභාරයන් සහ දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතීන් පිළිබඳව ආඥාපති දැනුවත් කළහ. 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්එස්සීකේ වනසිංහ ආර්එස්පී යූඑස්පී, 211 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ටීඩීපී සිරිවර්ධන පීඑස්සී ඇතුළු නිලධාරීහු හා ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන් රැසක් ඊට සහභාගී වූහ.








# බර ඉසිලීමේ ජාතික ශූරියට මූල්‍ය සවියක්

වයස අවුරුදු 17 න් පහළ කිලෝග්‍රෑම් 49 බර ඉසිලීමේ කාණ්ඩයේ ජාතික ශූරිය ලෙස තේරීපත්වී ඇති සෙවනපිටිය මහා විද්‍යාලයේ ශිෂ්‍යාවක් වන එම්. ඉනෝෂා නවෝද්‍යා, ඉකුත් දෙසැම්බර් මස 19 වන දින සිට 25 දින දක්වා දෝහා, කටාර්හි හි පැවැත්වෙන 2024 ආසියානු යොවුන් හා කනිෂ්ඨ බර ඉසිලීමේ ශූරතාවලියට තරග කිරීමට අවස්ථාව හිමිකරගෙන ඇත. නමුත්, ආර්ථික දුෂ්කරතා හේතුවෙන් එම ශිෂ්‍යාවට අවශ්‍ය ක්‍රීඩා උපකරණ ලබාගැනීමේ දැඩි අපහසුතාව පැවතිණ. එහිදී, සෙවනපිටිය මහා විද්‍යාලයේ විදුහල්පතිතුමන් විසින් සිදුකරනු ලැබූ ඉල්ලීමකට අනුව, ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් කේවීඑන්පී ප්‍රේමරත්න ආර්එස්පී යූඑස්පී පීඑස්සී විසින් ඇයගේ ඉදිරි ශූරතාවලියේ වියදම් සඳහා රුපියල් 80,000/= ක මුදලක් ඉකුත් දෙසැම්බර් මස 13 වන දින නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානයේ දී ඇය වෙත පරිත්‍යාග කරන ලදි.

# කළුඅග්ගල කාන්තා බලකා අනුබණ්ඩයේ සංචාරයක

නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් කේවීඑන්පී ප්‍රේමරත්න ආර්එස්පී යූඑස්පී පීඑස්සී 2024 දෙසැම්බර් මස 17 දින කළුඅග්ගල, කාන්තා බලකා අනුබණ්ඩයේ නිල සංචාරයක නිරත විය. එහිදී, එම අනුබණ්ඩ භාර නිලධාරිනි මේජර් එස්ඊ කපුගමගේ විසින් කඳවුරු පරිශ්‍රය වෙත සපැමිණි බලකාධිපතිතුමන් පිළිගනු ලැබූ අතර, පසුව එහි පරිපාලන කටයුතු පිළිබඳව එතුමන් දැනුවත් කිරීමට ද කටයුතු කරනු ලැබුවාය.





සිය සංචාරයේ දී බලකාධිපති එහි යොදවා ඇති විශේෂ ක්‍රියාන්විත සහායක කණ්ඩයෙහි භටපිරිස් අමතා, තම ඉදිරි දැක්ම ප්‍රකාශ කරමින් පුහුණුව, විනය සහ ආරක්ෂාව සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබාදෙනු ලැබීය. තවද, එම අනුබණ්ඩය නගාසිටුවීමට සහ සෑම අතින්ම අභිමානය පවත්වාගැනීමේ වැදගත්කම පිළිබඳව ද එහිදී වැඩිදුරටත් අවධාරණය කරන ලදි.



# රණවිරු දිරියෙන් නව නිවසක් පරිත්‍යාග කෙරේ



6 බලඇණිය ගජබා රෙජිමේන්තුවේ භටපිරිස් එකතුව මරදන්කඩවල ලබුනොරුව ප්‍රදේශයේ නිවාස අවශ්‍යතා ඇති පවුලක් සඳහා නව නිවසක් ඉදිකරදෙනු ලැබුහ. මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස සහභාගී වූ බටහිර ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී විසින් ආගමික වතාවත් මධ්‍යයේ නව නිවසේ යතුරු පවුලේ සාමාජිකයින් වෙත ඉකුත් දෙසැම්බර් මස 10 වන දින ප්‍රදානය කරන ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍ය දායකත්වය සහ ද්‍රව්‍යමය ආධාර ප්‍රදේශීය පරිත්‍යාගශීලීහු විසින් සපයනු ලැබූහ.

# සංචාරයක මතක සටහන්

බටහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් දෙසැම්බර් මස 11 වන දින 1 බලඇණිය ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ සංචාරයක නිරත විය. එහිදී, ආඥාපති වෙත භටපිරිස් විසින් හමුදා සම්ප්‍රදායානුකූල ගෞරවාචාරය පුදකිරීමෙන් අනතුරුව එම ඒකකයේ අණදෙන නිලධාරී මේජර් කේඑන්එම්එන් මැදගෙදර යූඑස්පී එල්එස්සී විසින් එතුමන් උණුසුම් අයුරින් පිළිගනු ලැබීය. ඉන් අනතුරුව, ඒකක අණදෙන නිලධාරී විසින් එම ඒකකයේ කාර්යභාරය, වත්මන් ක්‍රියාන්විතයන් සහ මේ වනවිට ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් සබැඳිව එතුමන්ට සවිස්තරාත්මකව දැනුවත් කළේය. පසුව, එම ඒකකයේ කාර්යාල පරිශ්‍රය, සලාක ගබඩාව සහ රථවාහන නඩත්තු කරන ස්ථාන වෙත ගොස් එහි සේවයේ නියුතු කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ක්‍රියාන්විත සූදානම සහ හැකියාවන් ආඥාපතිගේ ඇගයීමට බඳුන්විය.









## ශ්‍රී පාදස්ථාන විහාරස්ථානයේ පිහිටි අම්බලම ප්‍රතිසංස්කරණය කෙරේ

19 බලඇණිය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ අණදෙන නිලධාරී මේජර් එම්ජීකේඑම් ගුණරත්න ගේ මගපෙන්වීමෙන් එම ඒකක හටපිරිස් එකතුව ඉංජිනේරු සේවා රෙජිමේන්තුව සමග ඒකාබද්ධව පූජනීය ශ්‍රී පාදස්ථාන විහාරස්ථානයේ සීත ගඟුල ප්‍රදේශයේ පිහිටි අම්බලම ප්‍රතිසංස්කරණය කරනු ලැබූහ. මෙම අම්බලම ප්‍රතිසංස්කරණ සිදුකිරීම මගින් ශ්‍රී පාදස්ථාන වන්දනා සමයේදී දහස් සංඛ්‍යාත බැතිමතුන්ගේ විඩාව නිවාගැනීම සඳහා සැලසෙනුයේ ඉමහත් සහනයකි. මධ්‍යම ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් වයිඑබීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ගේ සුරතින් එලෙස ප්‍රතිසංස්කරණය කළ අම්බලම නිල වශයෙන් විවෘත කරනු ලැබූ අතර, එම අවස්ථාවට 11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 642 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ඇතුළු පිරිසක් සහභාගී වූහ.







## නව බලකාධිපති සුබ මොහොතින් රාජකාරී අරඹයි

ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකායේ බලකාධිපති ලෙස 22 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් යූකේඩීඩීපී උඩුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් දෙසැම්බර් මස 10 වන දින කරන්දෙණියේ ස්ථාපිත එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී රාජකාරී භාරගනු ලැබීය. එහිදී, මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ටීඑම්එස්ජේ තෙන්නකෝන් ආර්එස්පී ගේ උණුසුම් පිළිගැනුම මධ්‍යයේ සපැමිණි බලකාධිපති වෙත එහි හටපිරිස් ගෞරවාචාර පුදකළහ. එහිදී, සිය රාජකාරී විෂය පථය සහ රාජකාරී ස්වභාවය පිළිබඳව පැහැදිළි කරමින් හටපිරිස් ආමන්ත්‍රණය කළ එතුමන් සියලු නිල තේ පැන් සංග්‍රහයකට ද එක්විය.




## 36 වන සංවත්සර දිනයේ මතක සටහන්

1 විශේෂ බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඩීඩී මාසිංහ ආර්ඩබ්ලිව්පී යූඑස්පී පීඑස්සී ගේ මඟපෙන්වීම යටතේ ඉකුත් දෙසැම්බර් 10 වන දින එම ඒකක 36 වන සංවත්සරය මහත් අභිමානයෙන් සමරනු ලැබීය. එහිදී, රණවිරු ස්මාරකය අභියස ආගමික වැඩසටහනක් සහ දිවංගත රණවිරුවන් සිහිකිරීමේ වැඩසටහනක් ද පැවැත්විණි. මෙම අවස්ථාවට විශේෂ බලකා බලකාධිපති සහ ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ඇතුළු එම බලකා ජ්‍යෙෂ්ඨ, කණිෂ්ඨ නිලධාරීන්, විශේෂ බලකා රෙජිමේන්තු ප්‍රවීණයන්ගේ සංගමයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ විශ්‍රාමලත් බලලත් නිලධාරීන් රැසක් සහභාගී වූහ.

## යටිතල පහසුකම් වැඩිදියුණු කරමින්







61 වන පාබල සේනාංකයේ ස්ථාපිත වාහන සේවා ස්ථානය වැඩිදියුණු කිරීමෙන් පසු රණවිරු අයිතියට පැවරීම එම පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේටීපී ද සිල්වා ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ සුරතින් ඉකුත් දෙසැම්බර් 16 වන දිනට යෙදුණු සුබ මොහොතින් සිදුකෙරිණ.

## රණවිරුවන් වෙනුවෙන් රසවින්දනාත්මක වැඩසටහනක්



රණවිරු සේවා හා පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් පාලනය වන රණවිරු සෙවණ පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ නේවාසික රණවිරුවන් වෙනුවෙන් රසවින්දනාත්මක වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් මස 04 වන දින පැවැත්විණ. එම වැඩසටහන සඳහා GENDER EQUTTY & EQUALITY CLUB සාමාජිකයින් ද, රණවිරු සෙවණ පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ සේනාවිධායක ඇතුළු නේවාසික රණවිරුවන් ද, එහි කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් ද සහභාගී වූහ. කැලණිය විශ්වවිද්‍යාලයේ GENDER EQUTTY & EQUALITY CLUB වෙතින් මෙම වසරේ සමාජ සේවා වැඩසටහනක් ලෙස එය සිදුකරන ලදි.

# හදිසි ගිනි නිවීමේ පෙරහුරු අභ්‍යාසයක්

**141 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ආර්ආර් ද එස් ධර්මවික්‍රම ආර්එස්පී ගේ මගපෙන්වීම මත ඉකුත් දෙසැම්බර් මස 13 වන දින කෙරවලපිටිය, සීමාසහිත ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්තයේ දී (CPSTL) හදිසි ගිනිනිවීමේ පෙරහුරු අභ්‍යාසයක් සාර්ථකව පැවැත්විණ.**





එහිදී, එම පාබල බලසේනාවේ හටපිරිස් සහ ඛනිජ තෙල් ගබඩා පර්යන්තයේ සේවයේ නියුතු නිලධාරීන් ඒකාබද්ධව මෙම පෙරහුරු අභ්‍යාසය සිදුකරනු ලැබූහ. එම පර්යන්තයෙහි හදිසි ගිනි නිවීමේ තත්ත්වයන් සඳහා වඩාත් කාර්යක්ෂමව හා සාමූහිකව ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වැඩිදියුණු කරමින් අන්තර් නියෝජිතායතන සම්බන්ධීකරණය සහ ඒ සඳහා පෙර සූදානම වැඩිදියුණු කිරීමේ අරමුණින් මෙම පෙරහුරු අභ්‍යාසය පැවැත්විණ. ඒ සඳහා 8 බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව, 1 ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ "සී" බලසෙණය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ගිනි නිවීමේ ඒකකය, සපුගස්කන්ද තෙල් පිරිපහදුව, වරාය අධිකාරිය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ගම්පහ සහ කොළඹ ගිනි නිවන හමුදා ඒකක සහ සීමාසහිත ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්තයේ ගිනි නිවීමේ ඒකක සාමාජිකයෝ සහභාගී වූහ.



තවද, සීමාසහිත පෙට්‍රෝලියම් ගබඩා පර්යන්තයේ ගිනි නිවීමේ කණ්ඩායම් හා ආරක්ෂක අංශය විසින් ද ඉකුත් නොවැම්බර් මස 21 වන දින මාගල්ල, පෙට්‍රෝලියම් ගබඩා පර්යන්තයේ හදිසි ගිනි නිවීමේ පෙරහුරුවක් සංවිධානය කරනු ලැබූහ. එහිදී, එම පර්යන්තයේ ගින්නක් හෝ වෙනත් හදිසි අවස්ථාවකදී සූදානම සහ ඊට ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වැඩිදියුණු කිරීමේ අරමුණින් මෙම අභ්‍යාසය පැවැත්වූ අතර, ඒ සඳහා 2(සේවා) බළඇණිය ගැමුණු හේවා බලකායේ නිලධාරියකු සහ සෙසු නිලයින් 05 දෙනකුගෙන් සමන්විත කණ්ඩායමක් සහභාගී වූහ. එමෙන්ම, ඵලදායී හදිසි ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය සහයෝගය අවධාරණය කරමින් ශ්‍රී ලංකා නාවික හමුදාවේ සාමාජිකයින් සහ සිවිල් සංවිධාන නියෝජිතයින් ද මෙම පෙරහුරු අභ්‍යාසය සඳහා සහභාගී වීම විශේෂත්වයකි. මෙහිදී, සියලුම දෙනා අතර මනා සම්බන්ධීකරණය, සන්නිවේදනය සහ උපායශීලී ප්‍රතිචාර දැක්වීම සඳහා විවිධ ගිනි ගැනීම් හා සම්බන්ධ හදිසි අවස්ථා පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් ලබාදෙනු ලැබිය.



# විරු දිරියට උපදේශනයක්



141 වන පාබල බලසේනාවේ බලසේනාධිපතිගේ මගපෙන්වීම මත "අභිමානවත් සොල්දාදුවා" තේමාව ඔස්සේ මනෝවිද්‍යාත්මක දේශනයක් ඉකුත් දෙසැම්බර් මස 04 වන දින එම බලසේනාවේ දී පැවැත්විණි. මෙම දේශනය යුද්ධ හමුදා සාමාජිකයන් අභිප්‍රේරණය කිරීම, පුද්ගල සංවර්ධනය, සමාජ වටිනාකම් සහ වෘත්තීය වගකීම් පිළිබඳ ඔවුන් සතු අවබෝධය වැඩිදියුණු කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරනු ලැබීය. නිලධාරීන් 12 දෙනෙක් සහ සෙසුනිලයන් 142 දෙනකුගේ සහභාගීත්වයෙන් පැවති මෙම දේශනය ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ මේජර් එම්එච්එම්එස් බණ්ඩාර එල්එස්සී විසින් මෙහෙයවන ලදි.

# පිටත ජලයන්ත්‍ර පිළිබඳ පුහුණු සැසියක්





ශ්‍රී ලංකා නාවික හමුදාව සමග එකාබද්ධව 24 වන පාබල සේනාංකය විසින් සංවිධානය කළ පිටත ජලයන්ත්‍ර පිළිබඳ එක්දින පුහුණු සැසියක් ඉකුත් නොවැම්බර් මස 12 වන දින ඔලුවිල් වරාය පරිශ්‍රයේ දී පැවැත්විණ. නිරිත දිග මෝසම් වැසි හේතුවෙන් 24 වන පාබල සේනාංකයේ ඇති සෙවීමේ හා මුදවා ගැනීමේ කණ්ඩායම්හි හැකියාවන් සහ කුසලතා ප්‍රවර්ධනය කිරීම මූලික අරමුණින් මෙම පුහුණු සැසිය පවත්වන ලදි. ශ්‍රී ලංකා නාවික හමුදාවේ අත්දැකීම් බහුල උපදේශකයින් විසින් මෙහෙයවූ මෙම පුහුණු සැසිය න්‍යායාත්මක හා ප්‍රයෝගික ක්‍රියාකාරකම්වලින් සමන්විත වූ අතර, පිටත ජලයන්ත්‍ර භාවිතා කිරීමේ ශිල්පීය ක්‍රම හා නඩත්තුව පිළිබඳ සවිස්තරාත්මක අවබෝධයක් ද ලබාදෙන ලදි. තවද, විවිධ ජල තත්වයන් යටතේ පිටත ජලයන්ත්‍ර උපයෝගී කරගෙන ආරක්‍ෂාකාරීව බෝට්ටු ධාවනය කිරීම පිළිබඳව උපදෙස් සහ ප්‍රායෝගික දැනුම ද ලබාදෙන ලද අතර, මේ සඳහා නිලධාරීන් 08 දෙනෙක් සහ සෙසුනිලයින් 32 ක් සහභාගි වූහ.

# වෘත්තීය සංවර්ධන වැඩමුළුවක්







ඉංජිනේරු සේවා අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අධ්‍යක්‍ෂ බ්‍රිගේඩියර් වයිකේඑස් රංගික පීඑස්සී පීටීඑස්සී ගේ මඟපෙන්වීම මත ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉංජිනේරු හා තාක්‍ෂණ විද්‍යාලය සමග ඒකාබද්ධව ඉකුත් දෙසැම්බර් මස 04 වන දින ඉංජිනේරු සේවා බලකා මූලස්ථානයේ දී වෘත්තීය සංවර්ධන වැඩමුළුවක් පැවැත්විණ. එහිදී ඌව - කුඩාඔය කමාන්ඩෝ හටයින්ගේ "ආත්ම විශ්වාසයේ පිම්ම" ව්‍යාපෘතිය සැලසුම් කිරීම, නිර්මාණය කිරීම සහ ඉදිකිරීම තුළින් උගත් පාඩම් සහ අභියෝග පිළිබඳව ප්‍රධාන වශයෙන් අවධානය යොමුකෙරිණ. තාක්‍ෂණික ප්‍රවීණත්වය වැඩිදියුණු කිරීම සහ ත්‍රිවිධ හමුදාවන්හි අනාගතය හැඩගැස්වීම අරමුණු කරගත් තීක්‍ෂණ බුද්ධිය සහිත දැනුම බෙදාගැනීමේ අරමුණින් මෙය ක්‍රියාත්මක කෙරිණි. යුද්ධ, නාවික සහ ගුවන් හමුදා සාමාජිකයින් 140 කට අධික පිරිසක් සහභාගී වූ මෙම වැඩමුළුව ඉංජිනේරු සේවා බලකායේ ප්‍රවීණයන්ගේ මූලිකත්වයෙන් පැවැත්විණ.

# උසස් ගුවන් සංක්‍රමික බලඇණි පුහුණු පාඨමාලා - අංක 03





උසස් ගුවන් සංක්‍රමික බලඇණි පුහුණු පාඨමාලා අංක 3 හි බලඇණි ඉදිරිපත් කිරීම සහ එහි අවසාන දේශනය ඉකුත් දෙසැම්බර් මස 09 සහ 10 යන දෙදින තුළ නිකවැව, ගුවන් සංක්‍රමික බලඇණි පුහුණු පාසලේ දී පැවැත්විණ. එහිදී, පාඨමාලාවේ විශේෂ දක්ෂතා දැක්වූවන් වෙත සම්මාන පිරිනැමීම 533 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ජීජීකේආර් ගුණරත්න පීඑස්සී ගේ සුරතින් සිදුකෙරිණ. පාඨමාලාවේ හොඳම වෙඩික්කරු ලෙස පාබල සෙබළ ලක්මාල් ජීටී ද දක්ෂතම ශාරීරික යෝග්‍යතාව හිමි ශිෂ්‍යයා ලෙස කෝප්‍රල් සුමනසිරි පීජී ආර්එස්පී ද හොඳම කණ්ඩායම ලෙස "සී" කණ්ඩායම ද සම්මාන දිනාගනු ලැබූහ.





## මූලික ප්‍රගුණ වෙඩිකරු පාඨමාලා - අංක 217

මූලික ප්‍රගුණ වෙඩික්කරු පුහුණු පාඨමාලා අංක - 217 හි සමාප්ති උත්සවය ඉකුත් දෙසැම්බර් මස 07 වන දින දියතලාව ප්‍රගුණ හා සැඟවුණු වෙඩිකරු පුහුණු පාසලේ දී පැවැත්විණි. ඉකුත් නොවැම්බර් මස 11 වන දින ආරම්භ වූ මෙම පාඨමාලාව සඳහා නිලධාරීන් 16 දෙනෙක් සහ සෙසුනිලයන් 85 දෙනෙක් සහභාගී වූහ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී වූ බ්‍රිගේඩියර් ආර්පී මුනිපුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් සමාප්ති දේශනය පවත්වමින් පාඨමාලාව හැදෑරූවන්ගේ කැපවීම ඇගයීමට ලක්කරන ලදී. පාඨමාලාවේ ප්‍රථම ස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාවේ ලුතිනන් ඒඑම්එම්අයි අධිකාරිනායක විසින් දිනාගත් අතර, කමාන්ඩෝ රෙජිමේන්තුවේ ලා/කෝ රත්නායක ආර්එම්අයිකේ සහ විශේෂ බලකායේ කෝප්‍රල් ජයවර්ධන එන්ජීඩීජේපී පිළිවෙලින් දෙවන හා තෙවන ස්ථානවලට හිමිකම් කියූහ.

## නායකත්ව සහ වෘත්තීය ප්‍රවර්ධන පාඨමාලා - අංක 58



"නායකත්ව සහ වෘත්තීය ප්‍රවර්ධන පාඨමාලා අංක - 58" හි සහතිකපත් ප්‍රදානෝත්සවය ඉකුත් දෙසැම්බර් මස 09 වන දින අම්පාර සටන් පුහුණු පාසලේදී පැවැත්විණ. එහිදී, යුද්ධ හමුදාවේ විවිධ රෙජිමේන්තු නියෝජනය කරමින් කොමිෂන් නොලත් නිලධාරීන් 86 දෙනෙක් ඊට සහභාගී වූහ. ඒ අතරින් පාඨමාලාවේ දක්ෂතම ශිෂ්‍යයා ලෙස 11 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ ලා/කෝ වීරසුන්දර ඩබ්ලිව්එම්එස්එල් ඇගයීමට ලක්විය. සහතිකපත් ප්‍රදානය කිරීමේ උත්සවයේ ප්‍රධාන ආරාධිතයා ලෙස එම පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් එල්එච්එම් රාජපක්ෂ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සහභාගී විය.






## මූලික පිහිනුම් පාඨමාලා - අංක 22

"මූලික පිහිනුම් පාඨමාලා අංක - 22" ඉකුත් නොවැම්බර් මස 05 වන දින සිට දෙසැම්බර් මස 13 වන දින දක්වා අනුරාධපුර පිහිටි වන්නි ආරක්ෂක සේනා මූලස්ථාන පිහිනුම් තටාකයේ දී පැවැත්විණි. එහි සමාප්ති උත්සවයේ ප්‍රධාන ආරාධිතයා ලෙස 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්එස්සීකේ වනසිංහ ආර්එස්පී යූඑස්පී සහභාගී විය. මෙහිදී, පාඨමාලාව සාර්ථකව අවසන් කළ නිලධාරියෙක් සහ සෙසුනිලයන් 30 දෙනකුගෙන් සමන්විත කණ්ඩායමක් ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමයේ සහයෝගය මත "ජාත්‍යන්තර ජීවිතාරක්ෂක සහතිකය (ILS)", "හෘද පුනර්ජීවය පුහුණුව (CPR)" හා "ජල ආරක්ෂක පුහුණුව (Water Safety)" ලබාගනු ලැබූහ. එහිදී, 4 ශ්‍රී ලංකා සංඥා බලකායේ සංඥා සෙබළ ලක්ෂාන් ජේජ්එම් පාඨමාලාවේ දක්ෂතම සිසුවාට හිමි සම්මානය හිමිකරගත්තේය.






# පුහුණුව තුළින් අභිමානය

11 බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ බළඇණි පුහුණු පාඨමාලාව ඉකුත් ඔක්තෝබර් මස 14 වන දින සිට දෙසැම්බර් මස 02 වන දින දක්වා නිලධාරීන් 07 දෙනෙක් සහ සෙසුනිලයන් 295 දෙනකුගේ සහභාගීත්වයෙන් මුලන්කාවිල් බළඇණි පුහුණු පාසලේ දී පැවැත්විණි. පාඨමාලාවේ සමාප්ති අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස 51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්පීඑන්ජ් මුතුමාල යූඑස්පී පීඑස්සී සහභාගී විය.

8 බළඇණිය විජයබාහු පාබල රෙජිමේන්තුවේ බළඇණි පුහුණු පාඨමාලාව ආලංකුලම ප්‍රදේශයේ ස්ථාපිත පාබල බළඇණි පුහුණු පාසලේදී ඉකුත් දෙසැම්බර් මස 06 දින සාර්ථකව අවසන් කෙරිණි. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී වූ 54 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්පීජ්ආර්පී රාජපක්‍ෂ ආර්එස්පී විසින් පාඨමාලාවේ සමාප්ති දේශනය සිදුකරන ලදි. නිලධාරීන් 13 දෙනෙක් සහ සෙසුනිලයන් 413 දෙනකුගේ සහභාගීත්වයෙන් පැවති මෙම පාඨමාලාවේ දක්‍ෂතම වෙඩික්කරු ලෙස සෙ/516530 බලලත් නිලධාරී 11 හෙට්ටිආරච්චි එච්ජ්එන්ඩි ආර්එස්පී ද, සෑම අතින්ම අතිශූර සිසුවා ලෙස සෙ/518411 සැරයන් බණ්ඩාර ටීඑම්එන් ද, දක්‍ෂතම පෙළ අණදෙන්නා ලෙස සෙ/526728 කෝප්‍රල් ප්‍රනාන්දු ඒආර් ද, හොඳම ශාරීරික යෝග්‍යතාවය ඇති සෙබළා  ලෙස සෙ/519365 සැරයන් නිශාන්ත විජීජ් ද සම්මාන හිමිකරගත් අතර, "බී" කණ්ඩායම එහි දක්ෂතම කණ්ඩායමට හිමි සම්මානය ලබාගනු ලැබීය.



14 (සෙව්) ගැමුණු හේවා බලකායේ බළඇණි පුහුණු පාඨමාලාව ඉකුත් දෙසැම්බර් මස 05 වන දින ගල්කුලම පාබල බළඇණි පුහුණු පාසලේ දී සාර්ථකව නිමාවිය. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී වූ 59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීආර්එන් හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී විසින් එහි සමාප්ති දේශනය පවත්වන ලදි. පාඨමාලාව සඳහා නිලධාරීන් 11 දෙනෙක් සහ සෙසු නිලයන් 378 දෙනෙක් සහභාගී වූහ.

## 22 ගජබා රෙජිමේන්තු බලඇණි පුහුණු පාඨමාලාව





22 බලඇණිය ගජබා රෙජිමේන්තුවේ බලඇණි පුහුණු පාඨමාලාව ඉකුත් ඔක්තෝම්බර් මස 14 වන දින සිට දෙසැම්බර් මස 04 වන දින දක්වා කටුකෙලියාව 1 බලකා පුහුණු පාසලේ දී පැවැත්විණි. නිලධාරීන් 12 දෙනෙක් සහ සෙසුනිලයන් 330 දෙනෙක්ගේ සහභාගීත්වයෙන් පැවති මෙම පාඨමාලාවේ විශිෂ්ට දක්ෂතා දැක්වූවන් වෙත සම්මාන සහ කුසලාන පිරිනැමීම 53 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඑච්එම්එස් වික්‍රමරත්න ආර්එස්පී විසින් සිදුකරන ලදි.

## පරිසරය රැකුමට යුද්ධ හමුදාවෙන් ඇරඹුමක්

143 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් කේඒඩීටීපී විමලසේන ආර්ඩබලිව්පී ආර්එස්පී ගේ මගපෙන්වීම යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය, අමෝනට්ටම් ප්‍රදේශයේ කඩොලාන පැළ 10,000 ක් රෝපණය කිරීමේ පාරිසරික වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් 13 වන දින දියත්කරන ලදි. ලිනියා ඇක්වා පුද්ගලික සමාගමේ සහයෝගයෙන් සිදුකරනු ලැබූ මෙම වැඩසටහන සඳහා 16 ගජබා රෙජිමේන්තුවේ භටපිරිස් විසින් සිය ශ්‍රම දායකත්වයක් ලබාදෙනු ලැබූහ. පරිසර සංරක්ෂණය සහ වෙරළබඩ පරිසර පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ශ්‍රී ලංකා යුද හමුදාවේ කැපවීම මෙමගින් ඉස්මතු කරයි.



## සොළොස් වසක අභිමානය සමරා





21 බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ 16 වන සංවත්සරය එම ඒකක අණදෙන නිලධාරී මේජර් එම්බී පුංචිහේවා ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් දෙසැම්බර් මස 04 වන දින පැවැත්විණ. එහිදී, ඒකක අණදෙන නිලධාරී වෙත භටපිරිස් විසින් හමුදා සම්ප්‍රදායානුකූල ගෞරවාචාරය පුදකිරීම, අණදෙන නිලධාරී විසින් භටපිරිස් ඇමතීම, සියලු නිල දිවා භෝජන සංග්‍රහය ආදී නවත් වැඩසටහන් රැසක් සංවත්සර දිනය වර්ණවත් කරමින් පැවැත්විණ.

# දිරිය මිනිසුන් වෙත අත්වැලක්

නැගෙනහිර බලප්‍රදේශයට අයත් පීපී/13 කඳහිඳගම හුලංනුගේ ග්‍රාම සේවා වසමේ පදිංචි හඳුන්නේත්තිගේ පද්මසිරි පෙරේරා යන අය හට ඉකුත් නොවැම්බර් 26 වන දින නව නිවසක් ඉදිකරදීම 242 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් කේපීඑල් අමුණුපුරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ. මෙම අවස්ථාව සඳහා ලාහුගල ප්‍රාදේශීය ලේකම් එන් නවනිදරාජා මහතා සහභාගී වූ අතර, එහිදී ග්‍රාම සේවා වසම් තුළ ජීවත්වන අඩු අදායම්ලාභී පවුල්වල ගැබිණි මවුවරුන් 25 දෙනෙක් සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ බෙදාදීමේ වැඩසටහනක් ද පැවැත්විණ. නිවාස සංවර්ධන අධිකාරියේ මූල්‍ය දායකත්වයෙන් සහ 14 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු භටපිරිස් හි ශ්‍රමදායකත්වයෙන් මෙහි ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලැබූහ.





# මාහැඟි පරිත්‍යාගයක්





56 වන පාබල සේනාංකය විසින් නෙදුන්කර්නි සහ පාලිනගර් ප්‍රදේශවල අඩු ආදායම්ලාභී පවුල්වල ජීවනෝපාය වැඩි දියුණු කිරීමේ අරමුණින් පවුල් 150 ක් සඳහා කුකුල් පැටවුන්, එළවලු පැළ සහ ගොවි උපකරණ බෙදාදීමේ වැඩසටහනක් "ශ්‍රී ලංකා හදමිම" අධිකාරියේ දායකත්වයෙන් ඉකුත් නොවැම්බර් මස 19 වන දින පැවැත්විණ. මෙම අවස්ථාවට 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්පීඑන්ජ් මුතුමාල යූඑස්පී පීඑස්සී, 561 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් බීඩී ප්‍රනාන්දු යූඑස්පී එච්ඩීඑම්සී පීඑස්සී ඇතුළු යුද්ධ හමුදා සාමාජිකයින් සහ ප්‍රදේශවාසීන් පිරිසක් සහභාගී වූහ.

# විපතට පත්වූවන්ට ආධාර

පසුගිය දිනවල පැවති අයහපත් කාලගුණික තත්වය හේතුවෙන් අවතැන්වූ සිවිල් වැසියන් 200 දෙනෙක් සඳහා වියලි ආහාර ලබාදීමේ වැඩසටහනක් මණ්නකන්ඩාල් ග්‍රාම නිලධාරී කාර්යාලයේ දී පැවැත්විණ. 59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීආර්එන් හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ සම්බන්ධීකරණය හා අධීක්ෂණය යටතේ පැවති මෙම වැඩසටහන සඳහා දෙරණ විද්‍යුත් මාධ්‍ය ආයතනය සහ ඩයලොග් ආසියාටා ආයතන පූර්ණ අනුග්‍රාහක දායකත්වය ලබාදෙන ලදි. 6 බළඇණිය ගැමුණු හේවා බලකාය විසින් සංවිධානය කළ මෙම වැඩසටහන සඳහා 59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, පුදුකුඩිඉරිප්පු සහකාර ප්‍රාදේශීය ලේකම් එස් ජයකාන්තන්, මුලතිව් ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන සහකාර අධ්‍යක්ෂක ගෝකුලරාජ් යන මහත්වරු, දෙරණ විද්‍යුත් මාධ්‍ය ආයතනයේ සහ ඩයලොග් ආසියාටා ආයතනයේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් පිරිසක් ද සහභාගී වූහ.






## ඒකක සංචාරයක්

ඉංජිනේරු සේවා බලකා කර්නල් සේනාවිධායක මෙන්ම අධ්‍යක්‍ෂ ජෙනරාල් ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් මේජර් ජෙනරාල් කේජීඑන් රසික කුමාර එන්ඩීසී පීඑස්සී ඉකුත් දෙසැම්බර් 07 වන දින ඉංජිනේරු සේවා වෘත්තීය පාසල - ගලයාය සහ 15(සේවා) ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ සංචාරයක නිරතවිය. එහිදී හමුදා සම්ප්‍රදායානුකූලව පිළිගත් කර්නල් සේනාවිධායක වෙත එම පුහුණු පාසලේ සේනාවිධායක සහ අණදෙන නිලධාරී විසින් ඔවුන්ගේ වගකීම්, කාර්යභාරය සහ මෑතකාලීන ලබාඇති ජයග්‍රහණ පිළිබඳ දැනුම්වත් කළහ. සිය සංචාරයේදී තේපැන් සංග්‍රහයකට ද එක් වූ කර්නල් සේනාවිධායක එහි හටපිරිස් අමතා ඔවුන්ගේ කැපවීම සහ වෘත්තියභාවය ඇගයීමට ද ලක්කළේය. මෙම අවස්ථාවට ඉංජිනේරු සේවා අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අධ්‍යක්‍ෂ බ්‍රිගේඩියර් වයිකේඑස් රංගික පීඑස්සී පීටීඑස්සී, ඉංජිනේරු සේවා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එන්ඩබ්ලිව්පීඑස්එම් පෙරේරා ඇතුළු එම ඒකක නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

## මියන්මාර් සරණාගතයින් වෙනුවෙන් යුද්ධ හමුදාවෙන් පරිත්‍යාග

මියන්මාර් සරණාගතයින් 102 ක් රැගත් බෝට්ටුවක් මුලතිව් - වෙල්ලමුල්ලිවෛක්කාල් වෙරළට ළඟාවීමට උත්සහ කිරීමේදී යුද්ධ හමුදාව සහ නාවික හමුදාව මගින් ආරක්‍ෂක හේතූන් මත අනාරක්‍ෂිත ගොඩබෑසීමක් හේතුවෙන් අත්හිටුවන ලදි. පසුව එම යාත්‍රාව වැඩිදුර පරීක්‍ෂණ සඳහා ත්‍රිකුණාමලය වරාය වෙත යොමුකිරීමට කටයුතු කෙරිණ. තවද, එම බෝට්ටුව මුහුදෙහි නැංගුරම් ලා සිටින කාලය තුළ 59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීආර්එන් හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ උපදෙස් පරිදි 6 ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළුවේ හටපිරිස් විසින් දින කිහිපයක් ආහාර නොමැතිව සිටි එම සරණාගතයින් වෙත මානුෂීය ආධාර වශයෙන් ආහාරපාන සහ අනෙකුත් සනීපාරක්‍ෂක අවශ්‍යතාවයන් ලබාදීමට කටයුතු කරනු ලැබූහ.



## "නායකත්වයට මනෝවිද්‍යාත්මක ප්‍රවේශයක්"

හකාස අණසක මූලස්ථානය (නැගෙනහිර) ආඥාපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්එම්එස්එන් විජේකෝන් එන්ඩීසී ඒඒවීම් ගේ අදහසකට අනුව "නායකත්වයට මනෝවිද්‍යාත්මක ප්‍රවේශයක්" මැයෙන් එක්දින පුහුණු වැඩමුළුවක් ඉකුත් දෙසැම්බර් 23 වන දින ගිරිතලේ පිහිටි යුද්ධ හමුදා පොලිස් සේවා බලකා පුහුණු පාසලේදී පැවැත්විණ. යුද්ධ හමුදා රෙදිපිළි ගබඩාව - වේයන්ගොඩ සේනාවිධායක ලුතිනන් කර්නල් පීජීඑම්ජී ද සිල්වා ඒවීම් විසින් මෙහෙයවූ මෙම දේශනය සඳහා හකාස අණසක මූලස්ථානය (නැගෙනහිර) ආඥාපති ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් විශාල පිරිසක් සහභාගී වූහ.





සේවා වනිතා
සේවා

# විරුවන්ට අත හිත - දරුවන්ට පතපොත





ඒ ඒ ආරක්ෂක සේනා මූලස්ථානවල රාජකාරී නියුතු ආර්ථික අපහසුතාවලින් පෙළෙන තෝරාගත් යුද්ධ හමුදා සාමාජිකයින් හා සිවිල් සේවක මහත්ම මහත්මීන් වෙනුවෙන් වියළි සලාක මලු බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් මස 11, 24 සහ 26 යන දිනවල යුද්ධ හමුදා මූලස්ථාන සේවා වනිතා ඒකක කාර්යාලයේ දී පැවැත්විණ. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ උපදෙස් හා අධීක්ෂණය යටතේ මේ සඳහා යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයේ 100 දෙනෙක්, නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානයේ 200 දෙනෙක් හා බටහිර ආරක්ෂක සේනා මූලස්ථානයේ 200 දෙනෙක් සුදුසුකම් ලැබූහ. තවද, ජනාධිපති කාර්යාලය විසින් සිදුකරන ලද ඉල්ලීමකට අනුව මාවනැල්ල ප්‍රදේශයේ පිහිටි පෙරපාසලක් වෙත පාසල් උපකරණ කට්ටල 30 ක් පරිත්‍යාග කිරීම ද සේවා වනිතා කාර්යාලයේ දී සිදුකෙරිණ. එසේම, මාවනැල්ල ප්‍රදේශයේ දුෂ්කර පෙරපාසලක් වන SWANS හි අඩුආදායම්ලාභී පවුල්වල දරු දැරියන් වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල 30 ක් පිරිනැමීම ද සිදුකෙරුණු අතර, ඊට අදාළ පරිත්‍යාග ජනාධිපති ලේකම් කාර්යාලයේ ත්‍රිවිධ හමුදා ආරක්ෂක කටයුතු සම්බන්ධීකරණ සහකාර අධ්‍යක්ෂක වෙත සංකේතාත්මකව භාරදෙනු ලැබීය.



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩසටහන් හරහා  යුද්ධ හමුදා සාමාජිකයින්ට මෙන්ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා යම්කිසි ආර්ථික සහනයක් සලසාදීම අරමුණ විය.

# මුල්ලේරියාව ජාතික මානසික විද්‍යාතනයට සත්කාරයක්



මුල්ලේරියාව ජාතික මානසික විද්‍යාතන අතරමැදි නිවස්නයේ වාට්ටු අංක 05 හි නේවාසිකව ප්‍රතිකාර ලබන කාන්තාවන් හට දිවා ආහාරය ලබාදීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් මස 28 වන දින එම රෝහල් පරිශ්‍රයේදී පැවැත්විණ. මෙම පරිත්‍යාග වැඩසටහන සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ සෙසුනිලයින් මෙන්ම වාට්ටු භාර හෙද නිලධාරිනී ඇතුළු රෝහල් කාර්ය මණ්ඩලයේ අයවලුන් සහභාගී වූහ. එහිදී, රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ගනු ලබන කාන්තාවන් වෙනුවෙන් සංගීතමය රසාස්වාදය 2(සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදා කැලිප්සෝ කණ්ඩායම විසින් ලබාදුන් අතර, එම අවස්ථාවේදී නේවාසික කාන්තාවෝ නර්තනයන් ද ඉදිරිපත් කළහ. ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා මෙන්ම රෝහල් කාර්ය මණ්ඩලය වෙත අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ඇතුළත් තෑගි පාර්සල් ද එහිදී ප්‍රදානය කෙරිණ.

# ගර්භිණී මව්වරුන්ට සත්කාරයක්





ශ්‍රී ලංකා සන්නද්ධ සේවා වෛද්‍ය විද්‍යාර්ථයින්ගේ සංගමය මගින් සංවිධානය කළ ගර්භණී මව්වරුන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් මස 29 වන දින යුද්ධ හමුදා රෝහල් ප්‍රධාන ශ්‍රවණාගාරයේ දී පැවැත්විණ. ගර්භිණී මව්වරුන් 120 දෙනෙක් සහභාගී වූ එම වැඩසටහනට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය ජානකී ලියනගේ මහත්මිය ප්‍රධානත්වය දැරුවාය. මේ සඳහා වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි කල්‍යාණි විජේරත්න මහත්මිය හා උප සභාපතිනි වෛද්‍ය නාමලී තිලකරත්න මහත්මිය ද සහභාගී වූහ. එම ගර්භණී මව්වරු සඳහා වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාව විසින් අත්‍යවශ්‍ය භාණ්ඩ හා Nature Secret ආයතනයෙන් තෑගි පාර්සල් ද ප්‍රදානය කරන ලදි. එහිදී, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙතින් ඔවුනට ප්‍රනීත දිවා ආහාරයක් ලබාදීමට ද කටයුතු කෙරිණ.

# "තලිතා කුම්" ශාන්තා ආනා කන්‍යාරාමයේ රෝගීන්ට සත්කාර රැසක්






පිටකෝට්ටේ පිහිටි ශාන්ත ආනා කන්‍යාරාමයේ පිළිකා රෝගීන් සඳහා වූ "තලිතා කුම්" නිවහනෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන්ගේ සුවදුක් විමසා බැලීම සහ පොදු අවශ්‍යතා සොයා බැලීම සඳහා එහි සංචාරය කිරීමට විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා සාමාජිකාවෝ කටයුතු කළහ. සභාපතිනි දමයන්ති බණ්ඩාරනායක මහත්මියගේ සහ යුද්ධ හමුදා විධායක ජෙනරාල් මෙන්ම විජයබාහු පාබල රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් නලින් බණ්ඩාරනායක යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් සිදුකළ එම සංචාරය විජයබාහු පාබල රෙජිමේන්තු කතෝලික සභාව, 18 සහ 23 විජයබාහු පාබල රෙජිමේන්තු ඒකකයන්හි අණදෙන නිලධාරින්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ සංවිධානය කෙරිණ. එහිදී නේවාසිකව ප්‍රතිකාර ලබන පිළිකා රෝගීන් 13 දෙනකු හා කාර්ය මණ්ඩලයේ 10 දෙනකු සඳහා ඖෂධ, මාස දෙකකට අවැසි වියළි ආහාර ද්‍රව්‍ය, සනීපාරක්ෂක පවිත්‍රතා ද්‍රව්‍ය සහ පුද්ගලික පරිහරණය සඳහා ඇඳුම් කට්ටල ද පරිත්‍යාග කෙරුණු අතර, ක්‍රියා විරහිතව දිරාපත් වී තිබූ ත්‍රීරෝද රථයක් නවීකරණය කරදීම මෙන්ම රුපියල් 130,000.00 ක මූල්‍ය පරිත්‍යාගයක් සිදුකිරීම ද විශේෂත්වයකි.

# සේවා වනිතා සත්කාර



ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි දර්ශණී යහම්පත් මහත්මියගේ අදහසක් මත එම සේවා වනිතා ශාඛාවට අයත් ව්‍යාපෘතීන්හි රාජකාරී කරනු ලබන සෙසුනිලයින් 52 දෙනකු හට ඔවුන්ගේ සේවය ඇගයීමක් වශයෙන් වියළි සලාක ප්‍රදානය කිරීමේ උත්සවයක් එහි සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් දෙසැම්බර් 05 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා දේශන ශාලාවේදී පැවැත්විණ. පාබල හමුදාවට අයත් රණවිරුවන් වෙනුවෙන් සිදුකරනු ලබන සුභසාධන කටයුතුවල තවත් පියවරක් ලෙස එම කටයුත්ත සිදුවිය. මෙම අවස්ථාවට සේවා වනිතා සාමාජිකාවෝ සහ රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක ප්‍රමුඛ නිලධාරීන් සහ කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් රැසක් ද සහභාගී වූහ.





ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකා සෙසුනිලයින් සහ සිවිල් සේවක මහත්වරුන්ගේ පාසල් යන දරු දැරියන් 147 දෙනකු සඳහා අත්‍යවශ්‍ය පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් 15 වන දින 1 යුද්ධ හමුදා සේවා බලකායේදී පැවැත්විණ. එම ඒකකය මඟින් සංවිධානය කළ මෙම උත්සවයට එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි චන්දි රාජපක්ෂ මහත්මිය සහ යුද්ධ හමුදා යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් හා සේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඒකේ රාජපක්ෂ ආර්එස්පී ප්‍රධානත්වය දැරූහ.






යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නිලන්ති වනසිංහ මහත්මියගේ මඟපෙන්වීම මත 2024 නොවැම්බර් මස 22 දින මුල්ලේරියාව ජාතික මානසික සෞඛ්‍ය ආයතනයේ වාට්ටු අංක 06 හිදී පරිත්‍යාග වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබිය. එහිදී, එම රෝහලේ නේවාසික රෝගීන් වෙනුවෙන් ත්‍යාග පාර්සල් බෙදාදුන් අතර රෝගීන් 32 දෙනකු වෙනුවෙන් පෝෂ්‍යදායී දිවා භෝජන සංග්‍රහයක් ද පිරිනැමිණි. මෙම අවස්ථාවට යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.

# සේවා වනිතා සත්කාර





සන්නද්ධ බුද්ධි බලකායට අයත් මියගිය හා ආබාධිත රණවිරුවන් හට සෙත්පතා අංක 2/3, තල්ගස්ගොඩ පාර, පොල්වත්ත, අම්බලන්ගොඩ යන ලිපිනයෙහි පිහිටි වරුසවිතාන වැඩිහිටි නිවාසය වෙත දහවල් දානය පිරිනැමීමට එම සේවා වනිතා ඒකකය මගින් කටයුතු කරන ලදි. එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ උපදෙස් මත මේජර් පීසීඑල් ද සිල්වා නිලධාරිනිය ඊට අනුග්‍රාහකත්වය දැක්වූවාය.





විශේෂ බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි අනෝජා පීරිස් මහත්මියගේ අධීක්ෂණය යටතේ එම බලකා සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ ඉකුත් දෙසැම්බර් මස 11 වන දින කුරුණෑගල, පාන්ගොල්ල අභිමංසල - 3 සුවතා නිකේතනයේ සංචාරයක නිරත වූහ. මෙම සංචාරයේ දී එහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන් වෙත ත්‍යාග බෙදාදීමට ද කටයුතු කරනු ලැබීය. මෙම සංචාරය සඳහා වන්නි ආරක්ෂක සේනා ආඥාපති සහ විශේෂ බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී, විශේෂ බලකා සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ, නිලධාරීන් සහ සෙසුනිලයන් පිරිසක් ද සහභාගී වූහ.





ගැමුණු හේවා බලකා රණවිරුවන්ගේ සහ එම රෙජිමේන්තුවට යටතේ කටයුතු කරන සිවිල් සේවක මහතුන්ගේ ආර්ථික තත්ත්වය ඉහළ නංවාලීම වස් ඔවුන් වෙනුවෙන් ද්‍රව්‍යමය ආධාර පරිත්‍යාගයක් සිදුකිරීමට එම සේවා වනිතා ශාඛාව මැදිහත් විය. එහි සභාපතිනි දිල්රුක්ෂි විමලරත්න මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් දෙසැම්බර් මස 07 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවති මෙම පරිත්‍යාග වැඩසටහන යටතේ රුපියල් 200,000.00 පමණ වටිනාකමකින් යුතු වියළි ආහාර පිරිනැමිණ.

# සේවා වනිතා සත්කාර

15(සේවි) ඉංජිනේරු සේවා රෙජිමේන්තුවට අයත් සාමාජිකයින්ගේ දරු දැරියන් වෙත පාසල් බෑග් ප්‍රදානය කිරීමේ අධ්‍යාපනික සත්කාරයක් ඉකුත් දෙසැම්බර් මස 07 වන දින එම ඒකක මූලස්ථානයේදී පැවැත්විණ. 75 වන ඉංජිනේරු සේවා බලකා සංවත්සරයට සමගාමීව සිදුකළ මෙම කටයුත්තට එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි අනුපමා රත්නායක මහත්මිය ප්‍රධානත්වය දැරුවාය.

තවද, මෙම අවස්ථාව සඳහා විශේෂ ආරාධනයෙන් එම රෙජිමේන්තු සේවා වනිතා ජ්‍යෙෂ්ඨ සාමාජිකාවක් වන ජේපී ටෙක්ලා මහත්මිය ද සහභාගී වූවාය. එහිදී ළමුන් 294 දෙනකු වෙනුවෙන් පාසල් බෑග් ප්‍රදානය කෙරිණ. 15(සේවි) ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් එස්බීටීපී ද සිල්වා ගේ උපදෙස් මත එම ඒකක නිලධාරීන් සහ සෙසුනිලයින් මෙම අවස්ථාව සංවිධානය කළහ.







ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස අප්සරා පීරිස් මහත්මිය ඉකුත් දෙසැම්බර් මස 10 වන දින පනාගොඩ පිහිටි එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී සුබ මොහොතින් රාජකාරි භාරගත්තාය.



ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂි හා පශු සම්පත් බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස උදාරි ගමගේ මහත්මිය ඉකුත් දෙසැම්බර් මස 10 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී වැඩ භාරගත්තාය.







වෛද්‍ය බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රාජකාරි කරන සිවිල් සේවක කාර්ය මණ්ඩලය සඳහා වියළි ආහාර ද්‍රව්‍ය ලබාදීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් මස 20 වන දින බෝරහැර පිහිටි එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාව වෙතින් උදා වූ නත්තල වෙනුවෙන් සංවිධානය කළ මෙම උත්සවයේදී සිවිල් සේවක කාර්ය මණ්ඩලයේ 19 දෙනකු හට වියළි ආහාර ද්‍රව්‍ය ලබාදීමට කටයුතු කරනු ලැබිය. මෙම වැඩසටහන සඳහා වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි කල්‍යාණි විජේරත්න මහත්මිය හා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු නිලධාරීන් රැසක් හා වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ රැසක් ද සහභාගී වූහ.

# සේවා වනිතා සත්කාර





ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකා සේවා වනිතා ශාඛාව මගින් සිදුකරනු ලබන රණවිරු සුබසාධන වැඩසටහන් සඳහා ආධාර පිණිස සංවිධානය කරන ලද ජනප්‍රිය වේදිකා නාට්‍යයක් වන "කෝ කුක්කෝ" වේදිකා නාට්‍යය ඉකුත් නොවැම්බර් මස 30 වන දින ඇඹිලිපිටිය ඩීජ් රාජපක්ෂ කේන්ද්‍රයේ දී (බුද්ධි මණ්ඩපයේ) වේදිකා ගතකෙරිණ. ජනප්‍රිය රංගන ශිල්පීන් වන මිහිරි සිරිතිලක, කුමාර තිරිමාදුර, සරත් කොතලාවල, හේමන්ත ඊරියගම යන මහත්වරුන්ගේ රංගන දායකත්වයෙන් දර්ශන වාර තුනක් ඔස්සේ වේදිකාගත කෙරුණු එම නාට්‍යය සඳහා ප්‍රදේශයේ ජනතාවගේ සහයෝගය නොමඳව හිමිවිය. කාර්ය බහුල ජීවන රටාවෙන් මුදවා ප්‍රේක්ෂකයන් හෝරා කිහිපයකට සංවේදී කරවමින් ඔවුනට මේ හරහා ලැබුණේ නොමඳ මානසික අස්වැසිල්ලකි.

මෙම අවස්ථාව සඳහා අධ්‍යක්ෂක ජෙනරාල් මූල්‍ය කළමනාකරණ හා ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඒඑම්කේජීබීඑස්කේ අබේසිංහ සහ යුද්ධ හමුදා පොදු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි තුෂාරි අබේසිංහ මහත්මිය ඇතුළු එහි සාමාජිකාවෝ රැසක් ද සහභාගී වූහ. මෙම වේදිකා නාට්‍යය කුට්ටිගල වෘත්තීය පාසලේ සේනාවිධායක කර්නල් යූජ් කළුආරච්චි යූඑස්පී ඇතුළු කාර්ය මණ්ඩලයේ පූර්ණ අධීක්ෂණය යටතේ පැවැත්විණ.





කමාන්ඩෝ රෙජිමේන්තු සේවා වනිතා සභාපතිනි සමින්දි වික්‍රමරත්න මහත්මිය ඇතුළු එහි සාමාජිකාවෝ ඉකුත් නොවැම්බර් මස 21 වන දින රාගම රණවිරු සෙවණෙහි සංචාරයක නිරත වූහ. එහිදී, ඔවුහු ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ මෙන්ම ඔවුන්ගේ භාරකරුවන්ගේ සුවපහසුව තකා අත්‍යවශ්‍ය භාණ්ඩ ඇසුරුම් පරිත්‍යාග කරමින් සියලුම රණවිරුවන් සමග සුහද කතාබහක නිරත වන්නට ද අමතක නොකළහ. කමාන්ඩෝ රෙජිමේන්තු අධිපති, රාගම රණවිරු සෙවණ සේනාවිධායක ඇතුළු පිරිසක් ද මෙම අවස්ථාව සඳහා සහභාගී වූහ.



ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා සේවා වනිතා ශාඛාවේ 27 වන සභාපතිනිය ලෙස වින්ද්‍යා ප්‍රේමරත්න මහත්මිය ඉකුත් දෙසැම්බර් 12 වැනි දින බොරැල්ල පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී වැඩ භාරගත්තාය. මෙම අවස්ථාවට එම සේවා වනිතා සාමාජිකාවෝ රැසක් ද එක්වූහ.

# සොඳුරු සිතුවිලි

## පොතපතෙහි නැති පාඩමක්...

අවරගිර හිරු කුමරු රජයන කොළොම්පුරයේ එක් සැඳෑවක
අතුරු සිදුරක් නැතිව වාහන තදබදය පිරි පුළුල් පාරක
රෝද සතරක මැදට සිරවී සිටින තර නැවතී විඩාවක
දුටුමි ඒ රුව මදක් ඈතින් සිනාවක් සමගින් මළානික

බයිසිකලයේ පැඩල දෙක මත කෙසග පා යුග වැරෙන් තබමින්
පාට හේදුණු කමිස කොනකින් හැඟුණු දා බිඳු සෙමෙන් පිසිමින්
හොඳුවසිල්ලෙන් තළා හඬවන සුවපහසු රිය දෙකක අතරින්
පෙරට ඇදුනා හෙමි හෙමින් ඔහු ගීතයක් උරුවමින් ගයමින්

හොපින් උරයක් තුළ බහාලූ පාන් ගෙඩියක් අතේ රන්දා
යමින් පසුකර නේක රථ ඔහු සැඳෑ සුළඟේ පහස වින්දා
ඔහුගෙ මදහස ඉදිරියේ මා පරාජිත බව දැණුනු හින්දා
බලා සිටියෙමි ඉරිසියාවෙන් ඔහු වෙතම නෙතු දැහැන රන්දා

ඉවසුමක් නැති කෝපයෙන් බැණ වදින මහතුන් වෙත දයාවෙන්
පොතපතෙහි නැති පාඩමක් ඔහු කියා දුන්නා මඳ සිනාවෙන්
සැඳෑ අඳුරේ සැඟව ඒ රුව මැකී යනතෙක් දෑස මානෙන්
ගිලී සිටියෙමි සිතුම් සයුරේ බොහෝ වෙලාවක් කල්පනාවෙන්

කෙනි/87599
කාන්තා කෙඩෙට් නිලධාරිණි වෙනුරි අඹේපිටිය
(4 ශ්‍රීලයුවෙබ)
වෛද්‍ය පීඨය - ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය



## සිත නැති මම නැති සමුගැනීම...

සසර ගමනක අවසානය
සනිටුහන් කළා
විශ්වයේ තතු දැන
කිසිත් නැති බැව් පසක් කළා
නිවනක් දැක සසර බැඳීම්
ක්‍ෂණයක් තුළ බිඳ හෙළා
සදාතනික බුදුන් දැක
ජීවිතය එකළු කළා
යළි ගමනක් නැති සසරේ
ගෙන ආ ජීවිතය අඩක් නිමකළා
ජීවය නිම කරන්නට නොහැක
අතරමඟ ඒ බැව් පසක් කළා
යළි ගමනේ යෙදෙන්නට
සිදුවුණි ජීවිතය පවතින තුරා
දෙමාපිය දරු මුණුපුරු සුරතල්
දුක් සෝ සුසුම් සතුට බලා
වෙහෙසක් නොදැණුනි
නතරව සිටි නිසා
අකාලික මුත් කාලය
කෙමෙන් ගෙවී අවසන ලංකළා
රැකියාවෙන් සමාජයෙන්
ඈත්වීමට කාලය එළඹිලා
සමුදෙන්නට සිදුවිය
අවසන් හෝරාවට යා යුතුම නිසා
හිතවතුන් ඥාතීන් නොදැන
දුකට පත්වෙලා
කියමි මග නිවනට එදෙස නොබලා
දුකින් මිදෙන මග දැන
දුකට පත්වෙන හේතුව බිඳ
තමා තුලින් ලෝක සත්‍යය දැක
බඹයක් පමණ රූප කාය බිඳ
සසරේ මහ මෙරක් වූ සිතින් මිදී
තම තම නැණ පමණින් සත්‍ය දැක
නිවනින් සැනසෙන්න
එයමැයි සදාතනික සතුට
නිවනින් සැනසුන අය
පසක් කළා

අජන්ත හේරත්
අයවැය හා මුපඅම, යුහමු



## තාත්තා...

දරුපෙම වෙනුවෙන්
රතු රුධිරය කිරි නොවුනාට
දිවා රෑ නිදිවරා
අනේක දුක් පීඩා විඳිමින්
මවගේ පිටුපසින් සිට නිරතුරු
දරුවන්ගේ දියුණුව පතා නිහඬව
අවසන් හුස්ම
වා තලයට මුසු කරන
අද්විතීය මිනිසා

කෝප්‍රල් දිසානායක බීඑම්කේකේ
8 විපාරෙ

## සීන් - ලාස්ට් සීන් - නෝ සීන්...

යැව්ව මැසේජය බලල නෑ තාම
ඒකයි හරි දෙක නැත්තෙ තාම නිල් පාට
දැක්කම වෙලා එක නිල් පාට
එන සතුට මාරයි ඒ සීන් එක

හැමදාම වැටි කලත් එක පෙළට
එක හරිය දෙක වෙලා නිල් වෙලා නැත්නම් හනික
දන්නව නෑ කියල ඔන්ලයින් ඒ වෝල් එක
ඒකයි බැලුවෙ අන්තිම ලාස්ට් සීන් එක

වොයිස් කෝල් දුන්නත් සැරින් සැරේ
*Text Chat* වලින් මදි පාඩුව කවර් කලේ
දැක්කම ලාස්ට් සීන් එක ස්ක්‍රීන් එකේ
දැනෙනව හොයන වග ඔන්ලයින් එකේ

ලඟදී ඉඳන් නෑ ඒ ලාස්ට් සීන්
දැන් ඉන්නෙ නිතරම ඔෆ් සීන්
හයිඩ් කරල ඒ ලාස්ට් සීන්
දානව දැන් එයා බොරු සීන්

ලුතිනන් කර්නල් සඳුන් සෙනවිරත්න






# ස්වයං අභිවෘද්ධිය ළඟාකර ගැනීමේ මඟ

**නිවැරදි ආදර්ශය ලබා දීම, පෙළඹවීම, යොමුකිරීම සහ වෙනස් වීමේ අවශ්‍යතාවය මෙන්ම විනය ගරුක භාවය, පරිසරය සංරක්ෂණය පිළිබඳව අවධානය යොමු කිරීම මඟින් සමාජයක චර්යාමය වෙනස්කම් ඇති කිරීමට ප්‍රවේශයක් ලබා ගත හැකිය. ඒ අනුව රටක් සංවර්ධනය කරා ගමන් කිරීමේ දී සමස්ත පුරවැසියන් සියලු භේද පසෙකලා එක් ජාතියක් ලෙස නැගී සිටිය යුතුය. එහිදී රටේ පාලනය හොබවන කණ්ඩායම, රාජ්‍ය සේවකයා සහ පුරවැසියා එක්ව සාමූහිකව කටයුතු කළ යුතුය. එවැනි ජාතික මෙහෙවරක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය වත්මන් රජය විසින් හඳුනා ගෙන ඇති අතර, "ක්ලීන් ශ්‍රී ලංකා (Clean Sri Lanka)" නමින් එකී වැඩසටහන 2025.01.01 දින සිට ආරම්භ කරන ලදි. එම වැඩසටහනට සමගාමීව පොහොසත් රටක් නිර්මාණය කිරීම වෙනුවෙන් රුකුලක් වීමේ අපේක්ෂාවෙන් මෙම ලිපි මාලාව ඉදිරිපත් කෙරේ.**



▪ දිල්මි ශානුකී

දෛනික පුද්ගල ජීවිතය සමඟ ගනුදෙනු කිරීමේ දී ප්‍රීතිය සහ තෘප්තිය හඹායෑම මෙන්ම එය නොකඩවා පවත්වාගෙන යාම ඉතාමත් අසීරු කටයුත්තකි. නමුත් "තම ජීවිතයේ ප්‍රීතිය සහ තෘප්තිය රැඳී පවතින්නේ තමාගේම තෝරා ගැනීම්වල ප්‍රතිඵලයක් ලෙසින් බව අවබෝධ කරගත් පුද්ගලයෝ" සතුටින් ජීවත් වීමේ කලාව හොඳින්ම උකහා ගෙන ඵලදායී අයුරින් දිවිගෙවති.

ලෝකයේ අනෙකුත් රටවල් සමඟ සන්සන්දනය කිරීමේදී "අභිප්‍රේරණ මූලධර්මයන්" ප්‍රමුඛ කොටගෙන දීර්ඝතම කාලයක් සෞඛ්‍ය සම්පන්නව ජීවත්වීමේ කලාව එලෙසින්ම අවබෝධ කරගත් ජාතිකයින් ලෙස "ජපන් ජාතිකයින්" ප්‍රමුඛස්ථානය හිමිකරගෙන ඇත. විශේෂයෙන්ම Erin Niimi Longhurst විසින් රචිත "Little Book of Japanese Contentments" නමැති ග්‍රන්ථය ජපන් ජාතිකයින් විසින් එදිනෙදා සතුට වගා කිරීම සඳහා මුළුමහත් ලෝකයටම කරනු ලබන උණුසුම් ආරාධනාවක් ලෙසින් හැඳින්වීම එම කෘතියට කරනු ලබන ප්‍රබල ඇගයීමකි.

මෙම සුන්දර පොත ප්‍රීතිමත් වඩාත් සමබර ජීවිතයක් ගත කිරීමට කැමති පුද්ගලයින් ප්‍රබෝධමත් කිරීම වෙනුවෙන් ඉතා පහසුවෙන් අනුගමනය කළ හැකි අභ්‍යාස සපයමින් යහ පැවැත්මට ආවේණික සාම්ප්‍රදායික ජපන් දර්ශන වෙත හිත යොමු කරවයි. එමෙන්ම මානසික සෞඛ්‍යය බිඳී ඇති මොහොතක මෙම පොත පරිශීලනයෙන් ජීවිතයට ආලෝකය හා නැවුම් බලාපොරොත්තු ගොන්නක් ගෙන එන අතරම මානසික සමබරතාවය පවත්වාගෙන යාමට මංපෙත් විවර කරන විශිෂ්ට ගණයේ නිර්මාණයකි. වඩාත් සිහිබුද්ධියෙන් යුතුව තෘප්තිමත් ජීවිතයකට මඟ පෙන්වන ජපන් සංස්කෘතිය මූලික කොටගෙන නිර්මිත මෙම ග්‍රන්ථය පාඨකයාගේ ධනාත්මක ජීවන ගමනට ආරම්භයක් ගෙන එන බව නොරහසකි. එමෙන්ම ඕනෑම කෙනෙකුගේ ජීවිතයේ සෑම අංශයකටම පාහේ සම්බන්ධ වන පරිදි කාලානුරූපී දර්ශන ගවේෂණය කළ හැකිය.

මෙම ග්‍රන්ථය පහත පරිදි පරිච්ඡේද කිහිපයක් යටතේ නිවැරදි අනුපිළිවෙළකට පෙළගස්වා ඇත.

1 හදවත සහ මනස (Kokoro - heart and mind)

2 ශරීර කොටස් (Karada – body parts)

3 අරමුණ සමග ජීවත් වීම (Ikigai - Living with purpose)

4 අසම්පූර්ණත්වයේ සහ අනිත්‍යතාවයේ සුන්දරත්වය (Wabi-Sabi - The beauty of imperfection and impermanence)

5 නැවුම් මල් සැකසීමේ කලාව (Ikebana - The art of flower arranging)

ජපන් සංස්කෘතියෙහි ප්‍රධානතම කේන්ද්‍රීය මූලධර්මය වන්නේ විනයගරුක භාවයි. ළදරු අවධියේ සිට මහලුවිය දක්වා පවුල් පසුබිම, තනතුරු තානාන්තර ආදිය පිළිබඳව කිසිඳු තැකීමකින් තොරව සියලුම දෙනා හට එකලෙස ආචාර සම්පන්න වීම බෙහෙවින්ම අගය කරන කාරණයකි. පාසල් වියෙහි පසුවන කුඩා ළමුන් තනිවම බස් රථයෙන් හෝ එරට ප්‍රධානතම පොදු ප්‍රවාහන සේවය වන දුම්රියෙන් තම පාසල වෙත ගමන් කරන අතර, අදාළ ප්‍රවාහන අවශ්‍යතාවය සලසා ගත් පසු රියදුරු සිටින දෙසට මදක් පහත් වී ඔහු ලබා දුන් සේවය වෙනුවෙන් ස්තුතිය පුද කිරීමෙන් අනතුරුව ස්වයං විනයකින් යුක්තව පෝලිම්ගතව පාර මාරු වී පාසල වෙත ගමන් කරන ආකාරය ඉතාමත් විශිෂ්ට දසුනකි. එපමණක් ද නොව පොදු ප්‍රවාහන සේවයට අයත් බස් රථ, දුම්රිය හා ගුවන් යානා වල විනාඩියක ප්‍රමාදයක් සිදු වුවහොත් අදාල සේවාවන්හි නියුතු කාර්ය මණ්ඩලය සිය ප්‍රමාද දෝෂය හමුවේ තම ජනතාවගෙන් නැවත නැවතත් සමාව අයැද සිටීමට පෙළඹෙනුයේ දෙවරක් නොසිතාය. එමෙන්ම තමා ඉදිරියේ මුහුණට මුහුණ මුණ ගැසෙන පුද්ගලයාට ලෙන්ගතු සිනහවකින් සංග්‍රහ කර ආචාරශීලීව කතා කිරීම ජපන් ජාතිකයන්ටම ආවේණික වූ හැසිරීම් රටාවකි. ඒ අනුව, සෑම පොදු ස්ථානයකම පාහේ මෙවැනි ආචාරශීලී හැසිරීම් රටා ජපන් ජාතිකයන් තුළින් දිස්වීම පුදුම විය යුතු කරුණක් නම් නොවේ.

පාසල් වියෙහි පසුවන ළමුන් තම පන්ති කාමරය පමණක් නොව පාසල් වැසිකිළි පද්ධතිය ද පිරිසිදු කිරීම ආරම්භ කරන්නේ වයස අවුරුදු 03 සිටය. නිවස, පාසල මෙන්ම තමා ජීවත් වන අවට වටපිටාව නිරන්තරයෙන් පිරිසිදුව, පිළිවෙළට සහ අලංකාරවත්ව පවත්වාගෙන යාමට පුරුදු පුහුණු වී ඇත්තේ තම මවු කුස තුළදීම බැව් පසක් වන්නේ කුඩා කල සිටම ඔවුන්ගෙන් දිස්වන මෙම හැසිරීම් රටා නිසාවෙනි.

ජපන් සංස්කෘතික ජීවිතය තුළ කුඩා සරල දේවල් අගය කිරීම සඳහා ඉහළ වටිනාකමක් ලබා දෙයි. තේ කෝප්පයක් රස විඳීමේ සිට හිරු බැස යෑම නැරඹීම හෝ වැස්සට සවන් දීම, සරල ආහාරයක් සැකසීම, ස්වභාව සෞන්දර්යාත්මක ඡායාරූපකරණය, නැවුම් මල් සැකසීම, අවමවාදී ජීවන රටාව, නිරන්තරයෙන් සිහි කල්පනාවෙන් යුක්ත වීම, අසම්පූර්ණත්වය හා එකිනෙකා අතර තිබෙන වෙනස්කම් තුළ අලංකාරය රස විඳීම මෙන්ම කෘතඥතාවය වර්ධනය කිරීම ජපන් සංස්කෘතික හර පද්ධතියේ ප්‍රබල මූලිකාංගයන් වේ.

මෙකී මූලිකාංගයන්ගෙන් පරිපූර්ණ වූ මෙම ග්‍රන්ථය හරහා ඔබේ ජීවන රටාව පොහොසත් කිරීමට අවැසි රුකුලක් ලබා දීම වෙනුවෙන් මගපෙන්වීම මෙම ලිපි මාලාවේ අරමුණයි.

- ඉතිරි කොටස ලබන කලාපයේ -

# "යුධ සාහිත්‍යය" පිළිබඳ දේශනයක්





යුද්ධ හමුදා ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂක ගේ උපදෙස් හා මගපෙන්වීම මත රණවිරු අභිප්‍රේරණය වෙනුවෙන් සංවිධානය කෙරෙන දේශන මාලාවේ තවත් අදියරක් ඉකුත් දෙසැම්බර් මස 18 වන දින බටහිර ආරක්ෂක සේනා මූලස්ථානයේදී පැවැත්විණ. එම මූලස්ථාන බ්‍රිගේඩියර් (ප්‍රමානි) බ්‍රිගේඩියර් ජීඑස්කේ පෙරේරා ආර්එස්පී එන්ඩීසී ගේ ප්‍රධානත්වයෙන් පැවති එම දේශනයට නිලධාරීන් 09 දෙනෙක් සහ සෙසුනිලයින් 151 ක් සහභාගී වූහ. එහිදී, යුදබිමේ මතක හා අත්දැකීම් ඇසුරින් රණවිරුවන්ගේ ඉවසීම, දරාගැනීම, කැපකිරීම් මෙන්ම 30 වසරක යුද්ධයේ සන්ධිස්ථාන පිළිබඳ නව පරපුර දැනුම්වත් කිරීමත් යුද අත්දැකීම් සහිතවූවන් තුළ අභිමානයක් ඇතිකරලීමත් පිණිස "යුද සාහිත්‍යය තුළින් රණවිරු අභිප්‍රේරණය" මැයෙන් වූ එම දේශනය ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවයේ නියුතු ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ විසින් සිදුකරන ලදි.



පසුගිය කලාපයේ
ඉතිරිය...

# තම ජීවිතය බේරූ සෙබළා සොයා පැමිණි කොටි කාන්තාව






■ ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ

2009 වසරේ යුද්ධය නිමවන මොහොත වනවිට කෝප්‍රල් ප්‍රේමසිරි සිටියේ කුකුලේ ගඟ සාමසාධක මෙහෙයුම් පුහුණු පාඨමාලාවක් හදාරමිනි. ඒ වනවිට හයිටි රාජ්‍යයේ සාමසාධක රාජකාරී සඳහා පිටත්ව යාමට නියමිත හමුදා භට පිරිසට සිය ඒකකයෙන් තෝරා ගෙන සිටි දසදෙනා අතරට ඔහු ද ඇතුළත්ව තිබිණ. එවක සටන් බිම තුළ කෝප්‍රල් ප්‍රේමසිරි දැක්වූ සුවිශේෂී දායකත්වය හා පුද්ගලික හැකියාව එම අවස්ථාව ඔහුට ලැබීමට හේතු වී තිබිණ. අනතුරුව 2009 වසරේ මැද භාගයේ පටන් සය මසක් හයිටියේ හමුදා සේවයේ නිරතව සිටි කෝප්‍රල් ප්‍රේමසිරි යළි මව්රට බලා පැමිණියේ 2010 වසර මුලය. එලෙස පැමිණි පසු යළි ඔහු සේවය සඳහා එක් වන්නේ ද 15 (සෙව) විජයබාහු පාබල රෙජිමේන්තුවටමය. ඒ වනවිට එය ස්ථාපිතව තිබුණේ පූනරීන් ප්‍රදේශයේය. එහිදී, ඔහු සැලකිය යුතු කාලයක් තම ඒකකය තුළ විවිධ රාජකාරී සිදුකළ අතර 2012 වසර වනවිට හෙතෙම කටයුතු කරන ලද්දේ පූනරීන් තුඩුවෙහි වැලි බෙදාහැරීමේ මධ්‍යස්ථානයක වූ මාර්ග බාධකයකය. කෝප්‍රල් ප්‍රේමසිරි ඒ වනවිට එම මාර්ග බාධකය භාරව කටයුතු කළ අතර, එහි සිට යාපනය ප්‍රදේශයේ ඉදිකිරීම් කටයුතු සඳහා වැලි රැගෙන යාමේ කටයුතු පරීක්ෂා කිරීම හා ඊට ආරක්ෂාව සැපයීම ඔහුගේ වගකීම වී තිබිණ.

එම කටයුතු සඳහා එහි ප්‍රාදේශීය සභාව හරහා සිවිල් පුද්ගලයකු ද සේවයේ යොදවා සිටි අතර, එම ස්ථානයේ සිට වැලි රැගෙන යන ලොරි හා ටිපර් රථ සඳහා අවසරපත් නිකුත් කිරීම ඔහුගේ කාර්යය වී තිබිණ. යුද සමයේ LTTE සංවිධානය යටතේ සේවය කළ අයකු වූ එම පුද්ගලයා පසුව යුද්ධ හමුදාවට භාර වී පුනරුත්ථාපනය වූ අයෙකි. දිගින් දිගටම එම මාර්ග බාධකයේ කටයුතු කළ බැවින් එහි සේවයේ නියුතු හමුදා සාමාජිකයින් සමඟද හේ බෙහෙවින් කුළුපග විය. විශේෂයෙන්ම එහි සිටි කෝප්‍රල් ප්‍රේමසිරි සමඟ ඔහු බොහෝ සමීපව කටයුතු කළ අතර, ප්‍රේමසිරිට තරමක් දුරට ද්‍රවිඩ භාෂාව කතා කළ හැකිවීම එම සබඳතා වැඩි දියුණු වීමට බලපෑවේය. එහිදී, දිනක් දෙදෙනා අතර වූ කතාබහක දී මතුවූයේ නොසිතූ මාතෘකාවකි. එනම්, පෙර යුද සමයේ එම ප්‍රදේශයේ වූ ගැටුමකදී කොටි කාන්තාවක් ජීවග්‍රහයෙන් අල්ලාගත් අයුරුත් සුබ්‍රමනියම් නම් වූ ඇයගේ ජීවිතය බේරා ගැනීමට තමා කටයුතු කළ අයුරුත් එහිදී කෝප්‍රල් ප්‍රේමසිරි එම පුද්ගලයා හමුවේ විස්තර කරන්නට වූයේය. එලෙස දිගින් දිගටම ඇදුණු එම කතාවේදී එහි සිටි සිවිල් පුද්ගලයා කෝප්‍රල් ප්‍රේමසිරිගෙන් එම සිදුවීමට අදාළ තොරතුරු වඩවඩාත් හාරා අවුස්සන්නට වූයේ මහත් උනන්දුවකිනි. ඔහු ද කලක් LTTE සංවිධානයේ සිටි අයකු බැවින් එම කාලවකවානුවට අදාළව ඔහු තුළ ද මතක පැවතීම ඊට හේතුවයි.

මෙලෙස එම මාර්ග බාධකයේ දී සිදුවූ එම කතාබහෙන් අනතුරුව තවත් දින දෙක තුනක් ගෙවී යන්නට විය. එක්තරා දිනෙක උදෑසනක යතුරු පැදියක නැගී මාර්ග බාධකය වෙත කාන්තාවක් හා පුරුෂයකු පැමිණෙන අයුරු කෝප්‍රල් ප්‍රේමසිරි දුරතියාම දුටුවේය. වැලි රැගෙන යාමේ කටයුතු වලට සම්බන්ධව එහි නිරතුරු යනෙන පුද්ගලයින් සෑම අයකුම පාහේ ප්‍රේමසිරිට හොඳින් හුරුපුරුදුය. නමුත් පෙරදී දැක නොතිබූ යුවලක් එලෙස පැමිණීම ඔහුගේ කුතුහලයට හේතුවිය. එහි පැමිණි කාන්තාව අත කිසියම් පාර්සලයක් ද වූ අතර කොණ්ඩය කොටට කපා අලංකාර ලෙස මොට්ටුවක් ද තබා තිබූ ඇය පෙනුමෙන් පැහැපත් බොහෝ ප්‍රියමනාප ගති ඇත්තියකි. යතුරු පැදියෙන් බැස එහි පැමිණි පිරිමි පුද්ගලයාට වඩා පියවර කිහිපයක් ඉදිරියෙන් ගමන්කළ ඇයගේ දෑස් එකඑල්ලේම යොමුවී තිබුණේ ප්‍රේමසිරි



විශ්‍රාමික කෝප්‍රල් ප්‍රේමසිරි (වර්තමානයේ)

දෙසය. පෙර කිසි දිනෙක මාර්ග බාධකය හරහා තමා වෙත එලෙස කාන්තාවක් පැමිණ නොතිබූ බැවින් ප්‍රේමසිරි නොසන්සුන් වූයේය.

තමා දෙස බලාසිටින එම යුවතිය පිළිබඳ ප්‍රේමසිරි තුළ අදහසක් නොවූනද මදක් ගතවත්ම කිසියම් හුරුපුරුදු බවක් ඒ මුහුණ තුළින් ඔහුට දැනිණ. ඒ සමගම එම මාර්ග බාධකයේ සේවය කරන හිටපු එල්ටීටීඊ සාමාජිකයා කටහඬ අවදි කළේය." එදා මහත්තය මට අර කතාවක් කිව්වේ යුද්දෙ කාලෙ සුබ්‍රමනියම් කියල කොටි කෙල්ලෙක්ගෙ ජීවිතේ බේරුව කියල. මේ ඉන්නෙ එයා. මෙයාගෙ පදිංචිය අපේ ගමට කිට්ටුයි. මහත්තයට නොකිව්වට ඒ කතාව දැනගත්ත දවසෙම මම මේ ළමයව හොයාගෙන ගිහින් මහත්තය ගැන කිව්වා. එයාගෙ සහෝදරයත් එක්ක මේ ඇවිත් ඉන්නෙ මහත්තය කියපු සුබ්‍රමනියම්."

තවදුරටත් ඔහුගෙන් ඒ පිළිබඳව දැනගන්නට තරම් දෙයක් ප්‍රේමසිරිට ඉතුරුව නොතිබිණ. හෙතෙම තුෂ්නිම්භූතව එම කාන්තාව දෙසම බලාසිටින්නට වූයේ මෙවැනි ආශ්චර්යමත් හමුවීමක් සිදුවීමේ විශ්මය අත්විඳිමිනි. නමුත්, සුබ්‍රමනියම්ගේ හැසිරීම වෙනස්ම වූවකි. සතුට මෙන්ම දුක්බර බවකින්ද යුතුව සිටි ඈ තුළ කියාගත නොහැකි හැඟීම් සමුදායක් තෙරපෙමින් තිබුණාය. ප්‍රේමසිරි සමීපයට වන් ඈ සෘජුව ඔහු දෙස බලමින් විමසන්නට වූ එකම කාරණය වූයේ ඇයි "මාව මැරුවෙ නැත්තේ" යනුවෙනි. එදවස තම සංවිධානයෙන් එලෙස පණ තිබී හමුවූ හමුදා සාමාජිකයින් කිසිවකු බේරා නොයැවූ අතර, ඔවුන්ගේ නිසැක ඉරණම මරණය පමණක්ම විය. නමුත්, මරා දැමීමට එතරම් ඉඩක් පවතිද්දීත් පෙරදිනක තමාව එලෙස බේරාහැරීම පිළිබඳව ඕ යළි යළිත් ප්‍රේමරත්නගෙන් ප්‍රශ්න කරන්නට වූවාය. සිංහල හමුදා භටයකු සතුවූ එම මානුෂීය ගුණයේ තරම පිළිබඳ ඇට දරාගත නොහැකි තරම්ය. එනිසාමදෝ ඇගේ දෙනෙතින් කඳුළු කැට ගලා හැලෙන්නට වූයේ ඇටත් නොදැනීමය. "අපිට නිකරුණේ මිනිස්සු මරන්න ඕන කමක් නෑ සුබ්‍රමනියම්..." ප්‍රේමරත්න ඇය දෙස  බලාගෙනම පැවසුවේය. මෙලෙස දෙදෙනාගේ දෑස් එකිනෙක ගැටී තත්පර ගනනාවක් ගත වූයේය. තමා මුලංකාවිල් රෝහල අසල



කෝප්‍රල් ප්‍රේමසිරි ක්‍රියාන්විතයේදී

පදිංචිව ඇති බවත්, ඉඩක් ලද විටක එහි පැමිණෙන්නැයි සුබුමනියම් එහිදී ජේමසිරි වෙත දන්වා සිටියාය. ඒ සමගම ඇය විසින් රැගෙන එන ලද පාර්සලයක් ඔහු අත තැබීය. ජේමසිරි කිසිත් නොදොඩා එය තම දෑතට මිරිකාගත් අතර, තිගැස්මක් හා ආශ්වාදයක් ඔහු සිත වෙලාගනිමින් තිබිණ. අනතුරුව ජේමසිරිගෙන් සමුගත් ඇය තම සහෝදරයා ද සමග යතුරු පැදියෙන් පිටත් වූයේ එහි සේවයේ සිටි දුවිඩ හිතවතාට ද අනේක වාරයක් ස්තුති කරමිනි. අනතුරුව මාර්ග බාධකය පසුකර යන ඔවුන් දෙදෙනා තිතක් වී නොපෙනී යන අයුරු ජේමසිරි බලා සිටින්නට වූයේ දිගු සුසුමක් ද සමගිනි. එතෙක් වේලා තම අතෙහි මිරිකී තිබූ පාර්සලය දෙස බැලූ ඔහු එය හෙමි හෙමින් දිග හැර බැලුවේය. කේක් ගෙඩියක් සහ විශාල ප්‍රමාණයේ ෆැන්ටා බෝතලයක් එහි විය.

මෙලෙස කාලය ගත වන්නට විය. සුබුමනියම් පිළිබඳ ජේමසිරි සතුවූ මතක නිරතුරු ඔහුගේ හදවත ප්‍රබෝධමත් කිරීමට සමත් වූයේය. සුබුමනියම් අවසානයට කළ ඉල්ලීම පරිදි ඇයගේ නිවස සොයා යාමට තරම් හිතක් ජේමසිරි තුළ පැවතිය ද එවක පැවති රාජකාරි ස්වභාවය හා තම වෘත්තීය තුළ වූ සීමා හමුවේ ඔහු ඒ සඳහා ඉදිරිපත් නොවීය. නිල ඇඳුම් දරා සිටින කෙනකු ලෙස එලෙස දුවිඩ කාන්තාවක් සොයා නිවසකට යාමෙන් තමාට අනවශ්‍ය ගැටලුවක් මතුවේ යැයි ඔහු කල්පනා කළේය. ඒ අනුව තවත් කලක් යද්දී එකී සිදුවීම පිළිබඳ වූ සියලු මතක ද ඔහුගේ සිතින් බැහැර වූයේ ඔහුටමත් නොදැනීමය.

චිත්‍රපට කතාවක බඳු වුවද මෙම සත්‍ය සිදුවීමට මේ වනවිට වසර 11 ක් ගෙවී අවසන්ය. එකී දස වස තුළ මෙහි සඳහන් පුද්ගලයින්ගේ ජීවිත හා බැඳුනු වෙනස්කම් රැසකි. මෙහි කතා නායකයා වූ කෝප්‍රල් ජේමසිරි 2018 වසරේ දී යුද හමුදාවෙන් විශ්‍රාම ලැබ මේ වන විට පදිංචිව සිටිනුයේ අම්පාර ප්‍රදේශයේය. එසේම, සෙබළ තිලකරත්නද සැරයන් වරයකු ලෙස අදට ද සක්‍රිය සේවයේ නිරතව හිඳී. නමුත් ඔහුට ගතවූ එකොලොස් වස තුළදීම ජේමසිරිව මුණගැසී නැත. එවකට සටන් ඇවිලුනු අර්සපුරකුලම් ගම්මානය ද, මුලන්කාවිල් , පුනරීන් ආදී ප්‍රදේශ ද වර්තමානයේ භෞතික වශයෙන් බොහෝ වෙනස්කම්වලට භාජනය වී ඇත. යුද්ධයේ නිමාවත් සමඟ ගත වූ වසර 15 තුළ එම ප්‍රදේශවලට සංවර්ධනයේ අරුණළු වැටී ඇතත් එහි ජන ජීවිත නම් සුඛිත මුදිත වී ඇත්දැයි නොදනී.

මෙම කතාව කත වැකුණු දා පටන් මා සුබුමනියම් සොයන්නට වූයේය. මුලන්කාවිල් රෝහල සමීපයේ ද ඈ පිළිබඳ විපරම් කරන්නට නියෝජිතයින් යෙදෙව්වේය. විටෙක සඳහන් වූයේ එවැනි නමක් ඇති යුවතියක සිය පවුලේ සාමාජිකයින් ද සමග මෑතකදී යාපනය මාදගල් ප්‍රදේශයේ පදිංචියට ගොස් ඇති බවකි. තවත් විටෙක දැනගත්තේ එහි පදිංචි සුබුමනියම් සමුදි නම් කාන්තාවක් පිළිබඳය. නමුත්, ඇය රෝහල් සේවිකාවක් ලෙස කටයුතු කරන බවත් කිසිදින LTTE සාමාජිකාවක් ව නොසිටි බවකි. කෙසේ නමුත් අදට ද මා ඈ සොයන උවමනාව අතහැර නැත. මා මෙන්ම  කෝප්‍රල් ජේමසිරි ද සැරයන් තිලකරත්න ද ඇය සෙවීමේ උත්සාහයක නියැලී සිටිනුයේ මාගේ බලවත් ඉල්ලීම නිසාමය. කෙදිනක හෝ ඇය හමුවෙනු ඇතැයි මා තුළ ඇත්තේ තදබල විශ්වාසයකි. මෙම සටහන කියවන කිසිවකු විසින් හෝ ඇය සොයා දෙන්නේ නම් ඒ පිළිබඳ කෝප්‍රල් ජේමසිරිට වඩා වඩාත්ම සතුටු වන්නේ මාය. ඒ මක්නිසාද යත් මෙම කතාව ඇයගේ බසින් ම ලියන්නට මා සැදී පැහැදී සිටින නිසාමය. යුද්ධය හමුවේ මිනිස්කමින් පිරිපුන් මෙවැනි ලතෙක් ගුණැති කතා ඉතිරි වෙද්දී යුද්ධය එතරම් කුරිරු වූයේ කෙසේදැයි අදට ද මා හට ප්‍රහේලිකාවකි.

විමසන විටදී කළ කීදේ නොමැත සරී
වැරදුන තැනක් ඇති අපටත් කොහේ හරී
ආ මග නැවත ගොස් ඇරැඹූ තැනින් හැරී
නිවැරදි කර ගනිමු මාවත නොමැත බැරී

නිමි.




- කලාව යනු සාමාන්‍ය දෙයෙහි අසාමාන්‍යත්වයකුත් අසාමන්‍ය දෙයෙහි සාමාන්‍යත්වයකුත් දැකීමට ඇති ශක්තියයි.
  - ඩිඩාරෝ

- බුද්ධියේ දුක්බර ස්මරණයට වඩා හදවතේ ස්මරණය බලවත්ය.
  - බට්යුෂ්කොව්

- සුන්දරත්වයේ මූලික අවශ්‍යතාව චාම් බවයි.
  - ලියෝ ටෝල්ස්ටෝයි

- ප්‍රේමයේ ගැඹුර දැනෙන්නේ වෙන්වන මොහොතකදීය.
  - ඛලීල් ජිබ්රාන්

- නිර්මාණකරුවාගේ තරුණබව එක් වරකට හෝ එක් කලකට පමණක් සීමා නොවේ.
  - ගර්ටේ

- ප්‍රථම ප්‍රේමයත් වැදූ මාතාවත් කිසිවෙකුට කිසිදිනක අමතක කිරීමට නොහැකිය.
  - මැක්සිම් ගෝර්කි

- නිසි ලෙස නිසි තැන යොදන නැවතීමේ තිතකට පුදුම විස්කම් කිරීමට හැකිය.
  - කොන්ස්ටැන්ටයින් පවුස්තවුස්කි

- ලේඛකයා ජීවිතය හදාරන්නෙක් නොවේ. ඔහු ජීවිතය තුළ ජීවත් වේ.
  - කොන්ස්ටැන්ටයින් පවුස්තවුස්ක

- වෛර කිරීම කරදිය බීමකි. එමඟින් කිසිසේත්ම සහනයක් ඇති නොවන හෙයිනි.
  - කොන්ෆියුසස්



# බැහැර වීම

**- කෙටි කතාව**

"ඔයාට තේරෙන්නෙ නැද්ද චමරි, ආයේ මේ වගේ අවස්ථාවක් කවදාවත් මට ලැබෙන්නේ නෑ කියල. මේ ශිෂ්‍යත්වය ලබාගන්න මං කොච්චරනම් මහන්සි වුණාද?" කොච්චර නිබන්ධන ඉදිරිපත් කළාද? අනික, තමන්ගේ වයිෆ් එක්කත් යන්න පුළුවන් විදිහටනෙ සෙට් වුණේ. ඔයාටයි මටයි ඇමරිකාවට යන්න මේ ජීවිත කලෙටම පුළුවන් ද මේ ශිෂ්‍යත්වය ලැබුණෙ නැත්නම්. මේ ලැබීම මටනම් හරියට හීනයක් වගෙයි"

විකල්පයක් නොමැති බව චමරිට සිතිණ. නිල්ල සොයා යන මේ ගමනේ විජිත තනි නොකළ යුතුයැයි ඇය තීරණය කළාය.

"හරි අපි පොදු තීරණයකට එමු. ඔයා අනිල්ට කතා කරල කියන්න. ඒ ඩොක්ටර්ට එපොයින්මන්ට් එකක් ගන්න කියල. මම එකගයි මේ වැඩේට?" සිතින් සසල වුවද ඒ බවක් නොපෙන්වා චමරි පැවසුවාය.

"මචං විජිත උඹ බය නැතුව හිටපන්. චමරිට වුනත් ප්‍රශ්ණයක් නැතිවේවි. අද ගියා. ඊළඟ දවසෙ වැඩේ කරගෙන එන්න පුළුවන් වෙයි"

අනිල්ගේ මිතුරි වෛද්‍යවරයා සිටියේ මල් පාරේ චාතුමනී නම් වූ පෞද්ගලික රෝහලේය. ඔහු පැමිණෙන තෙක් චමරි හා විජිත ආලින්දයේ අසුන්ගෙන සිටියහ. දොරටුවෙන් ඇතුළු වූයේ වයස අවුරුදු 40 කට ආසන්න යුවලකි. තමාට ආසන්න අසුනේ වාඩිවූ කාන්තාවට චමරි මදහස පෑවාය. ඇයට මඳ සිනා පෑවේ දිගු ගමනකින් පසු වාඩිවීමට ලැබීමෙන් ලද අස්වැසිල්ලක සලකුණක් ද මුවට නගාගෙනය.

චමරි කාන්තාව සමඟ කතා කළාය. ඔවුනුත් පැමිණ සිටියේ තමන් ඉටුකරගැනීමට පැමිණි කාරණය සඳහා ද යන්න දැනගැනීමට චමරිට ඕනෑ විය. තම බිරිඳ හා ආගන්තුක කාන්තාව මිත්‍රශීලී ලෙස කතාබහ කරනු විජිත දුටුවේය. අකමැත්තෙන් වුවද තමාට එකඟ වී බෙරිකරගත් මුහුණින් පැමිණි චමරි, කාන්තාව සමඟ දෙඩමලු වනු දුටු විජිත තුළ සිහින් සතුටක් ඇතිවිය.

> "මේ අංකල් ! මේ හොස්පිටල් එක ඔය වැඩකරන තැනක් නෙවෙයි. ඔයාලට කවුරුහරි වැරදි තොරතුරක් දීල මට පේන්නේ. මෙතන බොහොම වැදගත් අය යන එන තැනක්. සල්ලි ගෙවන්න පුළුවන් වුනාට ඔය වගේ වැඩ කරන්නේ නැහැ"

කාන්තාවන් දෙදෙනා අතර ඇති වූ මෙම සුහදතාවය චමරිගේ කුස තුළට පිවිස ඇති ළදරු කලලයට ද දැනිණ. ආගන්තුක කාන්තාවගේ ළදරු කලලයට ද චමරිගේ කුසෙහි සුහදතාවය සිතිවිලි තරංග මගින් දැනේන්නට විය.

ළදරු කලල අදහස් හුවමාරු කරගැනීමට පටන් ගත්තේ එතැන් සිටිය.

******************

"ආ... යාළුවා කොහේ ඉදලද?" මගේ මව හෙවත් චමරිගේ කුස තුළ සිටි කලලය අනික් කලලය සමඟ කතා කළේය.

"අපි මේ හොරණ පොකුණුවිට ඉදලා ආවේ. දඩදඩාස් ගගා බස් එකේ ඇවිල්ලා මට හරි මහන්සියි යාළුවා"

"අපෝ... මම නං ආවේ සුපර් සැලූන් එකේ. නෝ හෙල්ලුම්, AC එකට මට නාම සීතලයි"

විශ්වවිද්‍යාලයේ නිල නිවාසයෙන් සුපර් සැලූන් කාරයට ගොඩවී කාපට් පාරේ රෝහලට පැමිණි ගමන්මග වෙහෙසකර වූයේම නැත. නමුත්, මගේ අලුත් සගයා බස් දෙකකට මාරුවෙමින් දූවිලි නාමින්, දහදිය දමමින් වෙහෙසකර වූ ගමනකින් මෙහි පැමිණ ඇත.

මෙම ගමන අපි දෙදෙනාගේම ජීවිත අනතුරක හෙළීමට ආ ගමනක් බැව්

අප පසක් කරගෙන සිටිමු. අප පැමිණ සිටියේ කලල මර්ධනය සඳහාය. කලල වර්ධනය සඳහා උපදෙස් හා පෙති ලබාගැනීමට පැමිණ දූවරු මව්වරු අපිට ඇතින් අසුන්ගෙන සිටියහ. මා තුළ සියුම් ඊර්ෂ්‍යාවක් ඇතිවිය. අපගේ දෙමාපියන්ට අප බරක් වූයේ කෙසේදැයි අප අපගෙන්ම විමසා ගතිමු.

"මගේ තාත්තා විශ්වවිද්‍යාල ආචාර්ය වරයෙක්. ඇමරිකාවට යන්න හදනවා ශිෂ්‍යත්වයක් ලැබිලා අවුරුදු හතකට. ඒ රටවල්වල ගියාම ඉතිං තමන්ට තමන් විතරනේ. ඉගෙනගන්න ඕන. ඒ අතරේ පොඩි ජොබ් එකක් කරන්නත් ඕන. අම්මටත් මොකක්ද සුළු ජොබ් එකක් එහෙ විශ්වවිද්‍යාලයෙන් හදල දීලලු. මාවත් අරන් ගියොත් ඒවා කරන්න බැහැනේ. ඒ නිසා මාව හලලා යන්න තමයි ඔය හදන්නේ"

අප පැමිණ සිටියේ කලල මර්ධනය සඳහාය. කලල වර්ධනය සඳහා උපදෙස් හා පෙති ලබාගැනීමට පැමිණ දූවරු මව්වරු අපිට ඇතින් අසුන්ගෙන සිටියහ. මා තුළ සියුම් ඊර්ෂ්‍යාවක් ඇතිවිය. අපගේ දෙමාපියන්ට අප බරක් වූයේ කෙසේදැයි අප අපගෙන්ම විමසා ගතිමු.

"අනේ ඔය කහන්දර නම් මගේ දෙමාපියන්ට නැහැ. ඒ අය හරිම දුප්පත්. තව ළමයි දෙන්නෙක් ඉන්නවා. බාල ළමයා තාම අතදරුවෙක්. අම්මා නම් කියන්නේ මට දුක් දෙන්න බැහැ කියලා. එළියට ආවම තාත්තටත් හරියට රස්සාවක් නැහැ. පොඩි පොඩි බිස්නස් වැඩ. ඔය රෙදි බිස්නස් එහෙමත් කරනවා. පමුණුවෙන් තොගේට රෙදි අරගෙන ගිහින් හොරණ පොළේ විකුණනවා"

"ආ... අන්න අපේ තාත්තා කවුන්ටරේට යනවා. බලමු මොකද වෙන්නේ කියල. හොරණ කලලය කෑ ගැසුවේය"

"මේ අංකල් ! මේ හොස්පිටල් එක ඔය වැඩකරන තැනක් නෙවෙයි. ඔයාලට කවුරුහරි වැරදි තොරතුරක් දීල මට පේන්නේ. මෙතන බොහොම වැදගත් අය යන එන තැනක්. සල්ලි ගෙවන්න පුළුවන් වුනාට ඔය වගේ වැඩ කරන්නේ නැහැ" පිළිගැනීමේ නිලධාරිණියගේ ගෝරනාඩුවට මගේ මිතුරාගේ පියා විසිවී ගියේය.

"නෝනා සල්ලි තියෙනවා"

"මං දැන් කිවුවනේ එකපාරක්. කරුණාකරල දැන් යන්න"

මගේ මිතුරාට ටික කලක් ජීවත්වීමට වරම් ලැබෙවායි මා පතන විටම සුමුදු මුදු හඬකින් මගේ මව ඇමතූ පිළිගැනීමේ නිලධාරිනිය "මිසිස් චමරි කෙන්හේන... ඇතුලට යන්න" යැයි කීවාය.

මිතුරාට අත වනන්නටවත් අවස්ථාව නොදීම මා සිත කාමරයට ඇදගෙන ගියේ ඇස් වටකුරු බෝල හෙදිය විසිනි.

මට කිසි ප්‍රශ්නයක් නැත. පහසුවෙන් මේ කුසය අතහැර යා හැකිය. නමුත්, රෝහලේ තත්ත්වය බාලවීමක් මගේ මිතුරාට අවස්ථාව දීමෙන් ඇතිවේ. ඔවුන්ගේ දුගී බව ඒ මනරම් රෝහල පිළිගත්තේ නැත. නමුත්... මට ප්‍රශ්නයක් නැත. සුපර් සැලුන් කාරය, පියාගේ තානාන්තරය, මුදල් යහමින් තිබීම, මගේ ගමන ඉක්මන් කර ඇත. මම තීරණයක් ගතිමි. එන්නත් කටුතුඩ එන්නට ප්‍රථම මා පිටවිය යුතුයි. ඔවුන්ගේ අධ්‍යාපනයේ උපරිම ඵල නෙලන්නට නම් මා චුත විය යුතුය. වටකුරු බෝල හෙදිය එන්නත් කටුව ගෙන ඒමට පෙර මම වහාම බැහැරවීමි.

*මේජර් කමල් ශ්‍රී මිනතුංග ගේ "දොළොස් පැයේ සොඳුරු මෙහෙයුම" කෙටිකතා එකතුවෙනි.*

*(මෙහි කතා රචකයා ද මීට බොහෝ කලකට පෙර සදහටම අප අතරින් බැහැර වී ඇත. මෙය ඔහුට උපහාරයක් ලෙසිනි)*

# ආපදා ප්‍රතිචාර පුහුණු පාඨමාලාවන් සාර්ථකව අවසන්





උසස් ආපදා ප්‍රතිචාර පුහුණු පාඨමාලා අංක - 13 සහ උසස් ජීවිතාරක්ෂක පාඨමාලා අංක - 06 ඉකුත් දෙසැම්බර් මස 09 දින සිට දෙසැම්බර් මස 26 දින දක්වා ගම්පොල පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා ආපදා ප්‍රතිචාර පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. එහි සමාප්ති අවස්ථාවට එම පුහුණු පාසලේ සේනාවිධායක කර්නල් ආර්එම්එච්පීකේ රත්නායක ප්‍රධාන අමුත්තා ලෙස සහභාගී විය. නිලධාරීන් 10 දෙනෙකු සහ සෙසුනිලයන් 191 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පැවති එම පාඨමාලා අතරින් උසස් ආපදා ප්‍රතිචාර පුහුණු පාඨමාලා අංක - 13 හි ප්‍රථම ස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාවේ කපිතාන් ඩීකේඩීඑස් නිරාජ් විසින්ද උසස් ජීවිතාරක්ෂක පාඨමාලා අංක - 06 හි ප්‍රථම ස්ථානය ගැමුණු හේවා බලකායේ කපිතාන් ආර්කේජීඑස්එන් රණසිංහ විසින් ද දිනාගනු ලැබූහ.



# එලොව පොල් පෙනීම වලක්වා ගමු



පොල්ගස ශ්‍රී ලාංකික සමාජයට ඉතාමත් අත්‍යවශ්‍ය නැතුවම බැරි ගසක් ලෙස සලකන අතර, පාසලේ කුඩා කාලයේ දී පොල්ගස ගැන ඕනෑතරම් රචනා ලියා ඇති සැටිද අප කාටත් මතක ඇතැයි සිතමි. එසේම, ප්‍රයෝජනයක් නොගෙන ඉවත දැමිය හැකි කිසිදු කොටසක් නොමැති වීම නිසා පොල්ගසට "කප්රුක" යන නම ලැබීමට ද හේතු වී ඇත. මේ දිනවල පොල් මිල අහස උසට නැග ඇති බව වෙළඳ පොළට යන කොයි කාටත් දැකගත හැකිය. මේ නිසා හැමෝම පොල් මිල ගැන අප්‍රසාදයෙන් පසුවන අතර, පොල් මිල ගණන්



■ ලුතිනන් කර්නල්
යූආර් ගාල්ලගේ
ආර්එස්පී යූඑස්පී
- ගැහේබ

විමසන අවස්ථාවේදී "එලොව පොල්" පෙනෙන බව කියන්නට පුරුදුව සිටිති.

ඇත්තටම පොල් මිල ඉහල යාමට බලපා ඇති ප්‍රධාන හේතූන් මොනවාද? වෙළඳ පොළ භාණ්ඩයක මිල තීරණය කිරීම සඳහා ඉල්ලුම හා සැපයුම යන සාධකවල හැසිරීම හේතුවන බව අප කොයි කවුරුත් දැන සිටිය ද පොල්

ප්‍රමාණවත් තරමට වෙළඳ පොළට සැපයීම අඩුවීමට ඇති හේතු සඳහා පිළියම් යොදන්නේ නම් මෙම ගැටලුව පහසුවෙන් නිරාකරණය කරගත හැකිය.

පොල් ඉඩම් කට්ටිකර නිවාස සහ වෙනත් කර්මාන්ත ඉදිකිරීම සඳහා යොමුවීමත්, වේගයෙන් පැතිරයන යම් යම් රෝගාබාධ හේතුවෙන් පොල්ගස්වල ඵලදාව අඩුවීමත් හා පසුව එවැනි ගස් කපා හෙළීමත්, වන සතුන්ගෙන් සිදුවන හානි ඉහල යෑමත්, දේශගුණ බලපෑම් වලට ලක්වීමත් සහ ඇතැම් ව්‍යාපාරිකයින්

විසින් අසීමිත ලෙස පොල් ආශ්‍රිත විවිධාංගීකරණ නිෂ්පාදන අපනයනය කිරීමට පෙලඹීමත් ප්‍රධාන වශයෙන් රටතුළ පොල් සැපයීම අඩාල වීමට බලපා ඇත. එහෙත්, මා දකින තවත් ප්‍රධාන හේතුවක් වගේම කෙටි කලකින් යථාතත්වයට පත්කර ගතහැකි පිළියමක් ලෙස දැක්විය හැක්කේ බොහෝ පිරිසක් පොල්ගස්වලට කිසිදු පොහොරක් හෝ නඩත්තු කිරීමක් සිදුනොකර අස්වැන්න පමණක් බලාපොරොත්තුවෙන් සිටීමයි.

මේ සඳහා ආරක්ෂක අංශයේ සාමාජිකයින් වශයෙන් අපට සිදුකළ හැකි කාර්යභාරයක් ද ඇති බව මාගේ පුද්ගලික හැඟීමයි. ශ්‍රී ලංකා ආරක්ෂක අංශයන්හි නිරත නිලධාරීන්, සෙසුනිලයින්ගෙන් අති බහුතරයක් තවම ජීවත්වන්නේ නගරබදව නොව අර්ධ නාගරික හෝ ග්‍රාමීය පරිසරයකයි. අවුම තරමින් එක් නිවසක පොල්ගස් එකක් හෝ වැඩි ප්‍රමාණයක් සිටුවා තිබෙන තත්වයක් අනුමාන කළ හැකියි. තවද, ආරක්ෂක කඳවුරු බොහෝමයක පාහේ පොල්ගස් 4 - 5 හෝ ඊට වඩා වැඩි සංඛ්‍යාවක් සිටුවා තිබෙනු අප බොහෝවිට දැක තිබේ. කණගාටුවට කරුණ නම් අති බහුතරයක් පොල්ග ස් කිසිදු නඩත්තුවක් නොමැතිව අතහැර දමා තිබීමයි. පොල්ගසෙන් අඛණ්ඩව අස්වැන්න ලබාගැනීමට නම් ගසට අවශ්‍යවන පෝෂණීය මූලද්‍රව්‍ය අප විසින් ක්‍රමිකව ලබාදීම සිදුකළ යුතුවේ. පොල් ගසකට පොහොර යෙදිය යුත්තේ ඇයි? පොල් ගසෙන් උරා ගන්නා පෝෂක පොල් ගෙඩි හා පොල් ලෙලි, අතු, හනසු, මටළ සමග ඉඩමෙන් ඉවත්වේ. එසේ පෝෂක ඉවත්වීම නිසා ඉඩමේ පෝෂක හිගවේ. එම නිසා පොල්ගසෙහි ඵලදාව අඩුවිය හැක.

සාමාන්‍යයෙන් පොල්ගසට දිනපතා ජලය ලබාදීම අවශ්‍යවේ. සාමාන්‍යයෙන් දිනකට වතුර ලීටර් 60 ක් පමණ පොල් ගසකට අවශ්‍යවේ. මෙම කරුණ ප්‍රායෝගිකව ඉටුකර ගත නොහැකි නම් පොල්ගස් වෙත ප්‍රයෝජනයෙන් පසු ඉවතලන ජලය ගලාගෙන යන ආකාරයට කානු පද්ධතියක් හෝ සකස් කල යුතුය. ජලය නොයෙදීම හෝ ඉඩෝර කාලයකට පොල්ගස ලක්වුවහොත් එහි බලපෑම ඉදිරි වසර 02 කට පසු එහි ඵලදාවේ අඩුවීමක් ඇතිවන බව සාමාන්‍ය පිළිගැනීමයි. බොහෝදෙනා පෙලඹී ඇත්තේ පොල්ගස මුලට කුණු එකතු කිරීම මගින් පොල්ගසට පෝෂණය ලැබෙන බවයි. එහෙත්, කුමන හේතුවක් නිසාවත් පොල්ගස මුලට කුණු ගොඩ ගැසීම නොකළ යුතු අතර, එසේ කිරීමෙන් ගසට හානිකර වේයන් සහ කුරුමිණියන් වැනි සතුන් වර්ධනය වී ගසට අහිතකර බලපෑම් සිදුවීමට ඉඩතිබේ. එම නිසා පොල්ගසේ මුල කොටස පැහැදිලිව නිරීක්ෂණය වන අයුරින් තැබිය යුතුය. බොහෝ උත්සව අවස්ථාවල දී හෝ වෙනත් අවශ්‍යතාවයන් සඳහා සමහරුන් කිසිදු තැකීමක් නොකොට පොල්ගස්වල අතු කපා දමන අවස්ථා ඇතැම්විට ඔබ දැක තිබෙනවා ඇත. එහෙත්, මෙහි ඇති අවදානම් තත්වය නම් පොල් අතු කැපූ පසු එහි අග කෙළවරින් නික්මෙන ශ්‍රාවයේ ඇති සුවඳක් හේතුවෙන් පොල් ගසට හානි කරන රතු කුරුමිණියා ඒ වෙතට ආකර්ශණය වීමයි. එමනිසා පොල් අතු කැපීම ද ගසට හානිකර බව අප විසින් වටහා ගත යුතුය. පොල් ගසකට මාස 06 කට වරක් හෝ අවුරුද්දකට වරක් පමණක් පොහොර යෙදීමෙන් අපේක්ෂිත අස්වැන්න ලබාගත හැකි බැවින්, අනෙකුත් බෝගවලට මෙන් පොහොර, තෙල් බෙහෙත් යෙදීම සම්බන්ධව කරදරකාරී වීමට අවශ්‍ය නොවේ. සුළු සොයා බැලීමක් දැක්වීම පමණක් ප්‍රමාණවත්ය.





පොල් ගසකට පොහොර යෙදීම දෙයාකාරයකට සිදුකළ හැකිය. එනම් රසායනික පොහොර යෙදීම හා කාබනික පොහොර යෙදීමයි. සාමාන්‍යයෙන් පොල්ගස වටා කවයක හෝ අඩ කවයක ආකාරයට කානුවක් කපා ඒ තුළට පොල්ලෙලි හෝ කොම්පෝස්ට් යෙදීම, ලුණු කිලෝ ග්‍රෑම් 02ක් දැමීම හෝ නිර්දේශිත රසායනික පොහොර කිලෝ ග්‍රෑම් 05ක් පමණ දැමීම හොඳටම ප්‍රමාණවත්ය. සාමාන්‍යයෙන් පොල් ගසක මුල සිට අඩි 02, අඩි 03, අඩි 04 හෝ අඩි 05ක් පමණ දුරින්



ගසෙහි විශාලත්වය, වයස අනුව හා මුල් පැතිරීම සැලකිල්ලට ගෙන ඉහත සඳහන් අඩකව හෝ සම්පූර්ණ කවයක හැඩයට කානු කපා ගැනීමට සැලකිලිමත් විය යුතුය. පොල්ගස වටා කානුව අධික පලලින් යුක්තවීම හා අධික ගැඹුරකින් යුක්තවීම ප්‍රමාණවත් වන අතර, අඩුම තරමින් එය උදැල්ලේ පළල හා ගැඹුර වශයෙන්වත් සකස් කිරීම සුදුසුය. පොල්ගසේ අතුවලට බාධාවී ඇති අනෙකුත් ගස්වල අතු කපා හැර හොඳ හිරු එළියක් ලැබීමට සැලැස්වීම සිදුකළහොත් වාර්ෂිකව පොල් ගෙඩි 50 ක් ලබාදෙන ගසින් පොල් ගෙඩි 150 ක් පමණ ලබාගැනීමට වැඩි කාලයක් ගත නොවන බව ඔබට දකින්නට ලැබෙනු ඇත.

මාස 03 හෝ 06 න් ඵල දරන පොල්ගස් නොමැති අතර, අඩුම තරමින් දෙමුහුන් පොල්ගසක් පිදීමට වසර තුන හමාරක් හෝ හතර හමාරක් පමණ ගත වන අතර, සාමාන්‍ය පොල් පැලයක් ඵල දැරීමට වසර 05 කට වැඩි කාලයක් ගත වන බව අත්දැකීමෙන් දනිමි. පොල් සංවර්ධන මණ්ඩලයේ ශාඛාවකින් දෙමුහුන් වර්ගයේ පොල් පැලයක් ඉතා අඩු මුදලකට මිලට ගෙන සිටුවීමෙන් ඔබට ඉතා නිරෝගීමත් වැඩි අස්වැන්නක් කඩිනමින් ලබාගැනීමට හැකියාවක් ලැබෙනු ඇත. ඔබ ගෙවත්තේ ගසකින් පොල් පැළයක් සාදා ගැනීමට අදහස් කරන්නේ නම් ඉතා හොඳින් පොල් ඵලදාව ඇති, ඉතා සාරවත්ව වැඩී ඇති ලෙඩ රෝගවලින් තොර වයස අවුරුදු 15 - 45ත් අතර ඇති ගසක ගෙඩියක් පැලකර ගැනීමට උනන්දු වන්න. ඔබ තෝරාගත් පොල් ගෙඩිය වතුර බේසමක දැමීම මගින් පොල් ගෙඩිය උඩු අතට හැරී ඇති කොටස මෙම රූපයේ දක්වා ඇති පරිදි පොල් ලෙල්ලේ කොටසක් කපා සිටුවීම මගින් ඉක්මනින් පැළ සාදවා ගැනීමට හැකියාව ලැබේ. බිමවැටී පැළ වී ඇති මව් ශාකය නොහඳුනන පොල්පැළ සිටුවීම මගින් වඩා හොඳ පොල් ඵලදාවක් ලැබීම පිලිබඳව විශ්වාසයක් තැබිය නොහැකිය.

එබැවින් ඔබ කඳවුරේ හා නිවසේ ඇති පොල් ගස හොඳින් නඩත්තු කිරීම හේතුවෙන් ගස වටේම පොල් වලු පිරී තිබීම මගින් පොල් අවශ්‍යතාව සපුරා ගැනීම හා එහි දර්ශනය නැරඹීම ද සිතට ඉතා ඉහළ ප්‍රබෝදයක් ගෙන එනු නොඅනුමානයි. තවද, කඳවුරේ ඇති පොල්ගස් සඳහා සාමාජිකයකු නම් කර එහි නඩත්තුව සඳහා වගකීම් ලබාදීම තුලින් ද පොල්ගස් පිලිබඳ වැඩි අවධානයක් ලබාදීමට හැකිය. අවසාන වශයෙන් විදේශයන්ගෙන් ආනයනය නොකර පොල් අවශ්‍යතාවය රට තුළම සපුරා ගැනීමට අප සැවොම ක්‍රියාකිරීම තුලින් ජාතියක් වශයෙන් නිහතමානි ආඩම්බරයක් ලබාගැනීමට හැකිවනු ඇත.







# ජීවිතය හැඩ කරන වර්ණ



▪ කපිතාන්
එච්පීජේ හවන්ති
1 ශ්‍රීලලකාබ

"අයියෝ හෙට ඔෆිස් එකේ පාටියක්"

"ඇනුවල් ගෙට් ටු ගෙදර් එකේ තීම් කලර් තැඹිලි පාට කලා අනේ"

"මචං ස්මාර්ට් කැෂුවල්ලු ඩ්‍රස් එක"

මෙන්න මේ වගේ අහොරක් නැති ප්‍රශ්න මතුවන, අපි නොහිතන සරල කරුණක් ගැන අද අපි කතා කරමු.

මොනතරම් සාරි, ඇඳුම්, ෂර්ට්, කලිසම්, බෙල්ට්, මේස්, පාවහන්, මාල, කුරු තිබුණත් අවශ්‍යම වෙලාවට ගැලපෙන ඇඳුමක් හොයාගන්න ගියහම එකකට එකක් ගලපාගෙන ඒ සඳහා සූදානම් කර ගැනීම තරම් බැරෑරුම් කාර්යයක් නොමැති බව ගැහැණු පිරිමි භේදයකින් තොරව ඔබ අප අත්විඳ ඇති කරුණකි.

පරිසරය දෙස බලන්න. මලක පැහැය, කුරුල්ලකුගේ පියාපත්හි වර්ණ ගැලපීම, සෘතුවෙන් සෘතුවට කොළ හලමින් වැඩෙන ගසක පාට ගැන ඔබ සිතා තිබෙනවාද? දිවා රාත්‍රී දෙකටම ගැලපෙන පරිදි සතුන්ට අනුරූපීව විලෝපිකයන්ගේ ගොදුරු නොවන ආකාරයට ස්වභාවදහම වර්ණයන් සමග කරනා මේ ගණුදෙනුව පිළිබඳ ඔබට සිතී තිබෙනවාද?

Colour Theory වර්ණ න්‍යාය අපේ ජීවිතයට නැතුවම බැරි දෙයක්. අපි නොහිතා හෝ හිතා අපි හැමෝම මේ වර්ණ න්‍යාය ප්‍රායෝගිකව භාවිතා කරනවා. ඔබ ඉපදෙන්නට පෙර සිටම ඔබගේ දෙමව්පියන් විසින් සුරතල් දරු සිඟන්තා දියණියක් හෝ පුතණුවකුවෙක් ද යන්න බලා රෝස හෝ නිල් පැහැයෙන් ඔහු හෝ ඇය පිළිගැනුමට ලක ලැහැස්ති වන දා සිට මරණයට අන්දන සුදු ඇඳුම දක්වාම මේ වර්ණ සංයෝජන න්‍යාය භාවිතා කරනවා.

කොතරම් මිල අධික ඇඳුමක් උනත් එහි වටිනාකම මැනවින් පෙනෙන්න නම්, ඔබගේ සමෙහි වර්ණය ඇඳුමෙහි

සහ පළඳනාවන්හි වර්ණය සහ කොණ්ඩා මෝස්තරය යනාදිය ගැළපීම වඩා වැදගත් වනු ඇත. නමුත්, අද අපි ඇඳුම්වල වර්ණය ගලපා ගැනීම ගැන පමණක් අවධානය යොමු කරමු.

වර්ණ ගැළපීම පිළිබඳ අවබෝධයක් ලබාගන්න (Colour Wheel) වර්ණ චක්‍රය භාවිතා කරන්න පුළුවන්. උදාහරණයක් විදියට තැඹිලි පාට ටී ෂර්ට් එකකට ලා දම්පාට කලිසමක් කොහෙත්ම ගැළපෙන්නේ නෑ. වර්ණ චක්‍රයේ යාබද වර්ණ හොඳින් ගැළපෙන අතර, විරුද්ධ වර්ණ නිවැරදිව භාවිතා කිරීමෙන් නිවැරදි සංයෝජකයක් ලබාගැනීමට හැකිය. තවත් අවධානය යොමුකළ යුතු කරුණක් වන්නේ වර්ණ චක්‍රය අනුව වර්ණ ගැලපුව ද ලා සහ තද පාට අතර වෙනසක් පෙන්වන්න උත්සාහ කිරීම මගින් දකින්නන්ගේ ඇස්වලට සුව පහසුවක් මෙන්ම අඳින ඔබටද මනා පෞරුෂත්වයකින් කැපී පෙනීමෙන් එමගින් ඇතිකරනු ඇත.

උදා-: තද නිල් ඩෙනිම් කලිසමක් සහ ලා කොළ ටී ෂර්ට් එකක්. තද රතු සාරි හැට්ටයකට අළු පැහැති සාරියක්.

ලෝකයේ සිටින වර්ණ නිර්මාණ ශිල්පීන් ප්‍රධාන වශයෙන් භාවිතා කරන සරල වර්ණ සංයෝජන සංකල්පයක් පිළිබඳව අපි දැන් බලමු. එහිදී,

## උදාසීන වර්ණ - *Netural Colours*

මේ වර්ණ කුමන විදියකින්වත් අනෙක් වර්ණ සමග ගැටෙන්නේ නැහැ වගේම අනිත් ඕනෑම වර්ණයක් සමග ගලපන්නත් පුළුවන්. ඒවා තමයි




දුඹුරු වර්ණයේ අනුවර්ණ ලෙස




යන වර්ණ දක්වන්න පුළුවන්. මේ වර්ණත් උදාසීන වර්ණ ගණයේලා සැළකිය හැකිය. කාර්යාලයට, ගමනට බිමනකට වගේ අඳින අවස්ථාවක අපට මුළුමනින්ම උදාසීන වර්ණ පමණක් භාවිතා කරන්නත් පුළුවන් වගේම ඔබ භාවිතා කරන හෑන්ඩ් බෑග්, පාවහන්, බඳ පටි, හිස් වැසුම්, ඔරලෝසු සහ දුරකථන කවර පවා මේ න්‍යාය ආදේශ කරන්න පුළුවන්.



Netural Colours ලෙස හඳුන්වන කළු, සුදු සහ අළු වර්ණ ඔබේ ඇඳුමේ මූලික කොටසක් සඳහා පළඳිනවා නම්, අනෙක් කොටස සඳහා වඩාත් දීප්තිමත් වර්ණයක් තෝරා ගැනීමට ඔබට පුළුවන්.

උදා-: තද නිල් කබායක් සහ කලිසමකට සුදු කමිසයක් සහ රතු ටයි පටියක් ගැලපෙනවා.



ඔබේ සමේ වර්ණය අනුව මෙය තවත් සරල වෙනවා. සමේ වර්ණය අඳුරු නම් ලා පැහැති දීප්තිමත් ලා කහ, ලා තැඹිලි, ලා රෝස වැනි වර්ණයන් ද ඔබ පැහැපත් නම්, ලා පැහැති සහ මදක් තද පැහැති වර්ණ තෝරා ගැනීම සුදුසුයි. කලිසම් තෝරන විට ඉතාමත් වර්ණවත් කලිසම් වෙනුවට Netural Colours හෝ තද නිල්, කාක වැනි අඳුරු පැහැයට හුරු වර්ණ හමක් තෝරාගන්න උත්සාහ කරන්න.



වැදගත්ම කරුණ තමයි මේ උදාසීන වර්ණ වෙනත් ඕනෑම උදාසීන නොවන වර්ණයක් සමග වුවත් ගැලපීමට හැකිවීමයි. උදාහරණයක් ලෙස Casual Event, Office Event, Outdoor Function, Evening Function එකක් වගේ අවස්ථාවකදී ඔබට වර්ණවත් බවකින් යුතුව පිවිසීමට අවශ්‍ය නම් මෙන්න මේ Netural Colours එක්ක ඕනෑම අනික් වර්ණයක් ගලපන්න පුළුවන්.



තවද, තරමක ගැටලුකාරී තෝරා ගැනීමක් වන්නේ උදාසීන නොවන වෙනත් වර්ණ ගලපන්න සිදුවන අවස්ථාවලදීය. මීට හේතුව වනුයේ සමහර වර්ණ එකම ඇඳුමක තිබෙන විට එම වර්ණ එකිනෙකට ගැටීමයි. එහිදී, ඇඳුමේ ලස්සන මතු වෙනවාට වඩා ඇඳුමේ නොගැළපීම මතු වී පෙනෙනු ඇත.

නමුත් ආකර්ශනය, කැපී පෙනීම, ගැළපීම යන කරුණු මත පදනම්ව උත්සව අවස්ථාවන්ට අපි තෝරාගනු ලබන ඇඳුම්වල වර්ණ සංකලනය පහසු කරවන ක්‍රමයක් අද අපි ඉගෙන ගනිමු. ඒ තමයි "වර්ණ රෝදය" සංකල්පය.

මෙම වර්ණ රෝදය භාවිතයෙන් උදාසීන වර්ණ හැරුණු කොට අනෙකුත් වර්ණ නිවැරදිව ගළපා ගැනීමට පුළුවන්.




## යාබද වර්ණ සංකලනය

වැඩි වෙහෙසක් නොමැතිවම නිවැරදි වර්ණ සංකලනය කරමින් ඇඳුම් ගළපා ගැනීමට නම් වර්ණ රෝදයේ එක ළඟ වර්ණ තෝරාගන්න. ඇඳුම් පමණක්ම නොව, ඔබ භාවිතා කරන ආභාරණ, පාවහන්, පසුම්බිය ආදී දේ සඳහා ද මෙය උපයෝගී කරගැනීමට හැකිවනවා මෙන්ම එමගින් ඔබ කෙරේ ආකර්ශනය රඳවා තබා ගැනීමටත්, පෞරුෂය පෙන්නුම් කිරීමටත් හැකිවනු ඇත.



## අනුපූරක වර්ණ සංකලනය

මේ වර්ණ එකිනෙකට මුහුණවෙනවා. ඒ කියන්නේ වර්ණ රෝදයේ එකිනෙකට විරුද්ධව මුහුණලා තිබෙන වර්ණ මේ ගණයේ ලා සැළකිය හැකිය. වර්ණ රෝදයේ එකිනෙකට මුහුණලා තිබෙන වර්ණ තෝරා ගැනීමේ දී ඔබට එම වර්ණ සංකලනයන් ඔබගේ අනෙකුත් ආයිත්තම් සඳහා ද යොදාගැනීම තුළින් වඩාත් කැපීපෙනෙන පෙනුමක් ලබාගත හැකිය.



මම හිතනවා මෙතෙක් කල් ඔබ අප සතුව තිබුණු විශාල නොවුනත් අපගේ ප්‍රතිරූපයට වඩාත් වැදගත් වන ගැටලුවකට සරල විසඳුමක් මෙම ලිපිය තුළින් ලැබෙනු ඇතැයි කියා.

**එහෙනම් හිත හිතා අඳින්නැතුව ගළපලා අඳින්න පුරුදු වෙන්න.**



# අමනාපකම් පරණ වෙන්න දෙන්න එපා

අලුත් ජීවිතයක් ගැන ඔයාලා ඕන තරම් හිතලා ඇති. පරණ විදිහ වෙනස් කරගෙන අපි අලුත් වෙන්න ඕන කියලා හිතවත් අයත් එක්ක කථා වෙලත් ඇති. අඳින පළඳින විදිහ, විලාසිතා, කාමරේ තියෙන පිළිවෙළ පවා වෙනස් කරලා ඇති අලුත් වෙන්න හිතාගෙන. නමුත්, බොහෝ දෙනකුගේ ජීවිතේ නම් තාම පරණ ඇති. ඉතිං අද මේ ලිපිය ඔබට අලුත් වීම පිණිසයි. ජීවිතයක් ලස්සන වෙන්නේ අලුත් වීමෙන්මයි. දවසක් දවසක් ගානේ, මොහොතක් මොහොතක් ගානේ ටික ටික හෝ අලුත් වෙන ජීවිතයක්ම ගොඩනගා ගන්න මහන්සි වෙන්න. එබඳු ජීවිතේ සුන්දරයි. ආරාධනා කරනවා වෙනදා වගේම, අවසානය තෙක්ම මේ අලුත් ලිපියේ රැඳී ඉන්න. අවසානය තෙක් සතුටින් මේ ලිපිය කියවන්න. ඔබේ ජීවිතේ සුන්දර විදිහට අලුත් කරගන්න ඔබට හැකි වේවා!




■ පූජ්‍ය
අංකුඹුරේ අමිතදීප
ස්වාමීන් වහන්සේ


## අමනාපකම් පරණ වෙන්න දෙන්න එපා!

ඔව්! කාමරයක් වුණත් අපි අලුතින් අස් කරද්දී වැඩකට නැති කොළකෑලි, වෙනත් රොඩු ආදිය ඉවත් කරනවා. කුණු කූඩයට දැමිය යුතු දේවල් කුණු කූඩේට දැමීමෙන්ම සෑහෙන කොටසක් පිළිවෙළක් කරගන්න පුළුවන්.

අන්න ඒ විදිහමයි, ඔයාලගේ ජීවිතේ හැඩි කරගෙන තියෙන්නේ එක එක අමනාපකම්වලින් නම්, ඒවත් තියාගෙන කොහොමද ජීවිතේ අලුත් කරගන්නේ. ඒ නිසා අපි ඔබට යෝජනා කරනවා, අමනාපකම් පරණ වෙච් පල් වුණා ඇති. අපි ඒවා ඉවත් කරමු. අලුත් වෙමු.

මට බැන්නා, මට වංචා කළා, මට වපල වුණා, මාව රැවැට්ටුවා, මගේ ජීවිතේ වටිනා කාලයක් අපතේ යැව්වා, මට හින්ට් ගැහුවා ආදී වශයෙන් පරණ වෙච් පල් වෙච් තියෙන අදහස්වලට ඔයාලව තව තවත් වෙහෙසවන්න දෙන්න එපා!

සමාව දීමෙන්, ඉවසීමෙන්, මෛත්‍රිය පැතිරවීමෙන්, ඒ අය කරගත්ත දේවල් ඒ අයටයි කියලා උපේක්ෂාවට පත්වීමෙන් පරණ අමනාපකම් ඔක්කොම ජීවිතෙන් අයින් කරන්න. පළිගැනීම, එකටෙක කිරීම, රිදවීම, රිටන් එකක් දීම, වරදිනකල් බලාගෙන ඉඳීම වගේ හීන ආසාවල් හිතේ තියාගන්න එපා!

මට අමනාපකම් ගැන හිත හිතා අපතේ දාන්න කාලයක් නෑ. මට අලුත් වෙමින්

ගොඩනගා ගත යුතු ජීවිතයක් තියෙනවා. මම ඒ කටයුත්ත කරන්න ඕනි කියලා පරණ අමනාපකම් උපේක්ෂාවෙන් අතහරින්න. හිත සැහැල්ලු කරගන්න. ඔබ පරණ නොවී අලුත් වෙන්න.

## අඩුපාඩු පරණ වෙන්න දෙන්න එපා!

අලුත් ජීවිතේකට ආසා කෙනෙක් පරණ අඩුපාඩු නම් ඉවත් කරගන්නම ඕනි. පරණ අඩුපාඩු එහෙමම තියාගෙන ජීවිතයක් අලුත් කරගන්නෙ කොහොමද? දෙසැම්බර් 31 දිනයේ තිබුණු අඩුපාඩු ටික එහෙමම තියාගෙන නම්, ජනවාරි 01 වෙනිදාත් ඉන්නේ, අලුත් වර්ෂයක් ලැබුවා කිව්වට මොකක්ද එයාගෙ ජීවිතේ වුණ අලුත් වීම.

ඒ නිසා බුද්ධිමත්ව තේරුම් ගන්න. දිනයකට, වෙලාවකට, නැකතකට ඔබේ ජීවිතේ අලුත් කරලා දෙන්න බෑ. ඔබ යම් මොහොතක පරණ වැරදි හදාගන්න ඕනි කියලා හිතට ගන්නවා ද අන්න ඒ මොහොත තමයි ඔබේ ජීවිතේ අලුත් වෙන මොහොත.

අනික් උදවිය ප්‍රාණඝාත, සොරකම්, සල්ලාලකම්, මත්පැන් මත්ද්‍රව්‍ය භාවිතය ආදී නොයෙක් අඩුපාඩු කරමින් ඉඳීවි. ඒක මගේ ප්‍රශ්නයක් නෙවෙයි. මම නම් ඒ වැරදි කරන්නේ නෑ කියලා හිතක් උපද්දවන්න. බොරු, කේලාම්, හිස් වචන, පරුෂ වචන, නින්දා ගැරහිලි අපහාසවලින් සතුටු වෙන පිරිසක් මැද මම නම් වචනේ රැකගෙන ඉන්නවා කියලා හිතක් උපද්දවන්න. ලෝභකම්, මසුරුකම්, ක්‍රෝධ අමනාපකම් හිතේ පුරවාගත් අය ඉන්නවා. නමුත් මම නම් මෛත්‍රී කරුණා මුදිතා උපේක්ෂා ආදී උතුම් හිතුවිලිවලින් හිත පුරවාගන්නවා කියලා හිතක් උපද්දවන්න.

ඔව්! පරණ වෙවී පල් වෙන පිරිසක් මැද්දේ ඔබේ දුර්වලතා, අඩුපාඩු, පව්, අකුසල් අයින් කරගෙන ඔබ පරණ නොවී අලුත් වෙන්න.

## හිතවත්කම් පරණ වෙන්න දෙන්න එපා!


බොහෝ දෙනෙක්ගේ හිතවත්කම් කල් යනකොට පරණ වෙනවා. අන්තිමට ඇති කරගත්ත හිතවත්කම් ජීවිතේට මහා වධයක් වෙලා. මෙකට

"කාමරයක් වුණත් අපි අලුතෙන් අස් කරද්දී වැඩකට නැති කොළකෑලි, වෙනත් රොඩු ආදිය ඉවත් කරනවා. කුණු කූඩයට දැමිය යුතු දේවල් කුණු කූඩෙට දැමීමෙන්ම සෑහෙන කොටසක් පිළිවෙළක් කරගන්න පුළුවන්. අන්න ඒ විදිහමයි, ඔයාලගේ ජීවිතේ හැඩි කරගෙන තියෙන්නේ එක එක අමනාපකම් වලින් නම්, ඒවත් තියාගෙන කොහොමද ජීවිතේ අලුත් කරගන්නේ. ඒ නිසා අපි ඔබට යෝජනා කරනවා. අමනාපකම් පරණ වෙවී පල් වුණා ඇති. අපි ඒවා ඉවත් කරමු. අලුත් වෙමු.

හේතුව නුවණින් තොරව හිතවත්කම් පැවැත්වීම. ඔබ හොඳ හිතවත්කම්, ඉවසිලිවන්ත හිතවත්කම්, අවංක හිතවත්කම්, මිත්‍රශීලී හිතවත්කම්, ඔබව තේරුම්ගත්ත හිතවත්කම් පතන කෙනෙක් නම් ඔබ තාම පරණයි!

අලුත් වෙන්න මේ විදිහට. ඔබේ හිතවත් අයට ඔබ පුළුවන් තරම් හොඳ හිතවතෙක් වෙන්න. ඔබ ගොඩාක් ඉවසීමෙන් හිතවතුන් එක්ක කටයුතු කරන කෙනෙක් වෙන්න. ඔබේ හිතවත් අයට ඔබ අවංක හිතවතෙක් වෙන්න. ඒ අයව පිනට කුසලයට යහපතට ධර්මයට යොමු කරන, ඒ අයව පවෙන් අකුසලයෙන් අයහපතෙන් අධර්මයෙන් බේරාගැනීමට කටයුතු කරන මිත්‍රශීලී හිතවතෙක් වෙන්න. ඔබ හිතවතුන්ව තේරුම් අරගෙන ඒ අයට පහසුවක් වෙන විදිහේ හිතවතෙක් වෙන්න.

කෝටි අටසියයක් වගේ මහා ජනකායක් මේ ලෝකෙ ජීවත් වුණාට අපිට අපේ ජීවිත කාලෙම ඇසුරට ලැබෙන්නේ කොතරම් පොඩි පිරිසක් ද. ඒ පිරිස පවා ඇසුරු කරන්න අපිට ලැබිලා තියෙන්නේ කොයිතරම් පොඩි ජීවිත කාලයක් ද. ඒ නිසා හොඳ නුවණින් යුක්තව හිතවත්කම් පරණ වෙන්න නොදී ඔබ අලුත් වෙන්න.



## ගුණදම් පරණ වෙන්න දෙන්න එපා!

ඔබේ ජීවිතේ තුළ මේ වෙද්දී උපදවාගත් යම් ගුණවත්කම් තිබෙනවා නම් මොනම හේතුවක් නිසාවත් ඒ ගුණදම් දගමයක්වත් වැනසෙන්න දෙන්න එපා! ගුණධර්ම කියන්නේ ඔබේ ජීවිතේ ඔබට තිබෙන වටිනාම දේ කියලා තේරුම් ගන්න. වටිනා දේක වටිනාකම තේරුම් නොගත්තොත් ඒක සැහැල්ලුවට ගන්නවා. අවසානේ ඒ වටිනා දේ වටිනාකම බාල වෙලා යනවා.

අපි කඩේකින් වටිනා දිලිසෙන පිත්තල පහනක් අරගෙන ආවා කියලා හිතන්න. ඒ පහන ගොඩාක් වටිනවා කියන හැඟීම අපේ හිතේ තිබුණේ නැත්නම් ඒක ඔහේ මුල්ලක දානවා. අවධානයක් යොමු කරන්නේ නෑ. පස්සේ ටික දවසක් ගතවෙද්දී අර පහනේ නොයෙක් මැලියම්, ඔක්සයිඩ් ආදිය බැඳිලා අර මුලින් තිබුණ බැබළීම නැති වෙලා යනවා.

ඉතිං ඒ වගේමයි අපි වුණත් අපේ මනුස්සකම්, ගුණවත්කම්, සිල්වත්කම්, යහපත් අදහස් ආදිය ගැන ලොකු වටිනාකමක් දුන්නේ නැත්නම්, අපිටත් නොදැනීම ඒවා දියාරු වෙලා යාවි. ඔහේ පරණ වෙලා යාවි.

කඩේකින් ගෙනාපු වටිනා දිලිසෙන පිත්තල පහනක් කෙනෙක් ගොඩාක් අවධානෙන් නිතර පිරිසිදු කරමින් පවත්වා ගන්න මහන්සි වුණොත් එයාට හැමදාම වටිනා භාණ්ඩයක්ම තියෙනවා. සමහර විට නිතර පිරිසිදු කිරීම නිසා කඩෙන් අරගෙන ආවාටත් වඩා දිලිසෙන ලස්සන පහනක් එයාට ලැබෙනවා.

ඉතිං ඒ විදිහටම තේරුම්ගන්න ඔබේ ගුණදම් ගැනත්. වටිනාකම තේරුම් අරගෙන අවධානයෙන් යුක්තව රැකගත්තොත් ඔබේ ගුණදම් පරණ වෙන්න නොදී ටිකෙන් ටික නමුත් අලුත් කරගන්න පුළුවන් වේවි.

> මට බැණ්නා, මට වංචා කළා, මට චපල වුණා, මාව රැවැට්ටුවා, මගේ ජීවිතේ වටිනා කාලයක් අපතේ යැව්වා, මට හින්ට් ගැහුවා ආදී වශයෙන් පරණ වෙච්ච පල් වෙච්ච තියෙන අදහස්වලට ඔයාලව තව තවත් වෙහෙසවන්න දෙන්න එපා...

## මේ පසුවිපරමට කාලයයි!

නොතිබුණු ගුණදම් උපදවා ගන්නත්, තිබෙන ගුණදම් රැකගෙන දියුණු කරගන්නත්, ගොඩාක් උපකාර වෙනවා පසුවිපරම. පසුවිපරම කියන්නේ කරපු කියපු හිතපු දේවල් පිළිබඳව තමන් තමන් ගැනම අවධානයකින් විපරම් කරලා බැලීම.

මෙක දිනපතා ඔබ කරන්න පටන් ගන්න. සෑම දිනයක්ම අවසන් කරන්න පෙර තමන් දවස ගත කරපු ආකාරය ගැන යම්කිසි නිදහස් විපරමක් කරන්න. ඒක බොහොම විවෘත අවංක විපරමක් වෙන්න ඕන. මං මොන වගේ දේවල් කරමින් ද අද කාලේ ගෙවා දැම්මේ? උදේ සිට මේ දක්වා මොන වගේ දේවල් ද මම කථා කළේ? මට අද දවසේ තිබුණු අදහස්, ආකල්ප, සිතුම් පැතුම් මොනවද? කියලා තමන් ගැන යම්කිසි විපරමක් දිනපතාම කරන්න.

හරියට බාහිර කෙනෙක් ඔබ ගැන අවධානෙකින් ඉඳලා මේ මනුස්සයා මේ මේ විදිහටයි අද දවස ගත කළේ කියලා සිහි කරනවා වගේ ඔබ තමන් ගැනම විපරම් කරන්න.


ඔබට පෙනෙන්ට ගනීවි ඔබේ කුඩා මහත් අඩුපාඩු. ඒ දේවල් ජීවිතෙන් ඉවත් කරන්න හිතට ගන්න. ඔබට පේන්න ගනීවි මේ දක්වා නොතිබුණු අඩුවක් අද දවසේ මගේ ජීවිතේට එකතු වෙලානේ කියලා. ඒක දුටු වහාම ඉවත් කරන්න. ඔබට පෙනේවි ඔබේ මෛත්‍රිය. ඒ ගැන සතුටු වෙන්න. තව තවත් වැඩි දියුණු කරගත් මෛත්‍රියකින් ජීවත් වෙන්න හිතට ගන්න. ඒ වගේ ලස්සන ගුණදම්, ඔබේ සීලය, ඔබේ මනුස්සකම් ඔබට පෙනෙද්දී ඔබ සතුටු වෙන්න. තව තවත් ඒ දේවල් වැඩි දියුණු කරගැනීමට හිතට ගන්න.

ඔබටම සිතේවි මට මේ මේ වගේ ගුණධර්ම හදාගන්නත් තිබ්බා නම් තව හොඳයි කියලා. ඒ උදෙසාත් ඔබ මහන්සි වෙන්න. මතක තියාගන්න ගුණධර්මයක් දියුණු කරගන්න ඕනි කියලා ඔබ හිතන හිතුවිල්ල පවා ඔබට මහා යහපතක්.

ඉතිං ගුණධර්මත් පරණ වෙන්න දෙන්න එපා! ටිකෙන් ටික හෝ පුළුවන් තරම් ඒ ගුණදම් දියුණු කරගෙන ඔබ අලුත් වෙන්න. මේ වටිනා කරුණු සිත් දරාගෙන අපිත් පරණ නොවී අලුත් වෙමු.








# කාන්තා ආරාධිත එක්දින ක්‍රිකට් අනුශූරියෝ

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙතින් පවත්වනු ලබන "2024 ප්‍රධාන කාන්තා ආරාධිත එක්දින ක්‍රිකට් තරගාවලිය" ඉකුත් නොවැම්බර් මස 24 වන දින කොළඹ කෝල්ට්ස් පිටියේ දී පැවැත්විණි.

කණ්ඩායම් 15 ක සහභාගීත්වයෙන් පැවති මෙම තරගාවලියේ, අවසන් පූර්ව තරගයේදී ගුවන් හමුදා කණ්ඩායමට එරෙහිව කඩුලු 6 ක් ලබාගනිමින් යුද්ධ හමුදා කණ්ඩායම අනුශූරතාවය දිනාගනු ලැබීය. අවසන් මහා තරගයේදී, හලාවත එම්සීසී කණ්ඩායම කඩුලු 7 ට ලකුණු 205 ක් රැස්කළ අතර, සියල්ලන් දැවී යුද්ධ හමුදා ක්‍රිකට් කණ්ඩායම ලකුණු 115 ක් රැස්කරගනු ලැබීය. ලකුණු 393 ක් රැස්කර කඩුලු 2ක් දවාගනිමින් තරගාවලියේ වීරයාට හිමි සම්මානය මාණ්ඩලික සැරයන් සිල්වා එන්එන්ඩී විසින් දිනාගන්නා ලදි.

# 'National League Baseball Tournament - 2024' හි ශූරතාවය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට




'National League Baseball Tournament - 2024' තරගාවලිය 2024 දෙසැම්බර් මස 01 දින දියගම බේස්බෝල් පිටියේදී පැවති අතර, එහිදී ශ්‍රී ලංකා නාවික හමුදා කාන්තා කණ්ඩායමට එරෙහිව ලකුණු 18 ට 8 ක් ලෙස තරගාවලියේ ශූරතාවය දිනාගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බේස්බෝල් කණ්ඩායම සමත්විය.

2024 සැප්තැම්බර් මස 01 දින ආරම්භ කරනු ලැබූ මෙම තරගාවලියට යුද්ධ හමුදා බේස්බෝල් කමිටුවේ සභාපති සහ 24 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්ජීසී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ මගපෙන්වීම මත යුද්ධ හමුදා කණ්ඩායම සහභාගී විය. තරගාවලියේ දක්ෂතම ක්‍රීඩිකාව ලෙස ලාන්ස් කෝප්‍රල් ගයානි බණ්ඩාර එම්එම්ජීජී සම්මාන දිනාගත් අතර, දක්ෂතම පිතිකරු ලෙස සැරයන් විමලරත්න කේඑම්එස්එස් ටත් දක්ෂතම පන්දු යවන්නිය ලෙස කෝප්‍රල් සමන්මලී ඩබ්ලිව්එන් ටත් සම්මාන හිමිවූහ.








## යුද හමුදාවට එතෙරින් රන් පදක්කමක්

Russian Weightlifting Federation Far East Cup - 2024 Championship’ ශුරතාවලිය ඉකුත් නොවැම්බර් මස 29 සිට දෙසැම්බර් මස 3 වන දින දක්වා රුසියාවේ යුෂ්නෝ-සකාලින්ස්ක් ප්‍රදේශයේදී පැවැත්විණි. එහිදී, සුවිශේෂී දක්ෂතා එළිදක්වමින් තරගාවලියේ කිලෝග්‍රෑම් 55 බර පන්තියේ රන් පදක්කම දිනාගැනීමට 1 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ සාමාන්‍ය සෙබළ සෝමතිලක එස්ඩබ්ලිව්බීකේආර්එස්ඩී සමත්විය.

## “කෝපායි කුසලාන පාපන්දු තරගාවලිය - 2024”





51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ මගපෙන්වීම මත එම සේනාංකය මගින් සංවිධානය කළ "කෝපායි කුසලාන පාපන්දු තරගාවලිය - 2024" ඉකුත් නොවැම්බර් මස 30 වන දින කෝපායි ප්‍රදේශයේ ස්ථාපිත CIMIC උද්‍යානයේ දී පැවැත්විණ. මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස 51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීජේකේ විමලරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහභාගී විය.

දින හයක් පුරා පැවති මෙම තරගාවලිය සඳහා පාපන්දු කණ්ඩායම් 12 ක් සහ යුද්ධ හමුදා කණ්ඩායම් 10 ක් තරග වැදුණහ. එහිදී, තරගාවලියේ සිවිල් කාණ්ඩයේ ශුරතාවය උරුම්පිරායි පාපන්දු කණ්ඩායම දිනාගත් අතර, අනුශුරතාව පලාලි වින්මින් පාපන්දු කණ්ඩායමට හිමිවිය. එමෙන්ම, හමුදා කාණ්ඩයේ ශුරතාවය දිනාගැනීමට 51 වන පාබල සේනාංක පාපන්දු කණ්ඩායම සමත් වූ අතර, එහි අනුශුරතාව 513 වන පාබල බලසේනා කණ්ඩායම විසින් දිනාගන්නා ලදි.





# ජාතික වෙරළ සෙපැක්ටැක්රෝ තරඟාවලිය - 2024

"2024 ජාතික වෙරළ සෙපැක්ටැක්රෝ තරඟාවලියෙහි" අවසන් මහා තරඟය ඉකුත් දෙසැම්බර් මස 15 වන දින ගල්කිස්ස වෙරළ තීරයේදී පැවැත්විණි. එහි කාන්තා කාණ්ඩයේ කේවල ඉසව්වේ සහ යුගල ඉසව්වේ ශූරතාවයන් දිනාගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා සෙපැක්ටැක්රෝ කාන්තා කණ්ඩායම සමත්විය. 11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති සහ යුද්ධ හමුදා පාපන්දු කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් කේජ්යු කොඩිතුවක්කු ආර්එස්පි යූඑස්පී පීඑස්සී අයිජී ගේ මගපෙන්වීම මත ශ්‍රී ලංකා යුද්ධ හමුදා සෙපැක්ටැක්රෝ කාන්තා කණ්ඩායම මෙම තරඟාවලිය සඳහා සහභාගී විය.





## ආසියාතික ක්ලැසික් සව් එසවීමේ ශූරතාවය - 2024

"ආසියාතික ක්ලැසික් සව් එසවීමේ ශූරතාවය - 2024" දී කිලෝග්‍රෑම් 59 කාණ්ඩයේ ලෝකඩ පදක්කම දිනා ගැනීමට 12 බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ බලලත් නිලධාරී 1 අයිඑස් සුමුදු ප්‍රදීප් සමත් විය. මෙම තරඟාවලිය ඉකුත් දෙසැම්බර් මස 01 වන සිට 10 වන දින දක්වා උස්බෙකිස්තානයේදී පැවති අතර, එහිදී විශිෂ්ඨ දක්ෂතා දක්වමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට කීර්තියක් අත්කර දීමට එම බලලත් නිලධාරී සමත්විය.





## ජාතික කඹ ඇදීමේ ශූරතාවලිය - 2024

ජාතික කඹ ඇදීමේ සංගමය විසින් සංවිධානය කරන ලද 20 වැනි ජාතික කඹ ඇදීමේ ශූරතාවලිය ඉකුත් දෙසැම්බර් මස 07 වන දින බණ්ඩාරවෙල නගර සභා පිටියේදී පැවැත්විණි. මෙහිදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා පිරිමි සහ කාන්තා කණ්ඩායම් විවිධ කාණ්ඩ යටතේ තරඟවදිමින් ශූරතා පහක් දිනා සුවිශේෂී දස්කම් ප්‍රදර්ශනය කළහ.




# ලංකා ප්‍රවීණයන්ගේ *T* 20 ක්‍රිකට් තරඟාවලිය




ලංකා ප්‍රවීණයන්ගේ සංගමය මඟින් සංවිධානය කරන ලද *T* 20 ක්‍රිකට් තරඟාවලිය ඉකුත් දෙසැම්බර් මස 08 වන දින පනාගොඩ, යුද්ධ හමුදා ජනපද ක්‍රිකට් ක්‍රීඩාංගණයේ දී පැවැත්විණි. මේ සඳහා කණ්ඩායම් 8ක් අංශ දෙකක් යටතේ තරග වැදුණු අතර, එහිදී යුද්ධ හමුදා ප්‍රවීණයන්ගේ කණ්ඩායම විසින් වෙළඳ සේවා ප්‍රවීණයන්, වෛද්‍ය ප්‍රවීණයන් සහ මයිටි ස්ටාලියන් යන කණ්ඩායම් පරාජය කරමින් අවසන් මහා තරගයට සුදුසුකම් ලැබූහ. අනතුරුව, අවසන් තරගයේ දී කොළඹ ප්‍රවීණයන්ගේ කණ්ඩායම පන්දු වාර 20 කදී කඩුලු 8 ක් දැවී ලකුණු 127ක් රැස්කළ අතර, යුද්ධ හමුදා ප්‍රවීණයන්ගේ කණ්ඩායම පන්දු වාර 17.3 කදී කඩුලු 5 ක් දැවී ලකුණු 128 ක් රැස්කරමින් ශූරතාවය හිමිකර ගත්තේය. ලකුණු 129 ක් සහ කඩුලු 3 ක් තරගාවලිය තුළ ලබාගනිමින් විශිෂ්ට දස්කම් දැක් වූ බලලත් නිලධාරී 1 එස්එස් ඔබිනමුණි තරගාවලියේ දක්ෂතම ක්‍රීඩකයා වශයෙන් ද, මාණ්ඩලික සැරයන් කළුආරච්චි පීඑන් තරගාවලිය තුළ ලකුණු 102 ක් ලබාගනිමින් දක්ෂතම පිතිකරුවා ලෙස ද පත්වූහ.

## *"The Eagles Cup Challenge Trophy"* තරඟාවලිය



ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සංවිධානය කරනු ලැබූ "*The Eagles Cup Challenge Trophy*" පාපන්දු තරගාවලියේ අවසන් මහා තරගය ඉකුත් දෙසැම්බර් මස 10 වන දින තුරග තරග පිටියේ දී පැවැත්විණි. එහි අවසන් මහා තරගය සඳහා තේරුණු ශ්‍රී ලංකා යුද්ධ හමුදා කණ්ඩායම සහ ශ්‍රී ලංකා නාවික හමුදා කණ්ඩායම අතර, පැවති තියුණු තරගයකින් අනතුරුව යුද්ධ හමුදා කණ්ඩායම 4-2 ක ලෙස තීරණාත්මක ජයග්‍රහණයක් ලබාගනිමින් ශූරතාවය දිනාගැනීමට සමත්විය.

## 53 වන පාබල සේනාංකාධිපති අභියෝගතා කුසලාන තරඟාවලිය




53 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඑච්එම්එස් වික්‍රමරත්න ආර්එස්පී ගේ මගපෙන්වීමෙන් එම සේනාංකය යටතේ සේවයේ නියුතු හටපිරිස්වල සහභාගීත්වයෙන් සංවිධානය කෙරුණු "සේනාංකාධිපති අභියෝගතා කුසලාන වොලිබෝල් තරගාවලිය"ඉකුත් දෙසැම්බර් මස 12 වන දින සිට 15 වන දින දක්වා එම සේනාංක වොලිබෝල් පිටියේදී පැවැත්විණ. මෙම තරගාවලිය සඳහා කණ්ඩායම් 16 ක් සහභාගී වූ අතර එහි අවසන් මහා තරගයට 3 බළඇණිය ගජබා රෙජිමේන්තුව සහ 6 බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදා වොලිබෝල් කණ්ඩායම් තේරීපත්විය. එහිදී තියුණු තරගයකින් අනතුරුව 3 බළඇණිය ගජබා රෙජිමේන්තු කණ්ඩායම ශූරතාවය දිනාගත්තේය.

# හන්තානේ අතරමං වූ පාසල් සිසුන් මුදාගැනේ





හන්තාන කඳුවැටිය තරණය කිරීමේදී අතරමං වූ කොළඹ ප්‍රදේශයේ ප්‍රමුඛ පාසලක ඉගෙනුම ලබන වයස අවුරුදු 16 ත් 17 ත් අතර සිසුන් 10 දෙනකුගෙන් යුත් කණ්ඩායමක් ඉකුත් දෙසැම්බර් මස 04 වන දින 111 වන පාබල බලසේනාවේ හටපිරිස් විසින් බේරාගනු ලැබූහ. සංචාරයක් සඳහා මහනුවර ප්‍රදේශය වෙත පැමිණි මෙම සිසුන් අනාරක්ෂිත ප්‍රදේශයක ගවේෂණයක යෙදී සිටියදී එක් සිසුවකුගේ පාදයක් ආබාධයකට ලක්වීමත් සමග ඔවුන් මෙම අවිනිශ්චිත තත්ත්වයකට පත්ව ඇත. අධික මීදුම හමුවේ ඔවුන් තවදුරටත් අසීරුතාවයට පත්ව ඇති අතර එම කඳුවැටිය තරණය කිරීම දුෂ්කර වූයෙන් ආපසු පැමිණීමට පැහැදිලි මාර්ගයක් නොමැතිව ඔවුන් අතරමං වී ඇත. මේ අතර 111 වන පාබල බලසේනාවේ සහ 2 (සේවා) බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සාමාජිකයන් මෙම සිදුවීම පිළිබඳ දැනුවත් වීමෙන් අනතුරුව වහා මැදිහත්ව එම සිසුන් නිරුපද්‍රිතව මුදවාගැනීමට සමත්වූහ. යුද්ධ හමුදා සාමාජිකයන් රාත්‍රී 8.00 ට පමණ මෙම මෙහෙයුම ආරම්භ කරනු ලැබූ අතර අලුයම වනවිට එම සිසුන් ආරක්ෂිත ස්ථාන වෙත රැගෙන ඒමට කටයුතු කරනු ලැබීය.


# රණවිරුවා









**අධීක්ෂණය**

බ්‍රිගේඩියර්
එම්ජේආර්එස් මැදගොඩ ආර්එස්පී යූඑස්පී
එන්ඩීසී පීඑස්සී අයිජී



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
එම්අයිඑස් චන්ද්‍රකුමාර
යූඑස්පී පීඑස්සී අයිජී



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද විල්ලිසිංහ



**සහය සංස්කාරක**

කපිතාන්
එච්පීජේ හවන්ති

**පරිගණක අකුරු සංයෝජනය,**
**කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 බනි II සේනාරත්න ජීසී - 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඑම් - 11 ඉසේරෙ

**ඔබේ නිර්මාණ, අදහස් හා යෝජනා එවිය යුතු ලිපිනය**

"රණවිරුවා"
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර.

**ඊමේල්**

dtemedia&psyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**යුධ දිගුව**

51445 / 51446 / 51447

**"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට**

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය



# කමාන්ඩෝ පිම්ම පුහුණු කිරීමේ ස්ථානය විවෘත කෙරේ






කුඩා ඔය, කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසලේ පුහුණු පහසුකම් තවදුරටත් වැඩිදියුණු කරමින් නවතමයෙන් ඉදිකරන ලද කමාන්ඩෝ ආත්ම විශ්වාසයේ පිම්ම පුහුණු කිරීමේ ස්ථානය ඉකුත් දෙසැම්බර් මස 19 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සුරතින් විවෘත කෙරිණ. මෙම නවීන පුහුණු කිරීමේ ස්ථානය යුද්ධ හමුදාවේ පුහුණු යටිතල පහසුකම් නවීකරණ ක්‍රියාවලියේ තවත් සාර්ථක අඩියරක් සනිටුහන් කරයි.

53 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති සහ කමාන්ඩෝ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඑච්එම්එස් වික්‍රමරත්න ආර්එස්පී ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ එහි සපැමිණි යුද්ධ හමුදාධිපති වෙත කමාන්ඩෝ භටපිරිස් විසින් හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු මුරයේ ගෞරවාචාරය ද පිරිනැමූහ. කමාන්ඩෝ භටයින් සංකේතාත්මකව මෙරුන් හිස්වැස්ම ලබාගැනීමේ දී ප්‍රධාන අභියෝගයක් වන තම ආත්ම විශ්වාසය මැන බැලීමේ පරීක්ෂණ පිම්ම පැනීම සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් මෙම ස්ථානය ස්ථාපිත කරනු ලැබූ අතර, එමගින් එම පුහුණු පාසලෙහි යටිතල පහසුකම් සැලකිය යුතු ලෙස වැඩිදියුණු විය. මෙමගින් ජල අභ්‍යාස සිදුකරන කමාන්ඩෝ භටයින්ගේ ශාරීරික හා මානසික හැකියාව ශක්තිමත් කිරීම සිදුකරනු ලබයි.

මේජර් ජෙනරාල් පීජීපීඑස් රත්නායක (විශ්‍රාමික) ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී, කමාන්ඩෝ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති ධූරය දැරූ කාලය තුලදී යෝජනා කරන ලද, විශේෂ ව්‍යාපෘති යෝජනා ක්‍රමය යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි. ආත්ම විශ්වාසයේ පිම්ම පුහුණු කිරීමේ ස්ථානයේ ඉදිකිරීම් කටයුතු සාර්ථකව නිමකිරීම සඳහා ඉංජිනේරු සේවා බලකායේ භටපිරිස්හි තාක්ෂණික දැනුම සහ කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසලේ සේනාවිධායක සහ සියලු නිලයන්ගේ දායකත්වය හිමිවූහ. මෙම අවස්ථාවට යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන, ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන් ඇතුළු නිලධාරීන් සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.









# හදිසි ආපදාවලට ක්ෂණික ප්‍රතිචාර

දීර්ඝ යුද්ධයක් නිමකරපු රණවිරුවො රට නිදහස් කළ පමණින් සිය මෙහෙවරෙන් අත්මිදුනෙ නැහැ. එදවස ත්‍රස්තවාදයට එරෙහිව කටයුතු කළ ලෙසින්ම ස්වාභාවික විපත්වලදීත් ජනතාවගේ ආරක්ෂකයින් ලෙස ඔවුන් තවදුරටත් රැකවලෙහි යෙදෙනවා. විපත් පැමිණෙන්නෙ කියල නෙවෙයි. ගංවතුර, නායයෑම්, පස්කඳු කඩාවැටීම, සුළිසුළං, දියේ ගිලීම් වැනි හදිසි ආපදා සුලබ අපේ රටේ, එවන් ස්වාභාවික විපත්වල දී ජනතාවගේ විශ්වසනීයම ගැලවුම්කරුවන් වෙන්නෙ රණවිරුවොයි. ගම්පොල පිහිටි ආපදා ප්‍රතිචාර පුහුණු මධ්‍යස්ථානය එවැනි විරුවන් බිහිකරන එකම තෝතැන්න යි. මෙවර "රණවිරුවා" පසුකවරය වෙන් කෙරෙනුවේ එහි සිදුකෙරෙන ආපදා ප්‍රතිචාර පුහුණුවේ සුවිශේෂී අවස්ථා වෙනුවෙනි. CLEAN SRI LANKA රට ගොඩනගන ජාතික වැඩසටහනට ද මෙමගින් ලැබෙනුයේ මහත් වූ පිටුබලයකි.





ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙ[illegible]ණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.